**5**

**ශ්‍රේණිය**

## මූලික පිරිවෙන්

# ත්‍රිපිටක ධර්මය

## මධ්‍ය හා අවසන් වාර ප්‍රශ්න පත්‍ර

Mid Term and Year End Papers

**මූලික පිරිවෙන් මධ්‍ය හා අවසන් වාර ප්‍රශ්න පත්‍ර i-ii**



මූලික පිරිවෙන් ත්‍රිපිටක ධර්මය මධ්‍ය හා අවසන් වාර ප්‍රශ්න පත්‍ර

# ත්‍රිපිටක ධර්මය

## මධ්‍ය වාර ප්‍රශ්න පත්‍ර - 5 ශ්‍රේණිය

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2018

## Primary Piriven Mid Year Tearm Test - 2018

### ශ්‍රේණිය 05 /Grade 05

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ත්‍රිපිටක ධර්මය I — කාලය : පැයයි
Thripitaka Dharmaya I — Time : One Hour

ත්‍රිපිටක ධර්මය I

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (i), (ii), (iii), (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරයෙහි අංකයට සැසෙදෙන කවය තුළ (X) ලකුණ යොදන්න.-
iv. එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

1. අංගුත්තර නිකායේ පඤ්චක නිපාතයට අයත් කකුධ සූත්‍රයට අනුව ලොව ශාස්තෘවරු වර්ග කීය ද?

   1. හතරකි  2. පහකි  3. හයකි  4. හතකි

2. ත්‍රිවිද්‍යාවට අයත් නොවන ඥානය වන්නේ

   1. පුබ්බේනිවාසානුස්සති ඥානය  2. දිබ්බචක්ඛු ඥානය
   3. අනාවරණ ඥානය  4. ආසවක්ඛය ඥානය

3. ඛේමා රහත් තෙරණිය ලැබූ අග තනතුර වනුයේ

   1. ස්මෘතිමත් භික්ෂුණීන් අතර අග තනතුර  2. ඍද්ධිමත් භික්ෂුණීන් අතර අග තනතුර
   3. ප්‍රඥාවන්ත භික්ෂුණීන් අතර අග තනතුර  4. විනයධර භික්ෂුණීන් අතර අගතනතුර

4. මිගලණ්ඩික නම් භික්ෂුව ආදිකම්මිකයා වූයේ කවර පාරාජිකාපත්තියට ද?

   1. මෙථුනධම්ම පාරාජිකාපත්තිය  2. අදින්නාදානා පාරාජිකාපත්තිය
   3. උත්තරි මනුස්ස ධම්ම පාරාජිකාපත්තිය  4. මනුස්ස විග්ගහ පාරාජිකාපත්තිය

5. භික්ෂු ප්‍රාතිමෝක්ෂයට අනුව සංඝාදිසේස ගණන කීයද?

   1. දෙකකි  2. දහතුනකි
   3. හතරකි  4. තිහකි

6. ‘රූප සමුද්දේස’ යනුවෙන් අර්ථවත් වන්නේ

   1. රූප උපදවන හේතුප්‍රත්‍ය දැක්වීම ය  2. රූප පවතින පිළිවෙල දැක්වීම ය
   3. රූප පිළිබඳ සැකෙවින් විස්තර කිරීම ය  4. රූප සමූහ වශයෙන් බැඳී සිටින ආකාරය දැක්වීම ය

7. සිඟාලෝවාද සූත්‍රයේ සදිසා ආවරණය තුළ උතුරු දිසාවෙන් දැක්වෙන්නේ

   1. ගුරුවරුන් ය  2. අඹුසැමියන් ය  3. මිත්‍රාමාත්‍යාදීන් ය  4. දැසිදැස් කම්කරුවන් ය

8. ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා යනු

1. ලක්ඛණ රූපයන් ය
2. විකාර රූපයන්ය
3. ජීවිත රූපයන් ය
4. විඤ්ඤත්ති රූපයන්ය

9. බිජුවකින් හටගන්නා සත්ත්වයන් හඳුන්වනු ලබන්නේ

1. සංසේදජ සත්ත්වයන් ය
2. අණ්ඩජ සත්ත්වයන් ය
3. ඕපපාතික සත්ත්වයන් ය
4. ජලාබුජ සත්ත්වයන් ය

10. උපඝාතක කර්මය ලෙස හඳුන්වන්නේ

1. කර්ම විපාක වැඩි කිරීම ය
2. කර්ම විපාක අඩු කිරීම ය
3. කර්ම විපාක නැති කිරීම ය
4. උපත ලබා දෙන කර්මයන් ය

11. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් පසු පටිච්ච සමුප්පාදය මෙනෙහි කළේ කීවෙනි සතියේ ද?

1. හතරවන සතිය
2. තුන්වන සතිය
3. දෙවන සතිය
4. පළමුවන සතිය

12. ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ශීල ශික්‍ෂාවට අයත් මාර්ග අංග තුනම ඇතුළත් වරණය වන්නේ කුමක්ද?

1. සම්මා දිට්ඨි, සම්මා වාචා, සම්මා කම්මන්ත
2. සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත
3. සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව
4. සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම

13. මහායාන බුදු දහම ක්‍රියාත්මක රටක් වන්නේ

1. බුරුමය
2. මියන්මාරය
3. තායිලන්තය
4. ටිබැටය

14. බෞද්ධ ආර්ථික ප්‍රතිපදාවට අනුව '' වෙළෙඳාම් කිරීමේදී අල්ලස් ගැනීම'' හැඳින්වෙන්නේ

1. වංචන
2. විපරාමෝස
3. උක්කෝටන
4. ගුම්බවිපරාමෝස

15. කම්ම, චිත්ත, උතු, අහාර, මේවා අයත් වන්නේ

1. රූප සමුද්දේසවලට ය
2. රූප විභාගවලට ය
3. රූප සමුට්ඨානවලට ය
4. රූප කලාපවල ටය

16. නොකළයුතු වෙළෙඳාම් පහට අයත් '' ආයුධ වෙළෙඳාම'' යන අර්ථය ඇතුළත් යෙදුම වන්නේ

1. මංස වාණිජ්ජා
2. සත්ත වාණිජ්ජා
3. සත්‍ථ වාණිජ්ජා
4. මජ්ජ වාණිජ්ජා

17. 'අතිපාතොති කම්මං න කරොති'' මෙහි අදහස වන්නේ

1. ඉතා කුසගිනිය යි වැඩ නොකර යි
2. කුස පිරී වැඩියැ යි වැඩ නොකර යි
3. ඉතා උෟෂ්ණ සහිත යැයි වැඩ නොකර යි
4. ඉතා උදැසන යැයි වැඩ නොකර යි

18. උභතෝ විභංගයට අයත් ග්‍රන්ථ ඇතුළත් වරණය කුමක්ද?

1. පාරාජිකා පාලි, මහාවග්ග පාලි
2. පාරාජිකා පාලි, පාචිත්තිය පාලි
3. මහාවග්ග පාලි, චුල්ලවග්ග පාලි
4. පාරාජිකා පාලි, පරිවාර පාලි

19. පරාභව සූත්‍රයට අනුව පුද්ගලයෙකු පිරිහෙන තැනට වැටෙන ප්‍රධාන කරුණු කීයද?

1. 6 කි
2. 12 කි
3. 18 කි
4. 36 කි

20. වැලිවිට සංඝරාජ මාහිමියන්ගේ ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථයක් නොවන්නේ

1. මුනිගුණාලංකාරය
2. බුදුගුණාලංකාරය
3. සාරාර්ථ සංග්‍රහය
4. මහාබෝධි සන්නය

21. සබ්බත්ථගාමිනී පටිපදා ඥාණය අයත් වන්නේ

1. චතුර්වෛශාරද්‍ය ඥාණය
2. ත්‍රිවිද්‍යා ඥාණය
3. දසබල ඥාණය
4. ෂඩ් අසාධාරණ ඥාණය

22. සැරියුත් මහ තෙරුන් රහත්භාවයට පත්වූයේ

1. චක්කානුවත්ත සූත්‍රය ඇසීමෙන් ය
2. වේදනා පරිග්ගහ සූත්‍රය අසීමෙන් ය
3. මාර තජ්ජනීය සූත්‍රය ඇසීමෙන් ය
4. චාතුම සූත්‍රය ඇසීමෙන් ය

23. බුද්ධ දේශනාවට අනුව මානය කී වැදෑරුම් ද?

1. දෙ වැදෑරුම් ය
2. තෙ වැදෑරුම් ය
3. සිව් වැදෑරුම් ය
4. පස් වැදෑරුම් ය

24. අභිධර්ම පිටකයට අයත් ප්‍රකරණ ගණනින් කොපමණද?

1. පහකි
2. හයකි
3. හතකි
4. පහළොවකි

25. ''ආයත පණ්හි හොති'' මෙයින් දක්වෙන මහා පුරුෂ ලක්ෂණය වන්නේ

1. දිග් විලුම් ඇති බව ය
2. දැල් කවුළු වැනි අත් පා ඇති බව ය
3. දිග් ඇඟිලි ඇති බව ය
4. ඕළු මුවන්ගේ බඳු කෙණ්ඩා ඇති බව ය

26. බුදුරදුන් දවස අබ ඇට තරමින් පටන් ගෙන විශාල තුවාල සහිත ව රෝගී වූ භික්ෂුව වන්නේ

1. චූලපන්ථක තෙරුන් ය
2. නන්ද තෙරුන් ය
3. තිස්ස තෙරුන් ය
4. සුමන තෙරුන් ය

27. ත්‍රිලක්ෂණය පිළිබඳව දක්නා නුවණ හඳුන්වන්නේ

1. ඉද්ධිවිධ ඥාණය
2. සබ්බඤ්ඤුත ඥාණය
3. ආසයානුසය ඥාණය
4. විපස්සනා ඥාණය

28. මච්ඡරිය කෝසිය සිටුතුමා මසුරුකමින් මුදවන ලද රහතන් වහන්සේ වන්නේ

1. මුගලන් මහරහතන් වහන්සේ
2. සැරියුත් මහරහතන් වහන්සේ
3. ආනන්ද මහරහතන් වහන්සේ
4. මහාකාශ්‍යප මහරහතන් වහන්සේ

29. සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් මිත්‍ර ප්‍රතිරූපකයන් ගණන කීය ද?

1. තුනකි 2. හතරකි 3. හයකි 4. අටකි

30. ත්‍රිපිටකයට අයත් සියළුම ගාථා සහිත සූත්‍ර අයත් නාමය වන්නේ

1. සුත්ත 2. ගාථා 3. වේදල්ල 4. ගෙය්‍ය

31. සතර පාරාජිකාව පිළිවෙලින් දැක්වෙන වරණය වන්නේ

1. මෛථුනධම්ම, අදින්නාදානා, මනුස්ස විග්ගහ, උත්තරි මනුසසධම්ම
2. අදින්නාදානා, මෛථුනධම්ම, උත්තරි මනුසසධම්ම, මනුස්ස විග්ගහ
3. උත්තරි මනුසසධම්ම, මනුස්ස විග්ගහ, අදින්නාදානා, මෛථුනධම්ම
4. මනුස්ස විග්ගහ, උත්තරි මනුස්සධම්ම, අදින්නාදානා, මෛථුනධම්ම

32. ''ස්ත්‍රී ලෝලීන්ට හා සමාජ ශාලාවලට ලොල්වූවන් ඇසුරට වැටීම'' යන අර්ථය ඇතුළත් වනුයේ

1. යෙ ධුත්තා 2. යෙ සොණ්ඩා 3. යෙ පිපාසා 4. යෙ නෙකතිකා

33. පටිච්ච සමුප්පාදයේ අංග කීය ද?

1. එකොළසකි 2. දොළොසකි 3. දහසයකි 4. විසි එකකි

34. කාලාශෝක රජුගේ ප්‍රධාන දායකත්වයෙන් පවත්වන ලද ධර්ම සංගායනාව වන්නේ

1. පළමු සංගායනාව යි
2. දෙවන සංගායනාව යි
3. තෙවන සංගායනාව යි
4. සිව්වන සංගායනාව යි

35. ''බුදුරජාණන් වහන්සේ දෙව් මිනිසුන්ට ශාස්තෘ වන සේක' මෙම ගුණය ගැන කියැවෙන වරණය වන්නේ

1. ලෝකවිදූ බුදු ගුණය
2. සත්ථා දේව මනුස්සානං ගුණය
3. අරහං බුදු ගුණය
4. සම්මා සම්බුද්ධ බුදු ගුණය

36. පිරිසිදු සුදු රෙදි කඩක් අතට ගෙන ''රජො හරණං රජො හරණං'' යන පාඨය පවසමින් සිට රහත් වූ භික්ෂුව වන්නේ

1. මහා පන්ථක හිමි 2. චුල්ල පන්ථක හිමි 3. සුනීත හිමි 4. සෝපාක හිමි

37. ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ දැක්වෙන මෙලොව දියුණුවට හේතුවන කරුණු කීයද?

1. පහකි 2. හතරකි 3. අටකි 4. දහයකි

38. සියලු සිත්වල යෙදෙන සබ්බචිත්ත සාධාරණ චෛතසික ගණන කොපමණද?

1. හයකි 2. හතකි 3. දහතුනකි 4. දහහතරකි

39. චුල්ලවග්ග පාලියට අනුව සංඝ සාමග්ගිය භේදනයට හේතුවන කරුණු

1. දහතුනකි 2. දහඅටකි 3. දහසයකි 4. හැත්තෑපහකි

40. බුදුරජාණන් වහන්සේ විසින් අනුදැන වදාළ උපසම්පදා කර්ම අටකි. එයින් වර්තමානය තුළ බහුලව සිදුකරනු ලබන උපසම්පදා කර්මය වන්නේ

1. සරණාගමන උපසම්පදා
2. ඤත්තිචතුත්ථ උපසම්පදා
3. ඔවාද පටිග්ගහන උපසම්පදා
4. ගරුධර්ම පටිග්ගහ උපසම්පදා

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2018

## Primary Piriven Mid Year Tearm Test - 2018

### ශ්‍රේණිය 05 /Grade 05

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ත්‍රිපිටක ධර්මය II | කාලය : පැය තුනයි
Thripitaka Dharmaya II | Time : Three Hour

ත්‍රිපිටක ධර්මය II

සැලකිය යුතුයි :
I කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද, II කොටසින් තෝරාගත් ප්‍රශ්න හතරකට ද පිළිතුරු සපයන්න.

## I කොටස

1. පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

01. බුදුරජාණන් වහන්සේ සතු දෙතිස් මහා පුරුෂ ලක්ෂණ අතරින් හතරක් නම් කරන්න.
02. සැරියුත් මහරහතන් වහන්සේ දේශනා කළ සූත්‍ර දෙකක් නම් කරන්න.
03. සතර පාරාජිකා නම් කරන්න.
04. සතර කර්ම ක්ලේෂ නම් කරන්න.
05. සතර මහාභූත රූප නම් කරන්න.
06. ''අනත්ථ පදසංහිතා'' යන්නෙහි අර්ථය ලියන්න.
07. ''බුදුරජාණන් වහන්සේ අසරණ සරණ වූ අවස්ථා හතරක් නම් කරන්න.
08. කර්මය විපාක දීමේදී කෘත්‍ය වශයෙන් සතර ආකාර ය. එය නම් කරන්න.
09. ධාර්මික ධනෝපාර්ජන ක්‍රම හතර නම් කරන්න.
10. කාලාම සූත්‍රයට අනුව ආගමික මතවාද නොපිළිගත යුතු කරුණු දහයෙන් හතරක් ලියන්න.

(ලකුණු. 2x10 = 20)

## II කොටස

02.
i. බුදුරජාණන් වහන්සේ සතු අෂ්ඨාංග සමුපේත බ්‍රහ්මස්වර අතරින් හතරක් නම් කරන්න. (ලකුණු. 2)
ii. බුදුරජාණන් වහන්සේ සතු ෂඩ් අසාධාරණ ඥාණ අතරින් යමකපාටිහිර ඥානයේ ඇති සුවිශේෂත්වය පැහැදිලි කරන්න. (ලකුණු. 3)
iii. බුදුරජාණන් වහන්සේගේ මහා කරුණාව පිළිබිඹු වන අවස්ථා සනිදර්ශන ව පැහැදිලි කරන්න. (ලකුණු. 5)

03.
i. සප්ත ආපත්තිස්කන්ධ අතරින් හතරක් නම් කරන්න. (ලකුණු. 2)
ii. මෛථුන ධම්ම පාරාජිකාපත්තිය ලියා දක්වන්න. (ලකුණු. 3)
iii. පාරාජිකාපත්තිය හා සංඝාදිසේසාපත්තිය අතර ඇති වෙනස පහදන්න. (ලකුණු. 5)

04.
i. සැරියුත්, මුගලන් මහරහතන් වහන්සේලා ලද අග තනතුරු නම් කරන්න. (ලකුණු. 2)
ii. යෙ ධම්මා හේතුප්පභවා ... යන ගාථාව සම්පූර්ණ කර ලියන්න. (ලකුණු. 3)
iii. සැරියුත් මහරහතන් වහන්සේගේ චරිතයෙන් වර්තමාන භික්ෂු ජීවිතයට ගත හැකි ආදර්ශ පැහැදිලි කරන්න. (ලකුණු. 5)

05.

i. භෝග අපාය මුඛ හයෙන් හතරක් නම් කරන්න. (ලකුණු. 2)

ii. සදිසා ආවරණය පැහැදිලි කරන්න. (ලකුණු. 3)

iii. සදිසා අතරින් ''දක්ඛිණා දිසා'' මනා ගුරු සිසු සබඳතාවයකට මග පාදයි. විමසන්න. (ලකුණු. 5)

06.

i. ''යො වෙ ගාථා සතං භාසෙ........

''නෙව දෙවො න ගන්ධබ්බො........ යන ගාථා දෙක සම්පූර්ණ කරන්න.

(ලකුණු. 2)

ii. ඉහත ගාථා දෙකෙහි අර්ථ ලියන්න. (ලකුණු. 3)

iii. අභිවාදනසීලිස්ස - නිච්චං වද්ධා පචායිනො

චත්තාරො ධම්මා වඩ්ඪන්ති - ආයුවණ්ණො සුඛං බලං'' ඉහත ගාථාවට විවරණයක් සපයන්න.

(ලකුණු. 5)

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2019

## Primary Piriven Mid Year Term Test - 2019

5 ශ්‍රේණිය /Grade 5

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ත්‍රිපිටක ධර්මය- I කාලය : පැයයි

**Tripitaka Dharmaya - I** විභාග අංකය :- ................ Time : One hour

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 40ක් හිමිවේ.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (i), (ii), (iii), (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.

iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

iv. එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

1. තම රූපයට නින්දා කළේ යැයි කෝප වී වෛරයෙන් යුතුව බුදුරජාණන් වහන්සේට අපහාස හිරිහැර කළේ,

1. රූප නන්දා බිසව යි    2. මාගන්ධියා බිසවයි
3. ඛේමා බිසව යි    4. මල්ලිකා බිසව යි

2. බුදුරජාණන් වහන්සේ අසමසම ලෙස හඳුන්වන්නේ,

1. දෙවියන්ට සමාන කළ හැකි බැවිනි.
2. සාමාන්‍ය මිනිසුන්ට සමාන කළ හැකි බැවිනි.
3. රහතන් වහන්සේට සමාන කළ හැකි බැවිනි.
4. බුදුරජාණන් වහන්සේලාට සමාන කළ හැකි බැවිනි.

3. බුදුරජාණන් වහන්සේ දෙතිස් මහාපුරුෂ ලක්ෂණයන්ගෙන් යුක්තවන සේක. ඒ අතුරින් ''අවිරළ දන්ත'' යන්නෙන් දක්වන්නේ,

1. සම සතළිස් දත් ඇති බවය.    2. සමව පිහිටි දත් ඇති බවය.
3. හිදැස් නැති දත් දෙපළ ඇති බවය.    4. සුදෝ සුදු දත්පෙළ ඇති බවය.

4. තථාගතයන් වහන්සේ කිසිවෙකුටත් නැති ඥාණ බල දහයකින් යුතු බව දේශනා කර ඇති සූත්‍ර දේශනාවකි,

1. දීඝ නිකායේ මහාසීහනාද සූත්‍රය.    2. දීඝ නිකායේ සාමඤ්ඤඵල සූත්‍රය.
3. දීඝ නිකායේ මහා නිදාන සූත්‍රය.    4. දීඝ නිකායේ අම්බට්ඨ සූත්‍රය.

5. සාරිපුත්ත මහරහතන් වහන්සේගේ දේශනා කෞශල්‍යය මනාව විදහා දැක්වෙන සූත්‍ර දේශනාවක් වන්නේ,

1. චක්කවත්ති සීහනාද සූත්‍රය    2. වේදනා පරිග්ගහ සූත්‍රය
3. චාතුම සූත්‍රය    4. චක්කානුවත්ත සූත්‍රය

6. මොග්ගල්ලාන මහරහතන් වහන්සේගේ උතුම් සාසනික කාර්යයන්ට අයත් නොවන්නේ,

1. නන්දෝපනන්ද නාගරාජයා දමනය කිරීම.
2. මිසදිටු වූ මැණියන්ට දහම් අවබෝධය ලබාදීම.
3. මච්ඡරිය කෝසිය සිටුතුමා මසුරුකමින් මිදවීම.
4. නිරයේ හා දෙව්ලොව වැඩමවා තොරතුරු දැන මිනිසුන්ට කියාදීම.

7. ඛේමා රහත් තෙරණින් වහන්සේ සම්බුද්ධ ශාසනය තුළ ලැබූ අගතනතුර වූයේ,

1. මහත් සෘද්ධි ඇති භික්ෂුණීන් අතර අගතනතුරයි.
2. විනයධාරී භික්ෂුණීන් අතර අගතනතුරයි.
3. මහා ප්‍රඥාවන්ත භික්ෂුණීන් අතර අගතනතුරයි.
4. ධර්ම කථික භික්ෂුණීන් අතර අගතනතුරයි.

8. උප්පලවණ්ණා කුමරිය බුදුරදුන් හමුවේ පැවිදි වූයේ,

1. පුත්‍ර ශෝකය දුරු කිරීම පිණිස.
2. ධන සම්පත්තිය නැති වීම හේතුවෙනි.
3. සෘද්ධි ප්‍රාතිහාර්යය පෑමේ ආශාවෙනි.
4. කාමයන්ගේ ආදීනව දැකීමෙනි.

9. පාරිශුද්ධිය ලබාගත හැකි ආපත්ති අතුරින් වඩාත් බරපතල ආපත්ති ලෙස සැලකෙන්නේ,

1. පාරාජිකා ආපත්තීන්ය.
2. සංඝාධිසේස ආපත්තීන්ය.
3. අනියත ආපත්තීන්ය.
4. පාචිත්තිය ආපත්තීන්ය.

10. ආයුෂ්මත් ධනිය ස්ථවිරයන් වහන්සේගේ විනය විරෝධී ක්‍රියාවක් හේතුවෙන් පනවා වදාළ පාරාජිකා ආපත්තිය,

1. උත්තරිමනුස්සධම්ම පාරාජිකාවයි.
2. මෛථුන ධම්ම පාරාජිකාවයි.
3. මනුස්සවිග්ගහ පාරාජිකාවයි.
4. අදින්නාදාන පාරාජිකාවයි.

11. ආදි බ්‍රහ්මචරිය ශික්ෂා ලෙස සැලකෙන්නේ,

1. ප්‍රාතිමෝක්ෂ ශිකෂාවන් ය
2. දස ශික්ෂාවන් ය
3. සාමණේර ශික්ෂාවන් ය
4. ආජීව අෂ්ටමක ශික්ෂාවන් ය

12. පාරාජික ශික්ෂාවන්හි එන '' අත්තකාම පාරිචරියාය'' යන පදයෙන් කියැවෙන්නේ,

1. සිව්පසයෙන් තමාට උපස්ථාන කිරීමයි.
2. ධර්මය කියාදීමෙන් තමාට උපස්ථාන කිරීමයි.
3. මෙවුන්දම් සේවයෙන් තමාට උපස්ථාන කිරීමයි.
4. කල්‍යාණ මිත්‍ර සේවනයෙන් තමාට උපස්ථාන කිරීමයි.

13. විනය පිටකයෙහි උභතො විභංග ලෙස හඳුන්වන්නේ,

1. පාරාජිකපාළි - පරිවාරපාළි
2. පාරාජිකපාළි - මහාවග්ගපාළි
3. පාරාජිකපාළි - චුල්ලවග්ගපාළි
4. පාරාජිකපාළි - පාචිත්තියපාළි

14. අටුවාචාර්ය බුද්ධඝෝෂ හිමියන් විසින් දීඝනිකාය සඳහා සම්පාදනය කරන ලද අටුවා ග්‍රන්ථය,

1. සුමංගල විලාසිනිය යි.
2. මනොරථ පූරණිය යි.
3. සම්මොහ විනොදනිය යි.
4. පපංචසුදනිය යි.

15. සිඟාලක සූත්‍රයෙහි අවේලාවේ මංමාවත්හි සැරිසැරීමේ ආදීනව හයක් දක්වා ඇත. ඉන් ''සාපතෙය්‍යම්පි අගුත්තං අරක්ඛිතං හොති'' යනුවෙන් දක්වා ඇත්තේ,

1. තමාගේ ම රැකවරණය නැති වෙයි.
2. තමාගේ ධනයේ රැකවරණය නැතිවෙයි.
3. තමාගේ අඹුදරුවන්ගේ රැකවරණය නැතිවෙයි.
4. වැරදි අපරාධයන්ට තමා සැකකරුවෙක් වෙයි.

16. ''හෙට්ඨිමා දිසා'' යනුවෙන් සිඟාලක සූත්‍රයෙහි දක්වා ඇත්තේ කුමන දිසා ආවරණයක් ද?

1. මව්පිය දූදරු යුතුකම් ය.
2. ගුරු ශිෂ්‍ය යුතුකම් ය.
3. ස්වාමි සේවක යුතුකම් ය.
4. හිත මිත්‍ර යුතුකම් ය.

17. කාලාම සූත්‍රයෙහි සියල්ලන්ට තමා හා සමව සලකා පුළුල් වූ මහත් වූ අප්‍රමාණ වූ අවෛරී නිදුක් වූ සිත පතුරුවා කටයුතු කරන ශ්‍රාවකයා මෙලොවදී ලබන අස්වැසිලි පිළිබඳ දක්වා ඇත. එම අස්වැසිලි ගණනින් කොපමණද?

1. දහයකි. 2. තුනකි. 3. හතරකි. 4. හයකි.

19. පරාභව සූත්‍රයෙහි ''ධම්මකාමො භවං හොති'' යන පාඨයෙහි ධම්ම යන පදයෙන් අර්ථවත් වන්නේ,

1. පංච දුශ්චරිතයෙන් වැළකී සිටීමයි.
2. දස සීලය රකිමින් අකුසලයෙන් වැළකී යහපතෙහි යෙදීමයි.
3. දස අකුසලයෙන් මිදී දස කුසලයෙහි යෙදීමයි.
4. ආජීව සීලය සමාදන්ව ආරක්ෂා කිරීමයි.

20. පුද්ගලයෙකු පිරිහීමට පත්වන කරුණු කොපමණ ප්‍රමාණයක් පරාභව සූත්‍රයෙහි දේශනා කර තිබේද?

1. දහයක් 2. දොළහක් 3. හයක් 4. දහහතරක්

21. අභිධර්මාර්ථ සංග්‍රහයේ රූප විග්‍රහයට අනුව රූප සමුට්ඨාන ලෙස දැක්වෙන්නේ,

1. රූප උපදවන හේතු දැක්වීමයි.
2. දක්වන ලද රූප නැවත බෙදා දැක්වීමයි.
3. රූප පවතින පිළිබඳ දැක්වීමයි.
4. සමූහ වශයෙන් බැඳී සිටින අයුරු දැක්වීමයි.

22. රූප විසි අටෙන් පළමු සතර, මහාභූත රූප වන අතර ඉතිරි රූප, උපාදාය රූප නම් වේ. ඒවා උපාදාය රූප ලෙස හඳුන්වන්නේ,

1. මහා භූතරූපවලින් වෙන් වී පවතින බැවිනි.
2. මහා භූතරූපයන්ට වෙනස් වූවන් බැවිනි.
3. මහා භූතරූපයන් අභිබවා සිටින බැවිනි.
4. මහා භූතරූප හා දැඩිව බැඳී බවතින බැවිනි.

23. රූප විග්‍රහයෙහි විඤ්ඤත්ති රූප නිවැරදි ව දක්වා ඇති වරණය නම්,

1. කාය විඤ්ඤත්ති - මනො විඤ්ඤත්ති
2. කාය විඤ්ඤත්ති - වචී විඤ්ඤත්ති
3. කාය විඤ්ඤත්ති - කාය කම්මඤ්ඤතා
4. කාය විඤ්ඤත්ති - කාය පාගුඤ්ඤතා

24. සියවසක් ගිනි පිදීමට වඩා එක් මොහොතක් ආර්යයන් වහපන්සේ පිදීම උතුම් ය. යන අර්ථය දෙන ධම්මපද ගාථාවෙහි මුල් පදපේළිය තෝරන්න.

1. මාසෙ මාසෙ සහස්සෙන .........
2. යං කිඤ්චි යිට්ඨං ච හුතං ච ලොකෙ .........
3. යො චෙ වස්ස සතං ජන්තුං .........
4. අත්තාහවෙ ජිතං සෙය්‍යො ..........

25. උපායශීලීව මරණයෙන් මිදී ජම්බුපරිබ්‍රාජිකා නමින් ප්‍රසිද්ධියට පත්වූයේ,

1. සාමාවතියයි.
2. කුණ්ඩලකේසියයි.
3. පටාචාරාවයි.
4. ඛුජ්ජුත්තරාවයි.

26. ධම්මපදයේ පාපවග්ගයෙහි එන යො චෙ වස්සසතං ජීවෙ යන ගාථාවන්හි එන ''උදයව්‍යයං'' යන පදයෙන් කියවෙන අර්ථය වන්නේ,

1. ලොව ඇති සියලුදේ ඇති වී නැති වී යන සුළු බවය.
2. ලොව ඇති සියලු දේ සදාතනිකව පවතින බවය.
3. ලොව ඇති සියලු දේ යථාර්ථයෙන් දැකිය යුතු බවය.
4. ලොව ඇති සියලු දේ මතු භවයට ගමන් කරන බවය.

27. පුද්ගලයා ජීවිතයෙහි විඳවන දුක්පීඩාවලින් බොහෝ ප්‍රමාණයක් පෙරකළ කර්ම හේතුවෙන් සිදුවේ. මේ බව නිශ්චිත වශයෙන් දැකිය හැක්කේ,

1. ඉන්ද්‍රිය පරොපරියත්ති ඤාණය ඇති උතුමන්ටය.
2. දිබ්බසෝත ඤාණය ඇති උතුමන්ටය.
3. චුතුපපාත ඤාණය ඇති උතුමන්ටය.
4. දිබ්බචක්ඛු ඤාණය ඇති උතුමන්ටය.

28. සයං කතං දුක්ඛං....... පරංකතං දුක්ඛං ආදී පටිච්ච සමුප්පාද දේශනාවෙන් ප්‍රතික්ෂේප වන කරුණු හතරක් දේශනා කර ඇත්තේ,

1. චුල්ල ගෝසිංග සූත්‍රයේ ය.
2. සල්ලේඛ සූත්‍රයේ ය.
3. අචේල කස්සප සූත්‍රයේ ය
4. වීමංසක සූත්‍රයේ ය.

29. බුදුරජාණන් වහන්සේගේ මධ්‍යම දේශනාව ලෙස සැලකෙන්නේ,

1. ආර්ය අෂ්ටාංගික මාර්ගයයි.
2. චතුරාර්ය සත්‍යයයි.
3. පුනර්භව විග්‍රහයයි.
4. පටිච්ච සමුප්පාදයයි.

30. විපාක දෙන කාල වශයෙන් සතර ආකාර කර්මයෙහි උප්පජ්ජවේදනීය කර්මය ලෙස සැලකෙන්නේ,

1. කළ භවයේදීම විපාක දෙන කර්ම
2. ඊළඟ භවයේදී විපාක දෙන කර්ම
3. ඕනෑම අවස්ථාවක විපාක දෙන කර්ම
4. විපාක නොදෙන කර්ම

31. දෙවනපෑතිස් රජු දවස මෙහෙණින් වහන්සේලා උදෙසා ඉදිකළ ප්‍රථම මෙහෙණවර වූයේ,

1. කාලප්‍රාසාදය යි.
2. තිස්සමහාරාමය යි.
3. චේතියගිරිය යි.
4. හත්ථාල්හක යි.

32. සංඝමිත්තා රහත් තෙරණින් වහන්සේ ලක්දිවට වැඩම වූයේ කුමන පොහෝ දිනකදී ද?

1. උඳුවප්පුර පොහෝ දිනක ය.
2. පෙසොන් පොහෝ දිනක ය.
3. ඇසල පොහෝ දිනක ය.
4. මැදින් පුර පොහෝ දිනක ය.

33. මහායාන ධර්මයෙහි උපදේශ ශාස්ත්‍ර නම් අටුවා ග්‍රන්ථය රචනා වූයේ,

1. විනය පිටකය සඳහා ය
2. සූත්‍ර පිටකය සඳහා ය
3. අභිධර්මය පිටකය සඳහා ය
4. පශ්චාත් පිටක ග්‍රන්ථ සඳහා ය

34. මහායානයෙහි පාරමිතා සංකල්පයට අයත් නොවන පාරමිතාව නම්,

1. වීර්ය පාරමිතාව යි.
2. ධ්‍යාන පාරමිතාව යි.
3. අධිෂ්ඨාන පාරමිතාව යි.
4. ප්‍රඥා පාරමිතාව යි.

35. රාජ්‍යයේ අධර්ම ක්‍රියා නැවැත්වීම අයත් වන්නේ දැහැමි රාජ්‍ය පාලනයක් සඳහා වන,

1. දස රාජධර්මයන්හි ය.
2. දස සක්විතිවත්හි ය.
3. සප්ත අපරිහානිය ධර්මයන්හි ය.
4. සතර සංග්‍රහ වස්තූන්හි ය.

36. සතර සංග්‍රහ වස්තුවෙහි එන අර්ථචර්යාවෙන් අර්ථවත් වන්නේ,

1. මහජනයාගේ සුබසෙත සඳහා ආර්ථික කළමනාකරණයයි.
2. මහජනයාගේ සුබසෙත සඳහා ධනය ලබාදීමයි.
3. මහජනයාගේ සුබසෙත සඳහා දැහැමිව පාලනය කිරීමයි.
4. මහජනයාගේ සුබසෙත සඳහා සාමය ඇති කිරීමයි.

37. ධනය කොටස් හතරකට බොදා පරිහරණය කළයුතු බව විස්තර වන්නේ,

1. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ ය.
2. අණන සූත්‍රයේ ය.
3. සිඟාලක සූත්‍රයේ ය.
4. පත්තකම්ම සූත්‍රයේ ය.

38. ''වම්මිකො වූපචීයති'' යනුවෙන් ධන උපාර්ජනයෙහි කුමන ස්වභාවයක් විස්තර කරයි ද?

1. බමරු පැණි රැස්කරන්නා සේ.
2. වේයන් තුඹසක් බඳින්නා සේ.
3. විලක ජලය රැස් කරන්නා සේ.
4. කළයක ජලය පිරෙන්නා සේ.

39. තෙසැත්තෑ ඥාන අතුරින් මහරහතන් වහන්සේට ඇති ඥාන ගණන?

1. හැට හයකි.
2. හැට අටකි
3. හැට පහකි
4. හැත්තෑවකි

40. සද්ධර්මයේ සුරක්ෂාව පිණිස ප්‍රථම ධර්ම සංගායනාවෙන් පසුව මජ්ඣිම නිකායෙහි භාරකාරත්වය පවරන ලද්දේ,

1. මහා කාශ්‍යප තෙරුන් ඇතුළු ශිෂ්‍ය පරපුරට ය.
2. ආනන්ද තෙරුන් ඇතුළු ශිෂ්‍ය පරපුරට ය.
3. සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍ය පරපුරට ය.
4. අනුරුද්ධ තෙරුන්ගේ ශිෂ්‍ය පරපුරට ය.

| | | |
|---|---|---|
| සියලු ම හිමිකම් ඇවිරිණි) All Rights Reserved) | **මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2019**<br>Primary Piriven Mid Year Term Test - 2019<br>5 ශ්‍රේණිය / Grade 5 | |
| | **ත්‍රිපිටක ධර්මය--II**<br>**Tripitaka Dharmaya** විභාග අංකය :- ................ | කාලය : පැය තුනයි<br>Time : Three hours |

❖ I කොටස අනිවාර්ය වන අතර II සහ III කොටස් වලින් ප්‍රශ්න දෙක බැගින් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතුය.

## I කොටස

01.

i. අෂ්ටාංග සමුපෙත බ්‍රහ්ම ස්වරයේ විලාස හතරක් නම් කරන්න.

ii. ඛේමා තෙරණිය සෝවාන් ඵලයට පත් වූයේ කිනම් සූත්‍ර දේශනාවක් ශ්‍රවණය කිරීමෙන්ද ? ඇය ලැබූ අග තනතුර කුමක්ද ?

iii. කාලාම සූත්‍රයේ ඇතුලත් ආගමික මතවාද නොපිළිගත යුතු කරුණු ආකාර දහයෙන් හතරක් ලියන්න.

iv. ''නිද්දාසීලි සභාසීලි'' යන ගාථාව සම්පූර්ණ කරන්න.

v. දෙආකාර වූ පරිනිර්වාණ ධාතු නම් කරන්න.

vi. ''ගබ්භමේකෙ උප්පජ්ජන්ති - නිරයං පාකම්මිනො<br>සග්ගං සුගතිනො යන්ති - පරිනිබ්බන්ති අනාසවා''<br>යන ගාථාවේ අදහස සරල බසින් ලියන්න.

vii. පංච නියාම ධර්ම නම් කරන්න.

viii. නවංග සත්‍ථු සාසනයට ඇතුලත් අංග හතරක් නම් කරන්න.

ix. අංගුත්තර සූත්‍රයේ අණන සූත්‍රයේ දැක්වෙන ධන ඉපයීම් ක්‍රම හතර නම් කරන්න.

x. පටිච්චසමුප්පාදයට අයත් අංග දොළහකි. ඉන් හතරක් නම් කරන්න

(ලකුණු 2 x 10 = 20 යි)

## II කොටස

02.

i. බුදුරජාණන් වහන්සේ සතු සිව්විසාරද නුවණ නම් කරන්න.

ii. සිව්විසාරද ඥාණ අතරින් තුනක් පැහැදිලි කරන්න.

iii. තථාගතයන් වහන්සේගේ මහා ප්‍රඥාව පිළිබඳ විස්තරයක් කරන්න.

(ලකුණු 2+3+5 = 10 යි)

03.

i. මනුස්සවිග්ගහ පාරාජිකාපත්තිය ලියා දක්වන්න.

ii. මනුස්සවිග්ගහ පාරාජිකාපත්තියේ නිදන කථාව ලියන්න.

iii. ''අංග පහක් සම්පූර්ණ වීමෙන් උපසම්පදා භික්ෂුවක් මනුස්ස විග්ගහ පරාජිකාවට පත්වේ'' මෙය අදාළ කරුණු අනුව තහවුරු කරන්න. (ලකුණු 2+3+5 = 10 යි)

04.

i. සැරියුත් මුගලන් මහ රහතන් වහන්සේලා ලැබූ තනතුරු නම් කරන්න.
ii. සැරියුත් මුගලන් මහරහතන් වහන්සේලාගෙන් ශාසනික උන්නතිය උදෙසා බුද්ධ කාලීනව සිදු වූ මෙහෙවර කෙටියෙන් පැහැදිලි කරන්න.
iii. නූතන භික්ෂු නායකත්වය අර්ථ සම්පන්න කර ගැනීම සඳහා අග්‍රශ්‍රාවක මහරහතන් වහන්සේලාගෙන් ලබාගත හැකි ආදර්ශ විවරණය කරන්න.

(ලකුණු 2+3+5 = 10 යි)

## III කොටස

05.

i. රූප සමුට්ඨාන නම් කරන්න.
ii. රූප සමුටඨාන අතරින් දෙකක් පැහැදිලි කරන්න.
iii. අභිධර්මයට අනුව සත්ත්වයාගේ රූප ප්‍රවෘත්තිය හා උත්පත්ති වර්ග පිළිබඳ විස්තර කරන්න.

(ලකුණු 2+3+5 = 10 යි)

06.

යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති ..... යන ගාථාව සම්පූර්ණ කරන්න.
ii. ඉහත ගාථවෙහි අර්ථය සරල බසින් ලියන්න.
iii. සබ්බෙ තසන්ති දණ්ඩස්ස -- සබ්බෙ භායන්ති මච්චුනො
අත්තානං උපමං කත්වා - න හනෙය්‍ය න ඝාතයෙ යන ගාථාව ඇසුරින් මනුෂ්‍ය ජීවිතයක වටිනාකම පිළිබඳ විවරණයක් කරන්න.

(ලකුණු 2+3+5 = 10 යි)

07.

i. පරාභව සූත්‍රයට අනුව පිරිහීමේ දොරටු හතරක් ලියන්න.
ii. ඉන් තුනකට වෙන් වෙන්ව කෙටි විස්තර සපයන්න.
iii. පුද්ගල පරිහානිය වළක්වා ගැනීම් සඳහා පරාභව සූත්‍රයේ ඉගැන්වීම් ඉවහල් වේ. විමසන්න.

(ලකුණු 2+3+5 = 10 යි)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமை உடையது]
All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**මධ්‍යවාර පරීක්ෂණය - 2022**
**இரண்டாம் தவணைப் பரீட்சை - 2022**
**Mid Year Term Test - 2022**

පැය එකයි

**ත්‍රිපිටක ධර්මය I** විභාග අංකය : .......................................... **05 ශ්‍රේණිය**

සැලකිය යුතුයි

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති (i) (ii) (iii) (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න. (මෙම කොටස සඳහා ලකුණු 40ක් හිමි වේ).
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරා ගත් පිළිතුර, අංකයට සැසඳෙන කවය තුළ "X" ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

1. අදින්නාදානා පාරාජිකාවේ ආදි කම්මිකයා වනුයේ,
   (i). සුදින්න භික්ෂුව. (ii). ධනිය භික්ෂුව.
   (iii). මිගලණ්ඩික භික්ෂුව . (iv). වග්ගුමුදා තීරයේ භික්ෂූහු.

2. ප්‍රථම ධර්ම සංගායනාවට සහභාගි වූ පන්සියයක් මහරහතන් වහන්සේලාගෙන් පැවත එන බෞද්ධ සම්ප්‍රදාය,
   (i). මහායාන සම්ප්‍රදාය යි. (ii). වජ්‍රයාන සම්ප්‍රදාය යි.
   (iii). ථේරවාද සම්ප්‍රදාය යි. (iv). මාධ්‍යමික සම්ප්‍රදාය යි.

3. විනය පිටකයට අයත් ඛන්ධක ග්‍රන්ථ දෙක ඇතුළත් නිවැරදි පිළිතුර වන්නේ,
   (i). මහාවග්ග පාළි, චුල්ලවග්ග පාළි (ii). චුල්ලවග්ග පාළි, පරිවාර පාළි.
   (iii). පාරාජික පාළි, පාචිත්තිය පාළි (iv). පාචිත්තිය පාළි, මහාවග්ග පාළි

4. ධම්මපාල හිමියන් විසින් සම්පාදිත සුත්තනිපාත අටුවාව,
   (i). පපඤ්චසූදනී අටුවාව ය. (ii). පරමත්ථදීපනී අටුවාව ය.
   (iii). පරමත්ථජෝතිකා අටුවා ය. (iv). අත්ථසාලිනි අටුවාව ය.

5. බුද්ධ දේශනාවට අනුව හිතවත් මිත්‍රයෙකු නොවන්නේ,
   (i). උපකාරක (ii). අත්ථක්ඛායී
   (iii). අනුප්පියභාණී (iv). අනුකම්පක

6. දැහැමි භවභෝග සම්පත් උපයන ගිහියා එය සතර කොටසකට බෙදා ගත යුතුය. එයින් කොටස් දෙකක් යෙදිය යුත්තේ,
   (i). කර්මාන්ත කටයුතුවලට ය. (ii).පරිභෝජනය කොට සැප සම්පත් විඳීමට ය.
   (iii). ආපදාවකදී ප්‍රයෝජනය වෙතැයි තැන්පත් කිරීමට ය. (iv). පෞද්ගලික පරිහරණයට ය.

7. ථෙරවාද සම්ප්‍රදාය ක්‍රියාත්මක වන රටක් නොවන්නේ,
   (i). ටිබැටය (ii). බුරුමය
   (iii). ථායිලන්තය (iv). ශ්‍රී ලංකාව

8. මිහිඳු මහරහතන් වහන්සේගේ කැමැත්ත පරිදි තනවන ලද ආවාසය,

(i). කාලපාසාදය යි. (ii). මහා විහාරය යි.

(iii). මිගාරමාතුපාසාදය යි. (iv). වාලුකාරාමය යි.

9. ජීවිතයේදී කෙනෙකු නිතර පුරුදු පුහුණු කරන ලද කර්ම වනුයේ,

(i). ආචිණ්ණ කර්මය යි. (ii).ආසන්න කර්මය යි.

(iii). කටත්තා කර්මය යි. (iv). ගරුක කර්මය යි

10. **"අස්මිං අසති ඉදං න හෝති"** මෙහි අදහස වනුයේ,

(i). මෙය නැති වීමෙන් මෙය නැති වේ. (ii). මෙය ඇති කල්හි මෙය වේ.

(iii). මෙය හට ගැනීමෙන් මෙය හටගනී. (iv). මෙය නැති කල්හි මෙය ඇති නොවේ.

11. **කායානුපස්සනා සතිපට්ඨානයට** අයත් කරුණක් වන්නේ,

(i). ඛන්ධ. (ii).ඉරියාපථ.

(iii). නීවරණ. (iv). ආයතන.

12. **උද්ධම්භාගීය සංයෝජනයක් වන්නේ,**

(i). අරූප රාග. (ii). විචිකිච්චා.

(iii). පටිඝ. (iv).කාමරාග.

13.**" අනුට්ඨාතා ච යෝ නරෝ - තං පරාභවතෝ මුඛං "** මෙහි දැක්වෙන පිරිහීමට හේතුවන කරුණ වන්නේ,

(i). පිරිස් මැද ගැවසෙන සුලු වීම. (ii). උත්සාහයෙන් තොර වීම.

(iii). අසත්පුරුෂයන්ගේ මිසදිටු දහම් රුචි කිරීම. (iv). අසත්පුරුෂයන් ප්‍රිය කිරීම.

14. ගුරුවරයෙකුට දැක්විය යුතු උපස්ථානයක් වන්නේ,

(i).සුස්සූසාය (ii). සුග්ගහීතං ගාහාපෙන්ති.

(iii). සම්මානනාය. (iv). අත්ථචරියා.

15. පුක්කුසාති රජතුමා බුදුරජාණන් වහන්සේ ඉදිරියට වැඩම කොට කුඹල් හලේ දී, උන්වහන්සේ සමඟ රාත්‍රිය පුරාවට ම බුදුගුණ සාකච්ඡා කළේය. මෙම සිදුවීමෙන් ප්‍රකට වන්නේ,

(i). මහා කරුණා ගුණය යි. (ii). නිහතමානී ගුණය යි.

(iii). තාදී ගුණය යි. (iv). අරහං ගුණය යි.

16. බුදුරජාණන් වහන්සේගේ වාග් විලාශයෙහි **" අවසාරිතා"** යන්නෙන් අදහස් කරන්නේ,

(i). පැහැදිලි වීම (ii). සවනට සැප නොදීම.

(iii).අතර බිඳීම් නැති බව. (iv). මිහිරි බව.

17. මෙථුනධම්ම පාරාජිකාවෙහි **අනුප්‍රඥප්තිය** වන්නේ,

(i). සික්ඛාසාජීව සමාපන්නෝ (ii). මෙථුනං ධම්මං පතිසේවෙය්‍ය.

(iii). අන්තමසෝ තිරච්ඡානගතායපි (iii). සික්ඛං අපච්චක්ඛාය.

18. සංඝාදිසේස පිළිබඳ **සාවද්‍ය** ප්‍රකාශය වන්නේ,

(i). ගරුකාපත්ති වශයෙන් ගැනෙන ශික්ෂා පද සමූහයකි.

(ii). දේශනා පාරිශුද්ධිය වශයෙන් පිරිසිදු විය හැකියි.

(iii). වත් සමාදානය, මානත පිරීම හා අබ්භාන කර්මය මගින් පිරිසිදු විය හැකි ය.

(iv). පාරිශුද්ධිය ලබාගත හැකි ඇවැත් අතුරින් ඉතාමත් බරපතල ඇවැත් ය.

19. සංයුත්ත නිකායෙහි ඇතුළත් සූත්‍ර සංඛ්‍යාව,

(i). 34 කි. (ii). 152 කි.
(iii). 7762 කි. (iv). 9557 කි.

20. **කංඛාවිතරණී නම්** වූ උභය ප්‍රාතිමෝක්ෂ ටීකාව රචනා කළේ,

(i). ධම්මපාල හිමි ය. (ii). සැරියුත් හිමි ය.
(iii). බුද්ධනාග හිමි ය. (iv). චෝළිය කාශ්‍යප හිමි ය.

21. ආගමික මතවාද පිළිගැනීමේ නිවැරදි විධිය ඉගැන්වෙන සූත්‍ර දේශනාව වන්නේ,

(i). පරාභව සූත්‍රය (ii). කාලාම සූත්‍රය
(iii). සිගාලක සූත්‍රය (iv). ආපත්තිභය සූත්‍රය

22. ධර්මානුකූලව පිළිගත හැකි දේ පමණක් පිළිගෙන අකුසලයෙන් වැළකී කුසලය දියුණු කොට සිව්බඹ විහරණයෙන් වාසය කරන පුද්ගලයාට ලැබෙන සැනසිලිදායක සිතුවිල්ලක් නොවන්නේ,

(i).පව් කළත් නරක විපාකයක් නැත්නම් පව් නොකරන තමා කවර අතින් බැලුවත් පිරිසිදු කෙනෙකු බව.
(ii).පරලොවක් තිබේ නම් හොඳ කර්මවලට හොඳ විපාක ලැබේ නම් තමා අනිවාර්යෙන් සුගතියට යන බව.
(iii).පරලොවක් නැතිනම් හොඳ නරක කර්මවල විපාක නැතිනම් හොඳින් ජීවත් වන තමා මෙලොව සුවෙන් සිටින බව.
(iv).පව් කිරීම කියා දෙයකුත් ඊට දුක් විපාකයකුත් තිබේ නම් පව් නොකරන තමාට දුකක් විඳින්නට සිදුවන බව.

23. **සත්ථ වණිජ්ජා** යනුවෙන් දැක්වෙන්නේ.

(i).මස් වෙළඳාම ය. (ii).මත්පැන් වෙළඳාම ය.
(iii). සත්ත්ව වෙළඳාම ය. (iv). අවි ආයුධ වෙළඳාම ය.

24. දස භූමි සංකල්පයය පිළිබඳ දැක්වෙන නිවැරදි ප්‍රකාශය වන්නේ,

(i). ථේරවාදී ඉගැන්වීමක් වේ. (ii). ථේරවාදයේ මාර්ගඵල සිත්වලට අනුරූපී වේ.
(iii). ලලිතවිස්තර සූත්‍රයෙහි මෙය ඇතුළත් වේ. (iv). දස පාරමිතා සංකල්පයට අනුරූපී වේ.

25. **"දාළිද්දියම්පි භික්ඛවේ දුක්ඛං ලෝකස්මිං ගිහීනෝ කාමභෝගිනෝ"** මෙම ප්‍රකාශය ඇතුළත් සූත්‍රය වනුයේ,

(i).පරාභව සූත්‍රය (ii). චක්කවත්ති සීහනාද සූත්‍රය
(iii). මහා තණ්හාසංඛ සූත්‍රය (iv). ඉණ සූත්‍රය

26. සංඝමිත්තා තෙරණිය ලක්දිවට පැමිණ වැඩ වාසය කළේ,

(i). සෑගිරියෙහි ය. (ii). හත්ථාල්හක ආරාමයෙහි ය.
(iii). කාලපාසාද ආරාමයෙහි ය. (iv). මහමෙව්නාවෙහි ය.

27. පටිච්චසමුප්පාද සිද්ධාන්තයට අනුව භවය ඇති වීමට ආසන්න හේතුව වන්නේ,

(i).උපාදාන (ii). තණ්හා
(iii). වේදනා (iv). ඵස්ස

28. ධම්මානුපස්සනාවේ භාවනා අරමුණු (කමටහන්) සංඛ්‍යාව,

(i). 01 කි. (ii). 05 කි.
(iii). 09 කි. (iv). 14 කි.

29. **"දාන සීලාදී යහපත් කටයුතු යුහුසුළුව කළ යුතුය"** මෙම අදහස ඇති ගාථා අර්ධය වන්නේ,

(i).පාපං චේ පුරිසෝ කයිරා. (ii). අභිත්ථරේථ කල්‍යාණේ.
(iii). තම්හි ඡන්දං කයිරාථ. (iv). දන්ධංහි කරෝතෝ පුඤ්ඤං.

30. සකදාගාමී  පුද්ගලයා සම්බන්ධව සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

(i).මියගොස් නැවත කාම ස්වර්ගයකට එන්නේ නම් එක් වරක් පමණි.

(ii). හෙතෙම කාමරාග හා පටිඝ යන සංයෝජන දෙක තුනී කරන්නේය.

(iii). මනුලොවට එක් වරක් පැමිණෙන්නේ කාමරාගය මුළුමනින් ම සිඳ නොදැමූ නිසා ය.

(iv). සකදාගාමී පුද්ගලයන් සිව් දෙනෙකු පිළිබඳව විශුද්ධිමාර්ගයේ දැක් වේ.

31. **"ඉති කිරාය"** යන්නෙහි අදහස වනුයේ,

(i).කට කතාවෙන් ඇසූ නිසා. (ii). මෙය මෙසේ වීලුයි කියූ නිසා.

(iii). මෙය මෙසේ විය හැකි නිසා. (iv). මෙය තර්කානුකූල නිසා.

32. සිගාලක සූත්‍රයට අනුව දකුණු දිසාවෙන් නිරූපණය වන්නේ,

(i).මව්පියන් ය. (ii). ගුරුවරුන් ය.

(iii). අඹුදරුවන් ය. (iv). මිතුරන් ය.

33. මොග්ගලීපුත්තතිස්ස හිමියන් විසින් කරවන ලද ප්‍රකරණය වන්නේ,

(i).ධාතුකථා පකරණය. (ii). පුග්ගල පඤ්ඤත්ති පකරණය.

(iii). පට්ඨාන පකරණය. (iv). කථාවත්ථු පකරණය.

34. සිංහල අටුවා පාලියට පෙරළා ගෙන ඒමට **බුද්ධඝෝෂ හිමියන්** ලංකාවට එවන ලද්දේ,

(i). රේවත හිමියන් ය. (ii). ධම්මපාල හිමියන් ය.

(iii). බුද්ධදත්ත හිමියන් ය. (iv). බුද්ධනාග හිමියන් ය.

35. මිහිඳු මහරහතන් වහන්සේ තිස්ස රජතුමාට පළමුවෙන් දේශනා කළ සූත්‍ර දේශනාව,

(i). දේවදූත සූත්‍රය යි. (ii). බාලපණ්ඩිත සූත්‍රය යි.

(iii). චූලහත්ථිපදෝපම සූත්‍රය යි. (iv). ධම්මචක්කපවත්තන සූත්‍රය යි.

36. අනුන්ගේ දුකේදී  සත්පුරුෂ හදවතේ ඇති වෙන අනුකම්පාව,

(i). මෙත්තාව යි. (ii). කරුණාව යි.

(iii). මුදිතාව යි. (iv). උපේක්ෂාව යි.

37. මහායාන ධර්මයෙහි ඉගැන්වෙන සූත්‍ර ධර්ම ගණනින්,

(i). 04 කි. (ii). 05 කි.

(iii). 07 කි. (iv). 10 කි.

38. **" ජාලහත්ථිපාදෝ හෝති "** යනුවෙන් දැක්වෙන්නේ,

(i). දැල් කවුළු වැනි අත් පා ඇත යන්න යි. (ii). මොළොක් තරුණ අතුල් පතුල් ඇත යන්න යි.

(iii). දික් ඇඟිලි ඇත යන්න යි. (iv). දික් විලුඹ ඇත යන්න යි.

39. ත්‍රිවිද්‍යාවන් හි ඇතුළත් නොවන්නේ,

(i). දිබ්බචක්ඛු ඤාණය යි. (ii).  පුබ්බේ නිවාසානුස්සති ඤාණය යි.

(iii). ආසවක්ඛය ඤාණය යි. (iv). ඉද්ධිවිධ ඤාණය යි.

40. උපසම්පදා භික්ෂුවක්, **මනුසවිග්ගහ පාරාජිකාවට** පත් වීමට සම්පූර්ණ විය යුතු කරුණු ගණනින්,

(i). 04 කි. (ii). 05 කි.

(iii). 07 කි. (iv). 08 කි.

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமை உடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

මධ්‍යවාර පරීක්ෂණය - 2022
இரண்டாம் தவணைப் பரீட்சை - 2022
Mid Year Term Test - 2022

පැය තුනයි

ත්‍රිපිටක ධර්මය II විභාග අංකය : ......................................... 05 ශ්‍රේණිය

- I කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද II සහ III කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ද තෝරගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

1.පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. ෂඩ් අසාධාරණ ඥාන අතරින් දෙකක් නම් කරන්න.

ii. **“අථ වා පන පේතානං කාලකතානං දක්ඛිණං අනුප්පදස්සාමි ”** යන පාඨයෙහි අර්ථය ලියන්න.

iii. **“න සෝ සබ්බේසු ඨානේසු”** යන ගාථාව සම්පූර්ණ කරන්න.

iv. උභතෝ විභංගය ට අයත් ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

v. ධනය විනාශ වන දොරටු හයකි. ඉන් දෙකක් නම් කරන්න.

vi. දස රාජ ධර්ම නම් කරන්න.

vii. කර්ම විපාකයේ ආකාර දෙක ලියන්න.

viii. පුනර්භවයට සාධක වන කරුණු දෙකක් නම් කරන්න.

ix. සතිපට්ඨාන සූත්‍රය දේශනා කිරීමෙන් අපේක්ෂා කළ අරමුණු දෙකක් නම් කරන්න.

x. සෝපදිසේස නිබ්බාන ප්‍රත්‍යක්ෂ කරගත හැකි ආකාර තුනකි. දෙකක් නම් කරන්න.

(ලකුණු 2x10 = 20)

## II කොටස

02. i. පුද්ගලයකු උසස් බවට හෝ පහත් බවට පත්වන්නේ තම චරිතය හා ක්‍රියාපිළිවෙත හේතුවෙන් බව බුදුරජාණන් වහන්සේ දේශනාවෙන් මෙන් ම ආදර්ශයෙන් ද පෙන්වූහ. උදාහරණ දෙකක් දක්වන්න.

ii. බුදුරජාණන් වහන්සේගේ අසහාය ශාස්තෘත්වය පැහැදිලි කරන්න.

iii. **“බුදුරජාණන් වහන්සේ මහා කරුණා ගුණයෙන් සියලු සත්තවයන්ට ශාන්තිය උදා කළ සේක. උදාහරණ දෙකක් ඇසුරින්** විමසන්න.

(ලකුණු 2+3+5 = 10)

03. i. යම් ක්‍රියාවක් හරි හෝ වැරදි ලෙස නිගමනය කළ හැකි ක්‍රම දෙකක් කාලාම සූත්‍රය ඇසුරින් නම් කරන්න.

ii. බුදුරජාණන් වහන්සේ විසින් කාලාම සූත්‍රය දේශනා කිරීමේ අරමුණු පැහැදිලි කරන්න.

iii. “කාලාම සූත්‍රය දේශනා කිරීමේ අරමුණු ප්‍රධාන අංශ පහක් යටතේ විවරණය කොට ඇත” එම අංශ පහ සමාලෝචනය කරන්න.

(ලකුණු 2+3+5 = 10)

04. i.මහායාන බුදුසමයේ මූලික ඉගැන්වීම් **හතරක්** නම් කරන්න.

ii. මහායාන බුදුසමයේ ප්‍රභවය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

iii. මෙහි දැක්වෙන බෝධිසත්ව සංකල්පය සමාජ ප්‍රගමනයට ඉවහල් වන ආකාරය පෙන්වා දෙන්න.

(ලකුණු 2+3+5 = 10)

## III කොටස

05. i. අදින්නාදාන පාරාජිකාපත්තිය ලියන්න.

ii. එම පාරාජිකාපත්තියේ අර්ථය ලියන්න.

iii. සතර පාරාජිකා ආරක්ෂා කිරීම නිවනට හේතු වේ. මෙය සනාථ කරන්න.

(ලකුණු 2+3+5 = 10)

06. i. නවාංග සත්ථු සාසනය නම් කරන්න.

ii. සූත්‍ර පිටකයේ සැකැස්ම පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

iii. සූත්‍ර අධ්‍යයනයට අටුවා හා ටීකාවල උපයෝගිතාව පැහැදිලි කරන්න.

(ලකුණු 2+3+5 = 10)

07. i. අටවිසි රූපවල පොදු ලක්ෂණ අට ලියන්න.

ii. මහා භූතරූප පිළිබඳ විස්තර කරන්න.

iii. උපත අනුව සත්වයා වර්ග කර ඇති ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 2+3+5 = 10)

[ සියලුම හිමිකම් ඇවිරිණි]
[ முழுப் பதிப்புரிமை உடையது]
[ All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**මධ්‍ය වාර පරීක්ෂණය - 2023**
**இரண்டாம் தவணைப் பரீட்சை - 2023**
**Mid Year Term Test - 2023**

**පැය එකයි.**

**ත්‍රිපිටක ධර්මය I** **විභාග අංකය : ..............................** **05 ශ්‍රේණිය**

සැලකිය යුතුයි.
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති (i), (ii), (iii), (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න. (මෙම කොටස සඳහා ලකුණු 40 ක් හිමි වේ).
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකය ට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

1. බුදුරජාණන් වහන්සේගේ උත්තරීතර මානුෂීය ගුණාංග අතර **"අසමසම"** යනුවෙන් හැඳින්වෙන්නේ,
   i. සාමාන්‍ය මිනිසුන්ට සමකළ නොහැකි බැවිණි. ii. මානුෂීය ගුණාංගයන්ගෙන් යුක්ත බැවිණි.
   iii. බුදුරජාණන් වහන්සේලා හා පමණක් සමවන බැවිණි. iv. නිහතමානී ගුණයෙන් යුක්ත බැවිණි.

2. බුදුරජාණන් වහන්සේට තමාගේ කය තුළ, තමා හා සමාන සර්වාංග පරිපූර්ණ කයක් නිර්මාණය කොට, කොපුවක තිබූ දෙයක් පිටතට ගන්නාක් මෙන්, එය තමාගේ කයෙන් පිටතට ගත හැකි ය. ඒ සඳහා උපකාර වන්නේ,
   i. පරචිත්තවිජානන ඤාණය යි. ii. මනෝමයඉද්ධි ඤාණය යි.
   iii. ඉද්ධිවිධ ඤාණය යි. iv. දිබ්බසෝත ඤාණය යි.

3. චක්කානුවත්ත සූත්‍රයට අනුව මේ සසුනේ අර්ථය දන්නා, ධර්මය දන්නා, සිව්පස පමණ දන්නා, කාල පරිහරණය දන්නා, පිරිස් ගැන දන්නා, තථාගතයන් වහන්සේ විසින් පවත්වන ලද අනුත්තර වූ ධර්ම චක්‍රය මනාකොට නැවත පවත්වන එකම ශ්‍රාවකයා වන්නේ,
   i. සාරිපුත්ත ස්ථවිරයන් වහන්සේ ය. ii. අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ ය.
   iii. මහා කස්සප ස්ථවිරයන් වහන්සේ ය. iv. මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ ය.

4. **"ස්ත්‍රී පුරුෂ සංවාසයේ දී ඔවුනොවුන්ගේ ලිංගේන්ද්‍රියයන් තල ඇටයක් පමණ හෝ එකිනෙක ප්‍රවේශ කිරීම"** පාරාජිකා වීම සඳහා හේතුවක් වේ. ඉහත අදහස ඇතුළත් වරණය වන්නේ,
   i. සික්ඛාසාජීව සමාපන්නෝ ii. මේථුනං ධම්මං පතිසෙවෙය්‍ය
   iii. අන්තමසෝ තිරච්ඡානගතායපි iv. දුබ්බල්‍යං අනාවීකත්වා

5. බුදුරජාණන් වහන්සේගෙන් උත්පලවණ්ණා මහරහත් තෙරණින් වහන්සේ ................. තනතුර ලැබුවා ය.
   i. මහා ප්‍රඥාවන්ත සහ දක්ෂිණ අග්‍රශ්‍රාවිකා ii. මහා ප්‍රඥාවන්ත සහ වාම අග්‍රශ්‍රාවිකා
   iii. මහා ඍද්ධි සම්පන්න සහ දක්ෂිණ අග්‍රශ්‍රාවිකා iv. මහා ඍද්ධි සම්පන්න සහ වාම අග්‍රශ්‍රාවිකා

6. කායසංසග්ග සංඝාදිසේසාපත්තියෙහි දැක්වෙන **"මාතුගාමේන"** යන පදයෙන් අදහස් **නොවන්නේ,**
   i. එදවස උපන් ස්ත්‍රිය යි. ii. මහලු ස්ත්‍රිය යි.
   iii. මනුෂ්‍ය ස්ත්‍රිය යි. iv. මනුෂ්‍ය නොවන ස්ත්‍රිය යි.

7. **"නවක භික්ෂූන්ගේ කැකෝ ගැසීමක් නිසා බුදුරජාණන් වහන්සේ, සැරියුත් මුගලන් දෙනම සහ දහසක් පිරිවර දෙව්රම්වෙහෙරින් නෙරපාලූහ"** මෙම කරුණ දැක්වෙන චාතුම සූත්‍රයට අනුව මුගලන් මහරහතන් වහන්සේ පිළිබඳ නිවැරදි ප්‍රකාශය ඇතුළත් වරණය වන්නේ,
   i. තමනුත් විවේකයෙන් සිටීමට අදහස් කළහ. ii. සංඝයා පාලනය කිරීමට අදහස් කළහ.
   iii. භික්ෂූන්ගෙන් ඈත්ව සිටීමට අදහස් කළහ. iv. සංඝයා පාලනයෙන් ඈත්ව සිටීමට අදහස් කළහ.

8. කාලාම සූත්‍රයේ සඳහන් **"මා දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා"** යන්නෙහි අදහස වන්නේ,

i. කටකතාවෙන් ඇසූ නිසා නොපිළිගන්න. ii. න්‍යාය ධර්මයන්ට ගැළපේය කියා නොපිළිගන්න.
iii. මෙය මෙසේ විලුයි කියා නොපිළිගන්න. iv. අප පිළිගත් දෘෂ්ටියට ගැළපේය කියා නොපිළිගන්න.

9. ධරමාන බුදුන් දවස සිය දැන උගත්කම් නිසා මානයෙන් හිස උදුම්මාගත් පුද්ගලයන් දෙදෙනෙකු ඇතුළත් වරණය වන්නේ,

i. සුනීත හා සෝපාක ය. ii. අග්ගික භාරද්වාජ හා සුන්දරික භාරද්වාජ ය.
iii. සච්චක හා බක ය. iv. අංගුලිමාල හා ආලවක ය.

10. ගරුක, ආසන්න, ආචිණ්ණ යන කර්ම නොමැති විට ප්‍රතිසන්ධි විපාක වුව ද ලබා දීමට සමත් වන්නේ,

i. උපස්ථම්භක කර්මය යි. ii. කටත්තා කර්මය යි.
iii. උපපීළක කර්මය යි. iv. අහෝසි කර්මය යි.

11. **"ථේරවාද හා මහායාන"** යනුවෙන් බෞද්ධ සම්ප්‍රදායයන් දෙකකි. ඉන් මහායානය ආරම්භ වන්නේ,

i. ප්‍රථම ධර්ම සංගායනාවෙන් පසුව ය. ii. දෙවන ධර්ම සංගායනාවෙන් පසුව ය.
iii. තෙවන ධර්ම සංගායනාවෙන් පසුව ය. iv. සිවුවන ධර්ම සංගායනාවෙන් පසුව ය.

12. සිගාලක සූත්‍රයෙහි දැක්වෙන සතර කර්මක්ලේශයට අයත් **නොවන්නේ,**

i. ප්‍රාණ ඝාතය යි. ii. කාම මිථ්‍යාචාරය යි.
iii. අදත්තාදානය යි. iv. සුරාමේරය යි.

13. බුදුරජාණන් වහන්සේ ඛේමාවන්ට ධර්මාවබෝධය ලබා දීම සඳහා භාවිත කළ උපක්‍රමය වන්නේ,

i. පටිපුච්ඡා ක්‍රමය යි. ii. දෘශ්‍යාධාර ක්‍රමය යි.
iii. අවවාද දීමේ ක්‍රමය යි. iv. කර්මස්ථාන දීමේ ක්‍රමය යි.

14. අනියත ශික්ෂා පද දෙකකි. එම ශික්ෂා පද පැනවීම සිදු වන්නේ ................................ භික්ෂුවගේ නොමනා හැසිරීම් හේතුවෙනි.

i. උදායි ii. සුදින්න
iii. ධනිය iv. ඡන්න

15. සැවැත් නුවර කෝක නම් සුනඛ වැද්දාගේ පාපකාරී ක්‍රියාව හේතුවෙන්………………යන ගාථාව මුල්කොට ද්වේශ කිරීමේ ආදීනව භික්ෂූන් අරඹයා දේශනා කළේ ය.

i. පාණිම්හි චෙ වණෝ නාස්ස ii. යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති
iii. වාණිජෝව භයං මග්ගං iv. න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ

16. **"ඒසෝහමස්මි, ඒතං මම, ඒසෝ මේ අත්තා"** යන දෘෂ්ටිය බිඳ දැමීමට බුදුදහම අනුගමනය කරන න්‍යාය වන්නේ,

i. පටිපුච්ඡා ක්‍රමය යි. ii. ඒකංස ව්‍යාකරණ ක්‍රමය යි.
iii. විභජ්ජවාද ක්‍රමය යි. iv. ඨපණීය ක්‍රමය යි.

17. සූත්‍ර පිටකයට අයත් අංගුත්තර නිකායේ අන්තර්ගත සූත්‍ර සංඛ්‍යාව වන්නේ,

i. තිස් හතරකි. ii. එකසිය පනස් දෙකකි.
iii. හත්දහස් හත්සිය හැට දෙකකි. iv. නවදහස් පන්සිය පනස් හතකි.

18. අභිධර්මාර්ථ සංග්‍රහයට අනුව, රූප ආකාර පහකට විභාග කොට දක්වා ඇත. ඉන් **"රූප සමුට්ඨාන"** යන්නෙහි නිවැරදි අදහස ඇතුළත් වරණය වන්නේ,

i. රූප පිළිබඳ සැකෙවින් විස්තර කිරීම. ii. රූප උපදවන හේතු ප්‍රත්‍ය දැක්වීම.
iii. රූප සමූහ වශයෙන් බැඳී සිටින ආකාරය දැක්වීම. iv. රූප පවතින පිළිවෙළ දැක්වීම.

19. සළායතන පිළිවෙළින් ඇතුළත් වරණය වන්නේ,

i. මනස, ඇස, කන, නාසය, දිව, ශරීරය. ii. ඇස, කන, නාසය, මනස, දිව, ශරීරය.
iii. ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස. iv. ඇස, කන, දිව, නාසය ශරීරය, මනස.

20. මෙලොව යම් කෙනෙකුට ජනප්‍රිය විය හැකි ආකාර ඉගැන්වෙන ධම්මපද ගාථාවකි. එය ඇතුළත් වරණය වන්නේ,

i. සීල දස්සන සම්පන්නං
ii. සහස්සම්පි වෙ ගාථා
iii. යෝ සහස්සං සහස්සේන
iv. යෝ වෙ ගාථා සතං භාසේ

21. නිෂ්පන්න රූප දහඅට අතරින් විෂය රූපයක් ඇතුළත් වරණය වන්නේ,
i. පඨවි
ii. ශබ්ද
iii. සෝත
iv. හෘදය වස්තුව

22. භික්ෂූන් උදෙසා කුටියක් ඉදිකිරීමේ දී, එම කුටිය **"ඇතුළත සුණු පිරියම් කළ"** යන අදහස දැක්වෙන වරණය වන්නේ,
i. උල්ලිත්තාවලිත්ත
ii. උල්ලිත්ත
iii. වල්ලිත්ත
iv. අවලිත්ත

23. බුදු දහමට අනුව නො කළ යුතු වෙළඳාම් පහකි. ඒ අතරින් සත්ත්ව වෙළඳාම දැක්වෙන නිවැරදි වරණය වන්නේ,
i. සත්ත වණිජ්ජා.
ii. මංස වණිජ්ජා.
iii. සත්ථ වණිජ්ජා.
iv. මජ්ජ වණිජ්ජා.

24. බුදුරජාණන් වහන්සේ වරක් දෙසූ සූත්‍රයක් ඒ ආකාරයෙන් ම නැවත නොදෙසති. එහෙත්, එය නැවත අසාගැනීමේ වරය ලැබුණේ.................................තෙරුන් වහන්සේට ය.
i. බහුශ්‍රැතයන් අතර අගතැන්පත් ආනන්ද
ii. ප්‍රඥාවන්තයන් අතර අගතැන්පත් සැරියුත්
iii. ඍද්ධිමතුන් අතර අගතැන්පත් මුගලන්
iv. විනයධරයන් අතර අගතැන්පත් උපාලි

25. පරාභව සූත්‍රයට අනුව පිරිහෙන පුද්ගලයෙකුගේ ලක්ෂණයක් වන **"අසන්තස්ස පියා හොන්ති"** යන්නෙහි අදහස වන්නේ,
i. සත් ධර්මය ප්‍රිය කරන බවයි.
ii. අසත් ධර්මය ප්‍රිය කරන බවයි.
iii. අසත් පුරුෂයන් ප්‍රිය කරන බවයි.
iv. සත් පුරුෂයන් ප්‍රිය කරන බවයි.

26. අනිෂ්පන්න රූප දහයට අයත් **ලක්ඛණ** රූප දැක්වෙන නිවැරදි පිළිතුර ඇතුළත් වරණය වන්නේ,
i. උපචය, සන්තති, ජරතා, අනිච්චතා
ii. චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා
iii. රූප, ශබ්ද, ගන්ධ, රස
iv. පඨවි, ආපෝ, තෙජෝ, වායෝ

27. මහා භූත රූප හතර අතරින් **"සැලෙන, ඉලිප්පෙන ගතිය සහ සෙසු රූපයන් නොවැටෙන සේ උසුලාගෙන සිටින"** ලක්ෂණ ඇති ධාතුව වන්නේ,
i. පඨවි ධාතුවයි.
ii. ආපෝ ධාතුවයි.
iii. තේජෝ ධාතුවයි.
iv. වායෝ ධාතුවයි.

28. බුදුරජාණන් වහන්සේලා වැනි **ශ්‍රේෂ්ඨ උත්තමයන්ගේ උපතේ දී, පිරිනිවීමේ දී** සිදුවන ආශ්චර්යමත් අද්භූත සිද්ධි ආදිය අයත් වන්නේ,
i. උතු නියාම ධර්මයට යි.
ii. චිත්ත නියාම ධර්මයට යි.
iii. ධම්ම නියාම ධර්මයට යි.
iv. කම්ම නියාම ධර්මයට යි.

29. සතර සංග්‍රහ වස්තු අනුපිළිවෙළට ඇතුළත් වරණය වන්නේ,
i. දානය, ප්‍රිය වචනය, සමානාත්මතාව, අර්ථ චරියාව
ii. ප්‍රිය වචනය, දානය, සමානාත්මතාව, අර්ථ චරියාව
iii. දානය, ප්‍රිය වචනය, අර්ථ චරියාව, සමානාත්මතාව
iv. අර්ථ චරියාව, දානය, ප්‍රිය වචනය, සමානාත්මතාව

30. මේ සසුනේ **ඛිප්පාභිඤ්ඤ හෙවත් ක්ෂණයකින්** ධර්මාවබෝධය කළ ඇත්තන් අතර අගතැන්පත් වූයේ,
i. අඤ්ඤාකොණ්ඩඤ්ඤ මහරහතන් වහන්සේ ය.
ii. සැරියුත් මහරහතන් වහන්සේ ය.
iii. අනුරුද්ධ මහරහතන් වහන්සේ ය.
iv. දාරුචීරිය මහරහතන් වහන්සේ ය.

31. කොසොල් රජතුමා විසින් ස්ත්‍රී, දැසි දසුන්, ඇතුන්, අසුන් සහ ගම්වර ද යන සියල්ල සතර බැගින් වූ **"සබ්බචතුක්ක"** නම් වූ ත්‍යාගය.......................... පිරිනැමූවේ ය.
i. වච්ඡගොත්ත බමුණාට
ii. කසී භාරද්වාජ බමුණාට
iii. ඒක සාටක බමුණාට
iv. අග්ගික භාරද්වාජ බමුණාට

32. මධුරත්ථවිලාසිනී අටුවාව, කංඛාවිතරණී අටුවාව, විමතිවිනෝදනී ටීකාව යන ග්‍රන්ථ රචනා කරන ලද කතුවරයන් වහන්සේලා පිළිවෙළින් ඇතුළත් වරණය වන්නේ,

i. චෝලිය කාශ්‍යප හිමි, බුද්ධඝෝෂ හිමි, බුද්ධදත්ත හිමි
ii. බුද්ධනාග හිමි, බුද්ධඝෝෂ හිමි, බුද්ධදත්ත හිමි
iii. බුද්ධදත්ත හිමි, බුද්ධඝෝෂ හිමි, චෝලිය කාශ්‍යප හිමි
iv. බුද්ධනාග හිමි, බුද්ධඝෝෂ හිමි, ධම්මපාල හිමි

33. බුදුරජාණන් වහන්සේගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ අතර **"ආයතපණ්හී හෝති"** නම් වූයේ,

i. ඕලු මුවන්ගේ බඳු කෙණ්ඩා ඇති බව ය.
ii. දික් විලුඹක් ඇති බව ය.
iii. දික් ඇඟිලි ඇති බව ය.
iv. සම සතළිස් දත් ඇති බව ය.

34. ශ්‍රී ලංකාවේ ඉදිකරන ලද ප්‍රථම ස්තූපය වන ථූපාරාම දාගැබෙහි තැන්පත් කොට ඇත්තේ,

i. බුදුරජාණන් වහන්සේගේ දකුණු අකු ධාතුව ය.
ii. බුදුරජාණන් වහන්සේගේ දකුණු දළදාව ය.
iii. බුදුරජාණන් වහන්සේගේ කේෂ ධාතූන් ය.
iv. බුදුරජාණන් වහන්සේගේ පාත්‍රා ධාතුව ය.

35. මහායාන ධර්මයෙහි ඉගැන්වෙන මූලික සූත්‍ර දහයකි. ඉන් එක් සූත්‍රයක් ඇතුළත් වරණය වන්නේ,

i. මහා කච්චානගොත්ත සූත්‍ර ය.
ii. සම්මාදිට්ඨි සූත්‍ර ය.
iii. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර ය.
iv. තේවිජ්ජගොත්ත සූත්‍ර ය.

36. මහා තණ්හාසංඛ්‍යා සූත්‍රයට අනුව සත්ත්වයාගේ නැවත උපත හෙවත් පුනර්භවයට සාධක තුනක් සම්පූර්ණ විය යුතුය. එම සාධක අතරට අයත් **නොවන** වරණය වන්නේ,

i. මව ඍතු වීම.
ii. මව්පිය සංවාසය.
iii. බ්‍රහ්මසහව්‍යතාව.
iv. ගන්ධබ්බයාගේ පැමිණීම.

37. පාලි භාෂාව මාධ්‍ය කරගත් බෞද්ධ ථේරවාදී සම්ප්‍රදාය පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය ඇතුළත් වරණය වන්නේ,

i. සම්බුද්ධත්වයෙන් පමණක් නිවන් අවබෝධ වන බව සලක යි.
ii. ඥාන මාර්ගය වැදගත් වන බව සලක යි.
iii. ක්ලේශාවරණ හා ඥාණාවරණ ක්ෂය කිරීම සිදුවන බව සලක යි.
iv. භක්ති මාර්ගය හා ඥාන මාර්ගය වැදගත් බව සලක යි.

38. අංගුත්තර නිකායේ පත්තකම්ම සූත්‍රයට අනුව තමා උපයන ධනය **"ආගන්තුකයින් වෙනුවෙන්"** වෙන් කිරීම හැඳින් වෙන්නේ,

i. ඤාතිබලි යනුවෙනි.
ii. පුබ්බපේත බලි යනුවෙනි.
iii. අතිථි බලි යනුවෙනි.
iv. රාජ බලි යනුවෙනි.

39. තථාගත දේශනාව තමන් වහන්සේ විසින් ම **"නවාංග සත්ථු ශාසනය"** වශයෙන් වර්ග කර ඇත. ඉන් සම්පූර්ණ අභිධර්ම පිටකයත්, ගාථා රහිත සූත්‍රත් සෙසු අංග අටට අයත් නොවන දේශනා ඇතුළත් වන්නේ,

i. ගෙය්‍යවලට ය.
ii. වෙය්‍යාකරණවලට ය.
iii. අබ්භූතධම්මවලට ය.
iv. වෙදල්ලවලට ය.

40. අධිමුක්තිය යනු පුද්ගලයාගේ විවිධ මානසික වූ රුචි අරුචිකම් හා අදහස් ය. ඒවා පිළිබඳ ඇති සැටියෙන් දැන ගන්නා තථාගත බලය වන්නේ,

i. නානාධිමුක්තික ඤාණය.
ii. ඣානාදීසංකිලේස ඤාණය.
iii. සබ්බත්ථගාමිනිපටිපදා ඤාණය.
iv. නානාධාතුපටිවේධ ඤාණය.

***********

[ සියලුම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

මධ්‍ය වාර පරීක්ෂණය - 2023
இரண்டாம் தவணைப் பரீட்சை - 2023
Mid Year Term Test - 2023

පැය තුනයි.

**ත්‍රිපිටක ධර්මය II** **විභාග අංකය : ...............................** **05 ශ්‍රේණිය**

**I කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද, II සහ III වන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ද, තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

## I - කොටස

**01.** පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. මානයේ ප්‍රභේද තුනකි. ඉන් **දෙකක්** නම් කරන්න.
ii. බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය ප්‍රකටවන අවස්ථා **හතරක්** නම් කරන්න.
iii. ෂට්අසාධාරණ ඥාණ අතරින් **හතරක්** නම් කරන්න.
iv. **"ලාජා දෙවඟනට"** එම නම ලැබුණේ කවර කරුණක් නිසා ද?
v. උපසපන් භික්ෂුවක විසින් ආරක්ෂා කළ යුතු ආපත්තිස්කන්ධ හතෙන් **හතරක්** නම් කරන්න.
vi. අභිධර්ම පිටකයට අයත් සප්තප්‍රකරණ අතරින් **හතරක්** නම් කරන්න.
vii. සිගාල සූත්‍රයට අනුව අනුප්පියභාණී මිතුරාගේ ලක්ෂණ **හතර** ලියන්න.
viii. සර්වඥයන් වහන්සේ සතු අෂ්ටාංග සමුපේත බ්‍රහ්මස්වර අතරින් **හතරක්** නම් කරන්න.
ix. සැරියුත් තෙරුන් අරහත් භාවයට පත් වූයේ කුමන සූත්‍ර දේශනාව ශ්‍රවණය කිරීමෙන් ද?
x. කුක්කුටමිත්ත භාර්යාවගේ සිත පිළිබඳව බුදුරජාණන් වහන්සේ ඇප වූයේ කුමන කරුණක් නිසා ද?

(ලකුණු 02 X 10 = 20)

## II - කොටස

02

i. තාදී ගුණය ප්‍රකට වන අවස්ථා **දෙකක්** බුද්ධ චරිතය ඇසුරින් ලියන්න.
ii. තාදී ගුණය පිළිබඳ පැහැදිලි කරන්න.
iii. සමාජ ගැටුම් නිරාකරණය සඳහා තාදී ගුණය ප්‍රගුණ කිරීමේ ඇති වැදගත්කම සමාජ උදාහරණ **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 02+03+5 = 10)

03

i. ප්‍රාග් මහින්ද යුගයේ ඇදහිලි හා විශ්වාස **දෙකක්** නම් කරන්න.
ii. ලක්දිව මෙහෙණ සසුනේ ආරම්භය හා විකාශය පිළිබඳ පැහැදිලි කරන්න.
iii. **"ලක්දිව සමාජ, ආර්ථික හා දේශපාලන පසුබිමෙහි හැරවුම් ලක්ෂයකි මහින්දාගමනය"** සකාරණව පැහැදිලි කරන්න.

(ලකුණු 02+03+5 = 10)

04

i. සතර පාරාජිකා නම් කරන්න.

ii. **"**මනුස්සවිග්ගහ පාරාජිකාපත්තිය**"** ලියන්න.

iii. භික්ෂුත්වය ආරක්ෂාකර ගැනීම සඳහා සතර පාරාජිකාවන්හි උපයෝගීතාව පැහැදිලි කරන්න.

(ලකුණු 02+03+5 = 10)

## III - කොටස

05.

i. පරාභව සූත්‍රයට අනුව පුද්ගලකුගේ පිරිහීමට හේතුවන කරුණු කීය ද?

ii. සිගාල සූත්‍රයේ සඳහන් පරිදි ගුරු සිසු සබඳතාවය පැහැදිලි කරන්න.

iii. **සුචරිතවත් සමාජයක් ගොඩනැගීමට** පරාභව සූත්‍රයෙන් වර්තමාන සමාජයට උගත හැකි පාඩම් පැහැදිලි කරන්න. (ලකුණු 02+03+5 = 10)

06.

i. **"පාපං චේ පුරිසෝ කයිරා"** යන ගාථාව සම්පූර්ණ කරන්න.

ii. එම ගාථාවේ අර්ථය පැහැදිලි කරන්න.

iii. **"කරන කලට පව් මීරිය මීසේ - විඳින කලට දුක් දැඩි වෙයි ගිනිසේ"** යන අදහස සමාජ සිදුවීම් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 02+03+5 = 10)

07.

i. කර්මය විපාක දෙන කාල **හතර** නම් කරන්න.

ii. **"හේතුං පටිච්ච සම්භූතං - හේතු භංගා නිරුජ්ඣති"** යන ගාථා පාඨයෙහි අර්ථය පැහැදිලි කරන්න.

iii. අංග දොළොසකින් යුතු පටිච්ච සමුප්පාදය අනුලෝම වශයෙන් විග්‍රහ කරන්න.

(ලකුණු 02+03+5 = 10)

***************

[ සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය / Ministry of Education - Division of Piriven Education / கல்வி அமைச்சு - சிறப்புக் கல்விப் பிரிவு

| 03 | S | I |
|---|---|---|

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2024

## 05 ශ්‍රේණිය

පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි

**අමතර කියවීම් කාලය ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛතාව දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

## (03) ත්‍රිපිටක ධර්මය - II

* **I කොටසේ ප්‍රශ්නය ද, II සහ III කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ද, තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

## I - කොටස

**01.** පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. අෂ්ටාංග සමුපේත බ්‍රහ්මස්වර අතරින් **හතරක්** නම් කරන්න.

ii. නවාංග සත්ථුසාසනය අතරින් **හතරක්** නම් කරන්න.

iii. අෂ්ට විද්‍යා අතරින් **හතරක්** නම් කරන්න.

iv. කුසලාකුසල කර්ම විපාක දීම වැළැක්විය හැකි අවස්ථා **හතර** නම් කරන්න.

v. අභිධර්මයේ රූප පරමාර්ථයට අයත් **උතුජ කලාප හතර** නම් කරන්න.

vi. **කර්මක්ලේශ හතර** නම් කරන්න.

vii. මහායාන දර්ශනයේ ඉගැන්වෙන මූලික සංකල්ප **හතරක්** ලියන්න.

viii. සප්ත අපරිහානීය ධර්ම අතරින් **හතරක්** නම් කරන්න.

ix. තාදී ගුණය ප්‍රකටවන අවස්ථා **හතරක්** බුද්ධචරිතය ඇසුරින් ලියන්න.

x. සැරියුත් මහරහතන් වහන්සේ ලද තනතුරු ලියන්න.

(ලකුණු 02 X 10 = 20)

## II - කොටස

**02.** i. අසහාය ශාස්තෘත්වය ප්‍රකට වන අවස්ථා **දෙකක්** බුද්ධ චරිතය ඇසුරින් ලියන්න.

ii. චතුර් වෛශාරද්‍ය ඥාන පිළිබඳ පැහැදිලි කරන්න.

iii. වර්තමාන සමාජ ගැටුම් අවම කිරීම සඳහා තාදී ගුණය ප්‍රගුණ කිරීමේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 02+03+5 = 10)

**03.** i. ඛේමා සහ උත්පලවණ්ණා මහරහත් තෙරණින් වහන්සේලා දෙනම ලද ශාසනික තනතුරු නම් කරන්න.

ii. මුගලන් මහරහතන් වහන්සේගේ ශාසනික සේවාව පැහැදිලි කරන්න.

iii. **සාර්ථක භික්ෂු ජීවිතයකට ගත හැකි ආදර්ශ අග්‍රශ්‍රාවක චරිත ඇසුරින්** විස්තර කරන්න.

(ලකුණු 02+03+5 = 10)

**04.** i.සප්ත ආපත්තිස්කන්ධ අතරින් දෙකක් නම් කරන්න.

ii. අදින්නාදාන පාරාජිකාපත්තිය ලියන්න.

iii.සතර පාරාජිකා හා සංඝාදිසේසාපත්ති අතර ඇති වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 02+03+5 = 10)

## III - කොටස

**05.** i. සිගාල සූත්‍රයේ දැක්වෙන ධනය විනාශ වන මුඛ හයෙන් **හතරක්** ලියන්න.

ii. පාපා මිත්‍ර වර්ජනයේ හා කල්‍යාණ මිත්‍ර සේවනයේ ඇති වෙනස පැහැදිලි කරන්න.

iii. **කුසලාකුසල පිළිගැනීම හා නො පිළිගැනීම පිළිබඳ** කාලාම සූත්‍රයේ දැක්වෙන සීමාවන් විස්තර කරන්න.

(ලකුණු 02+03+5 = 10)

**06.** i. **"සහස්සමපි චේ ගාථා"** යන ගාථාව සම්පූර්ණ කරන්න.

ii. එම ගාථාවේ අර්ථය ලියන්න.

iii.**"නිරර්ථක ජීවිතය නිසි මගට ගැනීමෙන් අර්ථ සම්පන්න ජීවිතයක් ගොඩනැගිය හැකි ය"** ධම්මපදයේ සහස්ස වග්ගයේ ගාථා අර්ථ ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 02+03+5 = 10)

**07.** i. කර්මය යනු කුමක් දැ යි පැහැදිලි කරන්න.

**ii. "තතෝ නං දුක්ඛමන්වේති - චක්කං ව වහතෝ පදං"** යන පාලි පාඨය විවරණය කරන්න.

**iii.** පටිච්ච සමුප්පාදය අර්ථ සහිත ව අනු පිළිවෙළින් ලියන්න.

(ලකුණු 02+03+5 = 10)

****

[ සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය / Ministry of Education - Division of Piriven Education / கல்வி அமைச்சு - சிறப்புக் கல்விப் பிரிவு

| 03 | S | I |
|---|---|---|

පැය එකයි

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2024

## 05 ශ්‍රේණිය

## (03) ත්‍රිපිටක ධර්මය

## ත්‍රිපිටක ධර්මය - I

**සැලකිය යුතුයි :**

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
- **එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.**

1. දෙතිස් මහාපුරුෂ ලක්ෂණ අතරින් **"සුවණ්ණවණ්ණො හොති"** යන්නෙහි සරල අර්ථය වන්නේ,
   1. සම සතළිස් දත් ඇති බව යි.
   2. සුදෝ සුදු දත් පෙළ ඇති බව යි.
   3. සම ව පිහිටි දත් ඇති බව යි.
   4. රන් බඳු පැහැ ඇති බව යි.

2. මානය පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය ඇතුළත් වරණය වන්නේ,
   1. අකුසලයන්ගෙන් එකකි.
   2. තමා පහත් කර සිතීම යි.
   3. අනුන්ට වඩා තමා උසස් යැ යි සිතීම යි.
   4. අනුන් හා තමා නිතර ම සමාන කරමින් සිතීම යි.

3. **"යම් හේතුවකින් උපදින යම් ධර්මයක් වේ ද, ඒ හේතුව තථාගතයන් වහන්සේ දේශනා කළහ. ඒවායේ යම් නිරෝධයක් වේ ද, එය ද වදාළහ. මහා ශ්‍රමණ තෙමේ මෙබඳු වාද ඇත්තේය."** මෙම සංවාදය සිදු වූයේ,
   1. අස්සජි තෙරණුවන් හා කෝලිත පිරිවැජියා අතර ය.
   2. අස්සජි තෙරණුවන් හා උපතිස්ස පිරිවැජියා අතර ය.
   3. අස්සජි තෙරණුවන් හා බාහියදාරුචීරිය පිරිවැජියා අතර ය.
   4. අස්සජි තෙරණුවන් හා සංජය පිරිවැජියා අතර ය.

4. මේථුනධම්ම, අදින්නාදාන, උත්තරිමනුස්සධම්ම යන පාරාජිකාපත්තීන්හි ආදි කම්මිකයෝ පිළිවෙළින් ඇතුළත් වරණය වන්නේ,
   1. ධනිය භික්ෂුව, සුදින්න භික්ෂුව, වග්ගුමුදා නදී තීරයේ භික්ෂූන්
   2. සුදින්න භික්ෂුව, වග්ගුමුදා නදී තීරයේ භික්ෂූන්, ධනිය භික්ෂුව
   3. සුදින්න භික්ෂුව, ධනිය භික්ෂුව, වග්ගුමුදා නදී තීරයේ භික්ෂූන්
   4. වග්ගුමුදා නදී තීරයේ භික්ෂූන්, සුදින්න භික්ෂුව, ධනිය භික්ෂුව

5. උභතෝ සංඝයා සඳහා පනවන ලද ශික්ෂා පද ඇතුළත් ග්‍රන්ථයක් වන්නේ,
   1. නිකාය සංග්‍රහය යි.
   2. සමන්තපාසාදිකාව යි.
   3. සාරාර්ථ සංග්‍රහය යි.
   4. ප්‍රාතිමෝක්ෂය යි.

6. කුසල් සිත පහත හෙළන බැවින් ද, ආර්ය මාර්ගය වළකන බැවින් ද, සිත මුළා වීමට හේතු වන බැවින් ද,
   1. ථුල්ලච්චය නම් වේ.
   2. දුක්කට නම් වේ.
   3. පාටිදේසනීය නම් වේ.
   4. පාචිත්තිය නම් වේ.

7. පරවාද පන්සියයක් මර්දනය හා සකවාද පන්සියයක් උද්දීපනය සඳහා මොග්ගලිපුත්තතිස්ස හිමියන් විසින් රචිත ග්‍රන්ථය වන්නේ,

1. විභංග ප්‍රකරණය යි.
2. ධම්මසංගණී ප්‍රකරණය යි.
3. ධාතු කථා ප්‍රකරණය යි.
4. කථාවත්ථු ප්‍රකරණය යි.

8. මිතුරා විසින් කරන කියන සියලු දෙය ම **"හොඳයි"** යැ යි අනුමත කරමින්, ඔහු සතුටු කිරීමට ක්‍රියා කරන මිත්‍ර ප්‍රතිරූපකයා .................... නම් වන්නේ ය.

1. අපාය සහාය
2. වචීපරම
3. අඤ්ඤදත්ථුහර
4. අනුප්පියභාණී

9. බුදුරජාණන් වහන්සේ විසින් සදිසා නමස්කාරය දේශනා කොට වදාළේ ....................... ගෘහපති පුත්‍රයාට ය.

1. සභිය
2. කෝලිත
3. සිගාල
4. දීඝජානුකෝලිය

10. ධම්මපදයේ දහසේ සංඛ්‍යාත්මක ප්‍රකාශන භාවිතයෙන් ධර්මෝපදේශ ඉදිරිපත් කර ඇති බැවින් ..................... වග්ගය නම් වේ.

1. යමක
2. සහස්ස
3. අප්පමාද
4. අරහන්ත

11. බුදුරජාණන් වහන්සේ විසින් **"මා භබ්බරූපතාය"** යනුවෙන් කාලාම සූත්‍රයේ දී දේශනා කරන ලද්දේ ................ නො පිළි ගත යුතු බව ය.

1. කටකතාවෙන් ඇසූ නිසා
2. මෙය මෙසේ විය හැකි යැ යි කියා
3. මෙය මෙසේ වූවා යැ යි කියා
4. න්‍යාය ධර්මයට ගැළපේ ය කියා

12. **"නේව දේවෝ න ගන්ධබ්බෝ, න මාරෝ සහ බ්‍රහ්මුණා**
**......................................, තථා රූපස්ස ජන්තුනො"** යන ගාථාවේ හිස් තැනට නිවැරදි ගාථා පාදය ඇතුළත් වරණය වන්නේ,

1. අනත්ථ පද සංහිතා
2. පුරිසෝ හෝති පණ්ඩිතෝ
3. පරදාර රූපං සේවනං
4. ජිතං අපජිතං කයිරා

13. බුදුරජාණන් වහන්සේ ප්‍රථම සංඝාදිසේසාපත්තිය පනවා වදාළේ .................. තෙරුන් අරබයා ය.

1. සුදින්න
2. සෙය්‍යසක
3. භද්දිය
4. නන්ද

14. **"ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති"** මෙහි වඩාත් නිවැරදි අර්ථය ඇතුළත් වරණය වන්නේ,

1. මෙය හට ගැනීමෙන් මෙය හට ගනී.
2. මෙය ඇති කල්හි මෙය වේ.
3. මෙය නැති කල්හි මෙය ඇති නො වේ.
4. මෙය නැති වීමෙන් මෙය නැති වේ.

15. නියාම ධර්ම පහ පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

1. උතු, බීජ, චිත්ත, ධම්ම, කම්ම
2. උතු, ධම්ම, කම්ම, චිත්ත, බීජ
3. උතු, චිත්ත, කම්ම, ධම්ම, බීජ
4. උතු, කම්ම, ධම්ම, බීජ, චිත්ත

16. මව්පිය සංවාසය, මවගේ ඍතු වීම හා ගන්ධබ්බයාගේ පැමිණීම යන කරුණු සත්වයාගේ පුනර්භවයට හේතු වන බව දැක්වෙන සූත්‍රයක් වන්නේ,

1. අං.නි නිබ්බේධික සූත්‍රය යි.
2. ම.නි චූල්ලකම්මවිභංග සූත්‍රය යි.
3. ම.නි මහාතණ්හාසංඛය සූත්‍රය යි.
4. ම.නි මහාකම්මවිභංග සූත්‍රය යි.

17. මිහිඳු මහරහතන් වහන්සේ විසින් ලක්දිවට බුදුදහම රැගෙන එන ලද්දේ ...................... ශත වර්ෂයේ දී ය.

1. ක්‍රි.පූ. 06 වන
2. ක්‍රි.පූ. 03 වන
3. ක්‍රි.පූ. 05වන
4. ක්‍රි.පූ. 04 වන

18. මිහිඳු මා හිමියන්ගේ වැඩම වීමෙන් පසු, ලක්දිව ඉදි කරන ලද ප්‍රථම ස්තූපය වන ථූපාරාම දාගැබෙහි තැන්පත් කරන ලද්දේ,

1. වාම අකු ධාතූන් වහන්සේ ය.
2. වාම දළදා ධාතූන් වහන්සේ ය.
3. ලාලට ධාතූන් වහන්සේ ය.
4. දකුණු අකු ධාතූන් වහන්සේ ය.

19. රාජ්‍ය පාලකයා විසින් බෞද්ධ ආර්ථික දේශපාලනය ක්‍රියාත්මක කිරීමේ දී,

1. සදාචාරාත්මක සමාජයක් බිහි වේ.
2. රාජ්‍යතාන්ත්‍රික අස්ථාවරත්වය ඇති වෙයි.
3. පාලකයා අත්තනෝමතික ව කටයුතු කරයි.
4. අවිචාරවත් ව කටයුතු කරයි.

20. ලක්ඛණ රූප හතරකි. ඉන් කර්මා දී හේතු නිසා රූපයන්ගේ ප්‍රථම හට ගැනීම ................ නම් වේ.

1. සන්තති
2. ජරතා
3. උපචය
4. අනිච්චතා

21. ධන විසර්ජනය, උපාර්ජනය, පරිභෝජනය, ආයෝජනය, බලි ප්‍රදානය හා තැන්පතු පිළිබඳ විග්‍රහය ඇතුළත් සූත්‍රයක් වන්නේ,

1. ව්‍යග්ඝපජ්ජ
2. පරාභව
3. සිගාලක
4. කාලාම

22. **අබ්භාන කර්මය, වත් සමාදානය හා මානත් පිරීම** යන විනය කර්ම සිදු කිරීමෙන් පාරිශුද්ධියට පත් විය හැකි ශික්ෂාවන්,

1. පාරාජිකා නම් වේ.
2. පාචිත්තිය නම් වේ.
3. සංඝාදිසේස නම් වේ.
4. පාටිදේසනීය නම් වේ.

23. අනියත ශික්ෂාපද පැනවීම සිදු කරන්නේ ................ අරබයා ය.

1. උදායි තෙරුන්
2. ධනිය තෙරුන්
3. ඡන්න තෙරුන්
4. සුදින්න තෙරුන්

24. මෛථුනධම්ම පරාජිකාවෙහි අනුපඤ්ඤත්තිය ඇතුළත් වරණය වන්නේ,

1. සික්ඛාසාජීව සමාපන්නෝ
2. අන්තමසෝ තිරච්ඡානගතායපි
3. මෙථුනධම්මං පතිසේවෙය්‍ය
4. සික්ඛං අපච්චක්ඛාය

25. පටිච්චසමුප්පාද සිද්ධාන්තයට අනුව භවය ඇති වීමට ආසන්න හේතුව ඇතුළත් වරණය වන්නේ,

1. උපාදානය යි.
2. ජාතිය යි.
3. තණ්හාව යි.
4. ඵස්සය යි.

26. අගසව් දෙනම අතරින් සැරියුත් මහ තෙරුන් රහත්භාවයට පත් වූයේ,

1. චක්ඛානුවත්ත සූත්‍රය ඇසීමෙනි
2. මාර තජ්ජනීය සූත්‍රය ඇසීමෙනි
3. වේදනා පරිග්ගහ (දීඝනඛ)සූත්‍රය ඇසීමෙනි
4. ධාතුම සූත්‍රය ඇසීමෙනි

27. විනය පිටකයෙහි උභතෝ විභංග නිවැරදි ව ඇතුළත් වරණය වන්නේ,

1. පාරාජික පාළි - පරිවාර පාළි
2. පාරාජික පාළි - චුල්ලවග්ග පාළි
3. පරාජික පාළි - මහා වග්ග පාළි
4. පාරාජික පාළි - පාචිත්තිය පාළි

28. සිගාලක සූත්‍රයෙහි අවේලාවේ වීථිසංචාරයෙහි ආදීනව හයක් දක්වා ඇත. ඉන් **"සංකියෝ ච හෝති පාපකේසු ඨානේසු"** යනුවෙන් දක්වා ඇත්තේ,

1. තමාගේ ම රැකවරණය නැති වීම ය.
2. තමාගේ අඹු දරුවන්ගේ ආරක්ෂාව නැති වීම ය.
3. තමාගේ ධනය රැකවරණය නැති වීම ය.
4. වැරදි අපරාධවලට සැකකරුවෙක් වීම ය.

29. අභිධර්මාර්ථ සංග්‍රහයේ දැක්වෙන රූප විග්‍රහයට අනුව රූප ප්‍රවෘත්ති ක්‍රම ලෙස සැලකෙන්නේ,

1. රූප උපදවන හේතු දැක්වීම ය.
2. රූප පවතින පිළිවෙළ පිළිබඳ දැක්වීම ය.
3. දක්වන ලද රූප නැවත බෙදා දැක්වීම ය.
4. රූප සමූහ වශයෙන් බැඳී සිටින අයුරු දැක්වීම ය.

30. කර්මය විපාක දෙන කාල වශයෙන් සතර ආකාර වේ. ඉන් උපපජ්ජවේදනීය කර්මය ලෙස සැලකෙන්නේ,

1. ක්‍රියාව කළ භවයේ දී විපාක දෙන කර්ම
2. ඕනෑ ම අවස්ථාවක විපාක දෙන කර්ම
3. ඊළඟ භවයේ දී විපාක දෙන කර්ම
4. විපාක නො දෙන කර්ම

31. සංයුත්ත නිකායේ ඇතුළත් සූත්‍ර සංඛ්‍යාව,

1. 34 යි
2. 240 යි
3. 7762 යි
4. 9557 යි

32. පහත A කොටසෙහි සඳහන් පාලි පදවලට ගැළපෙන අර්ථ B කොටසෙහි ඇතුළත් වේ. A කොටසෙහි පාලි පදවල පිළිවෙළ අනුව B කොටසෙහි නිසි අක්ෂර පිළිවෙළ සහිත වරණය තෝරන්න.

| A කොටස | B කොටස |
|---|---|
| අනභිජානං | A. ආර්ය පුද්ගලයන්ගේ ඥාණ දර්ශනය |
| අලමරියඤාණදස්සනං | B. මරණය සමාදන් කරවීම |
| සික්ඛං අපච්චක්ඛාය | C. තමා වෙත ඇති බවක් දක්නට නැති |
| මරණාය වා සමාදපෙයා | D. අධිසීල සංඛ්‍යාත ශික්ෂාව ප්‍රතික්ෂේප නො කොට |

1. B,A,C,D 2. D,C,A,B 3. C,A,D,B 4. A,C,D,B

33. ධම්මානු පස්සනා සතිපට්ඨානයට අයත් ප්‍රධාන කොටස් නිවැරදි ව ඇතුළත් වරණය වන්නේ,
1. රූපස්ඛන්ධය, වේදනාස්ඛන්ධය, සංඥාස්කන්ධය, සංස්කාරස්ඛන්ධය, විඥානස්ඛන්ධය
2. නීවරණ, ඛන්ධ, ආයතන, බොජ්ඣංග, සච්ච
3. සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි
4. ආනාපාන, ඉරියාපථ, සම්පජඤ්ඤ, පටික්කූල මනසිකාර, ධාතු මනසිකාර

34. බුදුරජාණන් වහන්සේගේ උපතේ දී හා පිරිනිවීමේ දී සිදු වන ආශ්චර්යවත් අද්භූත සිද්ධි ආදිය අයත් වන්නේ,
1. උතු නියාම ධර්මයට ය.
2. ධම්ම නියාම ධර්මයට ය.
3. චිත්ත නියාම ධර්මයට ය.
4. කම්ම නියාම ධර්මයට ය.

35. **"ථෙරවාද හා මහායාන"** යනු බෞද්ධ සම්ප්‍රදායයන් දෙකකි. ඉන් මහායාන සම්ප්‍රදාය ආරම්භ වන්නේ,
1. ප්‍රථම ධර්ම සංගායනාවෙන් පසුව ය.
2. තෙවන ධර්ම සංගායනාවෙන් පසුව ය.
3. දෙවන ධර්ම සංගායනාවෙන් පසුව ය.
4. සිව්වන ධර්ම සංගායනාවෙන් පසුව ය.

36. සත්ත්වයාගේ උප්පත්තිය සිදු වන ආකාර සතරකි. ඉන් **"ඕපපාතික උත්පත්තිය"** යනුවෙන් අදහස් වන්නේ,
1. බිජුවටින් හටගැනීම ය.
2. මාතෘ ගර්භයෙන් හටගැනීම ය.
3. ගහ කොළ පස් කසළවලින් හටගැනීම ය.
4. ඉබේ පහළ වීම ය.

37. **"හෙට්ඨිමා දිසා"** යනුවෙන් සිගාලක සූත්‍රයෙහි දක්වා ඇත්තේ ........... යුතුකම් හා වගකීම් ඉටු කිරීම පිළිබඳව ය.
1. මවුපිය දූ දරු
2. ස්වාමි සේවක
3. ගුරු ශිෂ්‍ය
4. හිත මිත්‍ර

38. මහායාන ධර්මයෙහි ඉගැන්වෙන සූත්‍ර දෙකක් නිවැරදි ව ඇතුළත් වරණය වන්නේ,
1. මහා සීහනාද සූත්‍රය හා මහා කච්චානගොත්ත සූත්‍රය
2. විමලකීර්ති සූත්‍රය හා සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය
3. සාමාධිරාජ සූත්‍රය හා සම්මාදිට්ඨි සූත්‍රය
4. තේවිජ්ජගොත්ත සූත්‍රය හා ලංකාවතරණ සූත්‍රය

39. පහත A කොටසෙහි සඳහන් පාලි පදවලට ගැළපෙන අර්ථ B කොටසෙහි ඇතුළත් වේ. A කොටසෙහි පාලි පදවල පිළිවෙළ අනුව B කොටසෙහි නිසි අක්ෂර පිළිවෙළ සහිත වරණය තෝරන්න.

| A කොටස | B කොටස |
|---|---|
| විස්සට්ඨතා | A. පැහැදිලි බව |
| සවණීයතා | B. අතර බිඳීම් නැති බව |
| අවසාරිතා | C. ශබ්දය පහසුවෙන් මුවින් පිට වන බව |
| බින්දුතා | D. සවනට සැප දෙන බව |

1. B,A,C,D 2. C,D,A,B 3. C,A,D,B 4. A,C,D,B

40. **"රෝගාදියෙන් ආතුර වූ දෙතිස් කුණුපයෙන් අපවිත්‍ර වූ මෙම ශරීරය දෙස බලන්න."** බුදුන් වහන්සේ මෙසේ දේශනා කළේ,
1. විශාකාවට ය.
2. උප්පලවණ්ණාට ය.
3. සුජාතාවට ය.
4. ඛේමාවට ය.

# ත්‍රිපිටක ධර්මය

## අවසාන වාර ප්‍රශ්න පත්‍ර - 5 ශ්‍රේණිය

# මූලික පිරිවෙන් අවසාන වාර පරීක්ෂණය - 2018

# Primary Piriven Year End Test - 2018

## ශ්‍රේණිය 05/Grade 05

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ත්‍රිපිටක ධර්මය -I
Thripitaka Dharmaya

කාලය : පැය එකයි
Time : One Hour

### ත්‍රිපිටක ධර්මය - I

01. වඩාත් නිවැරැදි පිළිතුර තෝරන්න. ඒ සඳහා ඔබට සපයා ඇති පිළිතුරු පත්‍රයේ උපදෙස්වලට අනුකූලව පිළිතුරු සපයන්න.

1. ''බ්‍රාහ්මණය මම දෙවියෙක් නම් දෙවියන් තුළ තිබිය යුතු කාමාදී ආශ්‍රවයන් මා තුළ තිබිය යුතුය. මනුෂ්‍යයෙක් නම් මනුෂ්‍යයන් තුළ තිබිය යුතු කාමාදී ආශ්‍රවයන් තිබිය යුතුය. එහෙත් මම එබඳු සත්ත්වයෙක් තුළ ඇති කාමාදී ආශ්‍රවයන් සහමුලින් ප්‍රහීන කළෙමි. බුදුරදුන් මෙම ප්‍රකාශ කළේ

   1. සොත්ථිය බමුණාට ය
   2. ද්‍රෝණ බමුණාට ය
   3. මාගන්ධි බමුණාට ය
   4. සච්චක බමුණාට ය

2. බුදු සිරුරේ දක්නට ලැබෙන දෙතිස්මහ පුරුෂ ලක්ෂණ අතරින් "සුඛුමච්ඡවි"යන්නේ දක්වෙන්නේ,

   1. දල්කවුළු වැනි අත්පා ඇති බව ය
   2. මනාව නැගුණු පිට මැද ඇති බව ය
   3. දිග් වූ ඇඟිලි ඇති බව ය
   4. දූවිලි නොරඳන සියුම් සම ඇති බව ය

3. ''අනේ මාව බේරාගන්නට කිසිවෙක් නැද්දැයි'' විලාප නගන්නට විය. මෙය කවුරුන් විසින් කියන ලද්දක්ද?

   1. රජ්ජුමාලා මෙහෙකාරිය විසින්
   2. බණ ඇසුමට ගොස් ආහාර ලැබූ දුප්පතා විසින්
   3. සෝපාක විසින්
   4. සුනීත සැඩොල් පුතු විසින්

4. උපතිස්ස කෝලිත දෙදෙනාගේ මුල්ම ගුරුවරයා වූයේ කවු ද?

   1. බුදුරදුන් ය
   2. නිඝන්ඨනාථ පුත්තය
   3. සංජය පිරිවැජියා ය
   4. අස්සජි තෙරණුවන් ය

5. පිප්ඵලී මානවකයා පැවිදි කිරීමෙන් පසු හඳුන්වනු ලැබූ ශාසනික නාමය

   1. සැරියුත් මහරහතන් වහන්සේ
   2. මොග්ගල්ලාන මහරහතන් වහන්සේ
   3. අනුරුද්ධ මහරහතන් වහන්සේ
   4. මහා කාශ්‍යප මහරහතන් වහන්සේ

6. නව අරහාදී බුදුගුණවල අරහං ගුණයෙන් කියවන අර්ථය

   1. දතයුතු සියල්ල දැනගත් බව යි
   2. කෙලෙසුන් කෙරෙන් දුරුවූ බව යි
   3. දමනය කළ යුත්තන් දමනය කළ බව යි
   4. සෝභන ගුණය ඇති බව යි

7. ''උඩඟු නොව මහණ, උඩඟු නොව මහණ යන ශ්‍රේෂ්ඨ වැකිය ලියා දොරටුවේ අලවා තිබූ යතිවරයන් වහන්සේ

   1. බලංගොඩ ආනන්ද මෛත්‍රී හිමියන් ය
   2. තොටගමුවේ රාහුල හිමියන් ය
   3. වැලිවිට අසරණ සරණ සිරි සරණංකර හිමියන් ය
   4. වීදාගම මෛත්‍රී හිමියන් ය

8. ථෙරවාදී බුදුදහමට අයත් විශිෂ්ටතම නිර්මාණ කෘතියක් වන "විශුද්ධි මාර්ගය" නම් ධර්ම ග්‍රන්ථය රචනා කරන ලද්දේ,

1. බුද්ධඝෝෂ මාහිමි ය 2. අශ්වඝෝෂ මාහිමි ය 3. බුද්ධදත්ත මාහිමි ය 4. ධම්මපාල මාහිමි ය

9. සිඟාලෝවාද සූත්‍රයේ දී ධනය විනාශ වන මුඛ හයක් දේශනා කර ඇත. ඊට අයත් නොවන ධන විනාශ දොරටුව වන්නේ,

1. නොකල්හි වීථි සංචාරය
2. අනලස් බව
3. ස්ත්‍රීන්ට ලොල්වීම
4. සුදුවට ලොල්වීම

10. බුදුදහමට අනුව පුද්ගලයාගේ සිතීම හා විමසීම ස්වාධීනව සිදු කිරීමට අවකාශ ලබාදෙන සූත්‍ර දේශනාව වන්නේ,

1. මහා පරිනිබ්බාන සූත්‍රය 2. බ්‍රහ්මජාල සූත්‍රය 3. පරාභව සූත්‍රය 4. කාලාම සූත්‍රය

11. පුද්ගලයාගේ මෙලොව දියුණුවට කරුණු දේශනා කරන ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි සමජීවිකතා යනුවෙන් දක්වන්නේ,

1. ධර්මානුකූලව හැසිරීම ය
2. ලද දෙයින් සතුටුවීම ය
3. අය වැය තුළනය කර ගැනීම ය
4. නිවැරදි ජීවන වෘත්තීන් හි යෙදීම ය

12. විපාක ලබා දෙන කාලය අනුව කර්මය,

1. දෙයාකාර වේ 2. සිව් ආකාර වේ 3. සය ආකාර වේ 4. නව ආකාර වේ

13. ධනිය කුටිකාර නම් භික්ෂුව ආදිකම්මිකයා වූයේ කවර පාරාජිකාපත්තියට ද?

1. අදත්තාදාන පාරාජිකාපත්තියට
2. මෙථුනධම්ම පරාජිකාපත්තියට
3. උත්තරි මනුස්සධම්ම පාරාජිකාපත්තියට
4. මනුස්ස විග්ගහ පාරාජිකාපත්තියට

14. තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් නොවන්නේ,

1. සුසිල්වත් මහණුන් සසුනෙන් නෙරපීම
2. කථාවත්ථුප්‍රකරණය රචනාකොට අභිධර්ම පිටකය සැකසීම
3. දස අකැප වස්තු ප්‍රතික්ෂේප වීම
4. සාසනික පිළිවෙත් නැවත ආරම්භ කිරීම

15. "ලස්සනට පිපුණු මල් ඇති සල් ගසක් මුල අසමසම රූ ඇති ඔබ හුදකලාව සිටින්නීය, ඔබට සල්ලාල ධූර්තයන් පිළිබඳ බියක් නැද්ද? යනුවෙන් කීවේ කා හට ද?

1. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියට ය
2. යසෝදරා තෙරණියට ය
3. භද්දකච්චානා තෙරණියට ය
4. උප්පලවණ්ණා තෙරණියට ය

16. "සිංහලයෙනි නැගිටිව් බුද්ධගයාව බේරාගනිවු" යන ආදර්ශ පාඨය ප්‍රකාශකරන ලද්දේ,

1. අනගාරික ධර්මපාලතුමා
2. වලිසිංහ හරිශ්චන්ද්‍රතුමා
3. හෙන්රි ස්ටිල් ඕල්කට්තුමා
4. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

17. පළමුවන ධර්ම සංඝායනාවෙන් පසු සංයුක්ත නිකාය පවත්වාගෙන යාම සඳහා වගකීම් පැවරුණු මහ රහතන් වහන්සේ,

1. සැරියුත් මහ රහතන් වහන්සේ
2. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ
3. ආනන්ද මහ රහතන් වහන්සේ
4. අනුරුද්ධ මහ රහතන් වහන්සේ

18. අභිධර්ම පිටකය සම්පූර්ණ කරමින් අවසානයට සම්පාදනය වූ ප්‍රකරණ ග්‍රන්ථය,

1. ධාතු කතා ප්‍රකරණය
2. යමක ප්‍රකරණය
3. පට්ඨාන ප්‍රකරණය
4. කථාවත්ථු ප්‍රකරණය

19. මහායානයේ මූලික ඉගැන්වීමක් නොවන්නේ,

1. දසභූමි සංකල්පය 2. පාරමිතා සංකල්පය 3. අරහත් සංකල්පය 4. බෝධි චිත්ත සංකල්පය

20. රාග චරිතයට වඩාත් ම ගැලපෙන කමටහන වන්නේ,

1. කායගතාසතිය 2. ආනාපානසතිය 3. මරණානුස්සතිය 4. දේවතානුස්සතිය

21 'අකුසලය සුළුය විපාක නොදේ යැයි අවමන් නොකළ යුතුය' මෙම අදහස දක්වෙන ධම්මපද ගාථාවේ මුල්ම පද පේළිය වන්නේ,

1. භද්‍රොපි පස්සති පාපං
2. පාපොපි පස්සති භද්‍රං
3. පාපං චෙ පුරිසො කයිරා
4. මාප්පමඤ්ඤෙථ පාපස්ස

22. සුමංගල විලාසිනි අටුවා ග්‍රන්ථය රචනා කරන ලද්දේ,

1. අංගුත්තර නිකායට ය
2. දීඝ නිකායට ය
3. ඛුද්දක නිකායට ය
4. සංයුක්ත නිකායට ය

23. සතර සංග්‍රහවස්තුව පිළිවෙළින් සඳහන් වන වරණය වන්නේ,

1. දානය, ප්‍රියවචනය, සමානාත්මතාව, අර්ථ චරියාව
2. දානය, අර්ථචරියාව, සමානාත්මතාව, ප්‍රියවචනය
3. දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව, සමානාත්මතාව
4. දානය, අර්ථචරියාව, ප්‍රියවචනය, සමානාත්මතාව

24. බෞද්ධ රාජ්‍ය පාලනය පිළිබඳව උපදෙස් සපයන සූත්‍ර දේශනාවක් ලෙස සැලකිය හැක්කේ,

1. චක්කවත්ති සීහනාද සූත්‍රය 2. මහාසීහනාද සූත්‍රය 3. සාමඤ්ඤඵල සූත්‍රය 4. දේවදූත සූත්‍රය

25. අභිධර්මයේ රූප කාණ්ඩයට අනුව උපාදාය රූප,

1. විසිතුනකි 2. විසිහතරකි 3. විසිපහකි 4. විසිඅටකි

26. සතර සතිපට්ඨානය අනුපිළිවෙළට ඇති වරණය වන්නේ,

1. කායානුපස්සනා, වේදනානුපස්සනා, ධම්මානුපස්සනා, චිත්තානුපස්සනා
2. කායානුපස්සනා, ධම්මානුපස්සනා, වේදනානුපස්සනා, ධම්මානුපස්සනා
3. කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා
4. කායානුපස්සනා, ධම්මානුපස්සනා, චිත්තානුපස්සනා, වේදනානුපස්සනා

27. බෝසතාණන් වහන්සේ සාරාසංඛ කල්ප ලක්ෂයක් පාරමිදම් පුරා අවසන පහළ වූයේ,

1. තුසිත දෙව්ලොව ය
2. යාමය දෙව්ලොව ය
3. චාතුර්මහාරාජික දෙව්ලොව ය
4. පරනිම්මිත වසවත්ති දෙව්ලොව ය

28. "කම්මස්සකා මානවසත්තා, කම්මදායාදා, කම්මයොනි, කම්ම බන්ධු, කම්ම පටිසරණා," යන සූත්‍ර පාඨය ඇතුළත් වන්නේ,

1. නිබ්බේධික සූත්‍රය
2. අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය
3. මහා තණ්හාසංඛය සූත්‍රය
4. චූල්ලකම්ම විභංග සූත්‍රය

29. ථෙරවාදී බුද්ධශාසනයේ උන්නතියට ක්‍රියාකළ ධර්මාශෝක මහාධිරාජයා ධර්මය උගත්තේ,

1. උපගුප්ත මහරහතන් වහන්සේගෙනි
2. මොග්ගලීපුත්ත මහරහතන් වහන්සේගෙනි
3. සුමන සාමණේරයන් වහන්සේගෙනි
4. නිග්‍රෝධ සාමණේරයන් වහන්සේගෙනි

30. සත්ත්වයාගේ නැවත උපත හෙවත් පුනර්භවයට සාධක තුනක් සම්පූර්ණ විය යුතු බව මහා තණ්හාසංඛය සූත්‍රයේ දක්වේ. එම සාධක අතරට අයත් නොවන්නේ මින්,

1. මව්පිය සංවාසය
2. මවගේ සෘතුවීම
3. විඤ්ඤාණයාගේ බැහැරවීම
4 ගන්ධබ්බයාගේ බැහැරවීම

31. අචේල කස්සප සූත්‍රයේ එන අචේල කස්සප විසින් බුදුරදුන්ගෙන් විමසන ලද "සයං කතං ච පරං කතං ච" යන්නෙහි අර්ථය වන්නේ,

1. දුක තමා සහ අනුන් විසින් කරන ලද්දකි
2. දුක තමා විසින් කරන ලද්දකි
3. දුක අනුන් විසින් කරන ලද්දකි
4. දුක තමන් විසින් සහ අනුන් විසින් නොකරන ලද්දකි

32. පංචබලි සංකල්පයට අනුව පුබ්බපේත බලි යන්නෙන් අර්ථවත් වන්නේ,

1. රජය වෙනුවෙන් කරන දීමනාව යි
2. ඥාති මිත්‍රාදීන් වෙනුවෙන් කරන දීමනාව යි
3. ආගන්තුකයන් වෙනුවෙන් කරන දීමනාව යි
4. මියගිය ඥාතීන් වෙනුවෙන් කරන දීමනාව යි

33. උපසපන් භික්ෂූන් වහන්සේ නමක් පෙරවස් සමාදන් විය යුත්තේ,

1. බිනර පොහෝ දිනයේ ය
2. වප් පොහෝ දිනයේ ය
3. ඇසළ පොහෝ දිනයේ ය
4. නිකිණි පොහෝ දිනයේ ය

34. පරාභව සූත්‍රයේ සඳහන් "අසතං ධම්මං රොචෙති" යන්නෙහි අර්ථය,

1. අසත් පුරුෂයන් ප්‍රිය කරයි
2. අසත් ධර්මය ප්‍රිය කරයි
3. සත් පුරුෂයන් ප්‍රිය කරයි
4. සත් පුරුෂයන් ප්‍රිය නොකරයි

35. ලෝකය සත්ත්වයා යැයි කියනු ලබන ස්කන්ධ ධර්මයේ යථාර්ථය වන අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ඛණ ධර්මය ප්‍රත්‍යක්ෂ වශයෙන් දැන සිදු කරන භාවනාව හඳුන්වන්නේ,

1. විදර්ශනා භාවනාව යි
2. මෛත්‍රී භාවනාව යි
3. සමථ භාවනාව යි
4. අසුභ භාවනාව යි

36. බුද්ධකාලීන ෂඩ් ශාස්තෘවරු අතර පරම අවිහිංසාවාදය ප්‍රකට කළ ශාස්තෘවරයා,

1. මක්ඛලි ගෝසාල ය
2. පකුධ කච්චායන ය
3. සංජය බෙල්ලට්ඨි පුත්ත ය
4. නිගණ්ඨනාථ පුත්ත ය

37. උභතො විභංගයට අයත් ග්‍රන්ථ දෙක නිවැරදිව දක්වා ඇති වරණය වන්නේ,

1. පාරාජිකා පාළි, පරිවාර පාළි
2. පාරාජිකා පාළි, මහාවග්ග පාළි
3. පාරාජිකා පාළි, පාචිත්තිය පාළි
4. පාරාජිකා පාළි, චුල්ලවග්ග පාළි

38. පහත සඳහන් ප්‍රකාශයන් හි දැක්වෙන්නේ මූලික පිරිවෙන් අවසාන ශ්‍රේණියේ ශිෂ්‍යයෙකු විසින් ධම්ම පදය පිළිබඳ කරන ලද ප්‍රකාශනයන් ය. එම ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. ඛුද්දක නිකායේ දෙවන පොත යි ගාථා 423කි
2. ඛුද්දක නිකායේ පළමුවන පොත යි ගාථා 423කි
3. ඛුද්දක නිකායේ තෙවන පොත යි ගාථා 423කි
4. ඛුද්දක නිකායේ පසළොස්වන පොත යි ගාථා 423කි

39. මිතුරු වෙසින් සිටින අමිත්‍රයෙකි,

1. උපකාරක මිත්‍රයා
2. සමාන සුඛදුක්ඛ මිත්‍රයා
3. අනුප්පියභාණි මිත්‍රයා
4. අනුකම්පක මිත්‍රයා

40. "අන්‍ය ආගම්වල ගිහියන්ට ද පැවිද්දන්ට ද ගරු කළ යුතුය. යමෙක් අන්‍ය ආගමකට ගරහත් නම් නින්දා කරන්නේ නම් ඔහු තම ආගමට ගරහන්නෙකි. නින්දා කරන්නෙකි". යන ප්‍රකාශය ඇතුළත් සෙල්ලිපිය කරවූයේ,

1. මහසෙන් රජු ය
2. කණිෂ්ක රජු ය
3. දෙවන පැතිස් රජු ය
4. ධර්මාශෝක රජුය

(01 × 40 = 40)

# මූලික පිරිවෙන් අවසාන වාර පරීක්ෂණය - 2018

# Primary Piriven Year End Test - 2018

## ශ්‍රේණිය 05/Grade 05

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ත්‍රිපිටක ධර්මය - II
Thripitaka Dharmaya - II

කාලය : පැය තුනයි
Time : Three Hours

### ත්‍රිපිටක ධර්මය - II

I කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද, II කොටසින් තෝරාගත් ප්‍රශ්න හතරකට ද පිළිතුරු සපයන්න.

1. පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. බුදුරජාණන් වහන්සේගේ වාග් විලාසයෙහි විශේෂතා සතරක් නම් කරන්න.
ii. බුදුරජාණන් වහන්සේ අසරණ සරණ වීමේ දී භාවිත කළ ප්‍රායෝගික උපක්‍රම හතරක් නම් කරන්න.
iii. මුගලන් මහරහතන් වහන්සේ විසින් සිදුකරන ලද විශේෂ කාර්යයන් හතරක් ලියන්න.
iv. බුද්ධඝෝෂ මාහිමියන් විසින් රචනා කරන ලද අටුවා ග්‍රන්ථ හතරක් නම් කරන්න.
v. මනුස්ස විග්ගහ, ථෙය්‍ය සංඛාතං අසංවාසො, උත්තරී මනුස්සධම්මං, යන පදයන්හි අර්ථ ලියන්න.
vi. විනය පිටකයට අයත් ග්‍රන්ථ පහකි. ඉන් සතරක් ලියන්න.
vii. මත්ද්‍රව්‍ය පානයෙහි ආදීනව හතරක් ලියන්න.
viii. පරාභව සූත්‍රයේ සඳහන් පිරිහීමේ දොරටු සතරක් ලියන්න.
ix. සතර සතිපට්ඨානය නම් කරන්න.
x. ථෙරවාදී බුදුදහම පැතිරී ඇති රටවල් හතරක් නම් කරන්න.

(ලකුණු. 2×10=20)

### II කොටස

2. i. බුදුරජාණන් වහන්සේ සතු ෂඩ් අසාධාරණඥාණ අතුරින් හතරක් නම් කරන්න.
ii. බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා සමාපත්තිඥාණය පිළිබඳ පැහැදිලි කරන්න.
iii. බුදුරජාණන් වහන්සේගේ උත්තරීතර සමාජ දාර්ශනිකත්වය උදාහරණ සහිතව පහදන්න.

(ලකුණු. 2+3+5=10)

3. i. භික්ෂුවක් උදෙසා කුටියක් ඉදිකරන භූමියෙහි නොතිබිය යුතු උපද්‍රව දහයකි. ඉන් හතරක් ලියන්න.
ii. මනුස්ස විග්ගහ පාරාජිකාපත්තිය ලියා දක්වන්න.
iii. සතර පාරාජිකා ආරක්ෂා කිරීමෙන් භික්ෂුවගේ දෙලොව අභිවෘද්ධිය සැලසේ. මෙම ප්‍රකාශය විස්තර කරන්න.

(ලකුණු. 2+3+5=10)

4. i. අභිධර්මයෙහි රූප පරමාර්ථයේ විසය රූප හතර නම් කරන්න.
ii. සෝපධිශේෂ නිර්වාණය හා අනුපාධිශේෂ නිර්වාණය පැහැදිලි කරන්න.
iii. සම්මා සම්බුද්ධත්වය හා පච්චේක බුද්ධත්වය අතර ඇති වෙනස පහදන්න.

(ලකුණු. 2+3+5=10)

5. i. යමෙක් පිළිගැනීමට එකම පදනම නොවිය යුතු කරුණු දහයක් කාලාම සූත්‍රයේ දැක්වේ. ඉන් හතරක් ලියන්න.
ii. කාලාම සූත්‍රයෙහි නිදාන කථාව ලියා දක්වන්න.
iii. ''කාලාම සූත්‍රය නිවැරදිව තීරණ ගැනීමට මගපෙන්වන ඉගැන්වීමකි''යන කියමන පැහැදිලි කරන්න.

(ලකුණු. 2+3+5=10)

6. i. සහස්සම්පි චෙ ගාථා.....
යො චෙ වස්සසතං ජන්තුං.... යන ගාථා සම්පූර්ණ කරන්න.

ii. ඉහත ගාථා දෙකෙහි අර්ථ ලියන්න.

iii. ''පාපයෙහි ඇති බිහිසුණු බවත් පිනෙහි ඇති අසිරිමත් බවත්'' ධම්ම පදයේ පාප වග්ගයෙන් දේශනා කර ඇත. පාපවග්ගය ඇසුරෙන් මෙම ප්‍රකාශය උදාහරණ සහිතව පහදන්න.

(ලකුණු. 2+3+5=10)

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2019

## Primary Piriven final Year Test - 2019

5 වසර /Grade 5

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**ත්‍රිපිටක ධර්මය I**
**Thripitaka dhamma I**

කාලය : පැය එකයි
Time : One hour

විභාග අංකය : ......................................

**සැලකිය යුතුයි**

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 ප්‍රශ්නවලට දී ඇති (i) (ii) (iii) (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න. (මෙම කොටස සඳහා ලකුණු 40ක් හිමි වේ.)
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

01. සත්ත්වයාගේ හා ලෝකයේ යථා තත්ත්වය මැනවින් වටහා ගත් බුදුරදුන් සියලු ධර්මයන් සිය නුවණින් ම අවබෝධ කරගත් බැවින්
    (i) සම්මා සම්බුද්ධ වන සේක. (ii) විජ්ජාචරණ සම්පන්න වන සේක.
    (iii) සුගත වන සේක. (iv) ලෝකවිදූ වන සේක.

02. දිනක් උක්කට්ඨා නුවර සිට සේතව්‍ය නුවර දක්වා වඩින බුදුරජාණන් වහන්සේගේ පා සටහන් දැක එළඹ සංවාදයක නිරත වූයේ
    (ii) සොත්ථිය බමුණා ය. (ii) ද්‍රෝණ බමුණා ය.
    (iii) උදය බමුණා ය. (iv) කසීභාරද්වාජ බමුණා ය.

03. මහා සීහනාද සූත්‍රයට අනුව බුදුරදුන්ගේ ඥාන බල කොපමණ ද?
    (i) අටකි. (ii) දහයකි (iii) දොළහකි (iv) හයකි

04. ගිහිගෙය හැරගිය උපතිස්ස කෝලිත දෙදෙනාට පළමුව මුණගැසුනේ ෂට් ශාස්තෲවරුන්ගෙන් කෙනෙකු වූ
    (i) මක්ඛලීගෝසාල පිරිවැජියා ය. (ii) පකුධකච්චායන පිරිවැජියා ය.
    (iii) අජිත කේශකම්බල පිරිවැජියා ය. (iv) සංජය පිරිවැජියා ය.

05. 'මරණ භයින් තැතිගෙන 'අනේ මාව බේර ගන්නට කිසිවෙක් නැද්දැ'යි විලාප නගන්නට විය.' මෙය කවුරුන් විසින් කළ විලාපයක් ද?
    (i) රජ්ජුමාලා මෙහෙකාරිය විසින් ය. (ii) සුනීත සැඩොල් පුතු විසින් ය.
    (iii) සෝපාක දරුවා විසින් ය. (iv) බණ ඇසීමට ගොස් අහර ලැබූ දුප්පතා විසින් ය.

06. බුද්ධඝෝෂ හිමියන් උපත ලැබුවේ දඹදිව බෝමැඩට නුදුරු ඝෝෂ නම් ග්‍රාමයේ
    (i) බමුණු කුලයක ය. (ii) රාජ කුලයක ය.
    (iii) සැඩොල් කුලයක ය. (iv) සිටු කුලයක ය.

07. බුද්ධඝෝෂ මාහිමියන් ලක්දිවට වැඩමවූයේ අනුරාධපුරය රාජධානිය කරගත්
    (i) දුටුගැමුණු රජු දවස ය. (ii) ධාතුසේන රජු දවස ය.
    (iii) මහානාම රජු දවස (iv) සද්ධාතිස්ස රජු දවස ය.

08. හේතුඵල දහම හෙවත් පටිච්චසමුප්පාදය කී වැදෑරුම් ද?
    (i) දසවැදෑරුම් ය. (ii) දොළොස් වැදෑරුම් ය.
    (iii) දහසය වැදෑරුම් ය. (iv) එකොළොස් වැදෑරුම් ය.

09. අභිධර්ම පිටකය සම්පූර්ණ කරමින් අවසානයට සම්පාදනය වූ ප්‍රකරණ ග්‍රන්ථය වනුයේ

(i) ධාතුකථා ප්‍රකරණය (ii) යමක ප්‍රකරණය

(iii) පට්ඨාන ප්‍රකරණය (iv) කථාවත්ථු ප්‍රකරණය

10. "මහරජ තොප අභිෂේක ලත් පළමු වස තුළදී ම මවිසින් මහණ බමුණන්ට තෘණකාෂ්ඨෝදක දෙන ලද්දේ ය. කැමති පරිදි පරිභෝග කෙරෙත්වා යි පවරණ ලද්දේ ය." යැයි කියමන කවුරුන් විසින් කියන ලද්දක් ද?

(i) ධනිය කම්කාර හිමියන් ය. (ii) උදායි හිමියන් ය.

(iii) උපාලි හිමියන් ය. (iv) සුදින්න හිමියන් ය.

11. "**අනාපත්තිං ආපත්තීති දීපෙන්ති**" යන පාලි පාඨයේ අර්ථය වන්නේ

(i) අධර්ම ධර්මය යැයි දක්වති. (ii) විනය විනය යැයි දක්වති.

(iii) ඇවැත් නොවන්නක් ඇවැත් යැයි දක්වති. (iv) ඇවැතක් ඇවැත් නොවේ යැයි දක්වති.

12. බුදුරජාණන් වහන්සේ පළමු අනියත සිකපදය පැනවූයේ කුමන ආරාමයෙහි වෙසෙන සමයක ද?

(i) වේළුවනාරාමයේ දී ය. (ii) ඝෝෂිතාරාමයේ දී ය.

(iii) පූර්වාරාමයේ දී ය. (iv) ජේතවනාරාමයේ දී ය.

13. විනය පිටකයෙහි ඛන්ධක විනයට අයත් ග්‍රන්ථ දෙක නිවැරදිව දක්වා ඇති වර්ණය වන්නේ

(i) පාරාජිකා පාළි - පරිවාරපාළි (ii) මහාවග්ගපාළි - චුල්ලවග්ගපාළි

(iii) පාරාජිකා පාළි - පාචිත්තිය පාළි (iv) පාරාජිකා පාළි - චුල්ලවග්ග පාළි

14. ආසවට්ඨානීය ධර්මය පහළවීමත් සමඟ විනය නීති පැනවීමේ අවශ්‍යතාව මතු විය. එම ආසවට්ඨානීය ධර්මයන්ට අයත් නොවන්නේ

(i) වේපුල්ල මහත්තතා (ii) ලාභග්ග මහත්තතා

(iii) පාරිසජ්ජ මහත්තතා (iv) බාහුසච්ච මහත්තතා

15. මහා සතිපට්ඨාන සූත්‍රය ඇතුළත් නිකාය ග්‍රන්ථය වන්නේ

(iii) මජ්ඣිම නිකාය (ii) දීඝ නිකාය (iii) සංයුත්ත නිකාය (iv) ඛුද්දක නිකාය

16. භෝග අපාය මුඛ හයෙහි ඇතුළත් "**සන්දිට්ඨිකා ධනඤ්ජානි**" යන්නෙහි අර්ථය වන්නේ

(i) බලා සිටිය දී ම ධනය විනාශ වීම. (ii) රෝගයන්ට ආකාරයක් වීම.

(iii) කලකෝලාහල වැඩිවීම. (iv) විලිබිය නැති ව හැසිරීම.

17. පුද්ගලයා පිරිහීමට පත් කරන සතර අගතියට අයත් වන්නේ

(i) දුක (ii) වේදනාව (iii) තරහ (iv) මෝහ

18. නිතරම අනුන්ගෙන් යැපීමට උත්සාහ දරන්නෙකු ලෙස පෙනී සිටින මිතුරා

(i) වචීපරම ය. (ii) අඤ්ඤදත්ථහර ය. (iii) අනුප්පියභාණී ය. (iv) අපායසහාය ය.

19. "**දියුණුවන්නා පහසුවෙන් දත හැකි ය**" මෙය ඇතුළත් පාලි වර්ණය වන්නේ

(i) අසන්තස්ස පියා හොන්ති (ii) සන්තේ නකුරුතේ පියං

(iii) ධම්ම කාමෝ භවං හොති (iv) සුවිජානෝ භවං හෝති

20. කුඩා දරුවකු තරුණ බවට පත්වන්නේත් තරුණයකු මහලු බවට පත්වන්නේත්

(i) වායෝ ධාතුව නිසා ය. (ii) පඨවි ධාතුව නිසා ය.

(iii) තේජෝ ධාතුව නිසා ය. (iv) ආපෝ ධාතුව නිසා ය.

21. පටිච්චසමුප්පාද දේශනාවෙන් ප්‍රතික්ෂේප වන කරුණු හතරක් ඇතුළත් සූත්‍රයකි.
(i) මහා නිධාන සූත්‍රය (ii) අචේලකස්සප සූත්‍රය (iii) සල්ලේඛ සූත්‍රය (iv) නිබ්බෙධික සූත්‍රය

22. විනය නීති පැණවීමේ අපේක්ෂා දහයක් පාරාජිකා පාළියේ දක්වේ. එහි **"දුම්මංකූනං පුග්ගලානං නිග්ගහාය"** යනුවෙන් සඳහන් වන්නේ
(i) සංඝයාගේ යහපත් පිණිස බව යි (ii) දුස්සීල පුද්ගලයින්ට නිග්‍රහ පිණිසයි
(iii) ශික්ෂාකාමී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිස (iv) පැහැදුණු පුද්ගලයින්ගේ වැඩි ප්‍රසාදය පිණිස යි.

23. බුදුරජාණන් වහන්සේට වැඩ සිටීමට තමන් වහන්සේගේ සිනිඳු පට සිවුර නවා ආසනයක් සකස් කළේ
(i) කාශ්‍යප මහරහතන් වහන්සේ ය. (ii) සැරියුත් මහරහතන් වහන්සේ ය.
(iii) ආනන්ද මහරහතන් වහන්සේ ය. (iv) බක්කුල මහරහතන් වහන්සේ ය.

24. පරම විඥානාර්ථ බෞද්ධ සංගමය හා එක්ව "සරසවි සඳරැස" නම් පුවත්පත ඇරඹීමට ප්‍රධානත්වය ගත්තේ
(i) හෙන්රි ස්ටීල් ඕල්කොට්තුමා ය. (ii) බ්ලැවැට්ස්කි මැතිනිය ය.
(iii) අනගාරික ධර්මපාලතුමා ය. (iv) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් ය.

25. බුදුරදුන්ට මග්ගවිදූ, මග්ගකෝවිදූ, මග්ගඤ්ඤූ වැනි පද භාවිතා කරන්නේ උන්වහන්සේ ......... නිසා ය.
(i) මාර්ගෝපදේශකයෙකු (ii) සත්‍ය කියා දෙන්නෙකු
(iii) නිවන් මගට පත් කරන්නකු (iv) කරුණාව දක්වන්නෙකු

26. බුදුරදුන්ගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන් අතුරින් **'උස්සඞ්ඛපාදෝ හෝති'** යනුවෙන් දක්වන්නේ
(i) දික් විලුඹ ඇතියහ. (ii) ඉහළින් පිහිටි ගොප් ඇටය ඇතියහ.
(iii) දැල් කවුළු වැනි අත්පා ඇතියහ. (iv) රන් බඳු පැහැ ඇතියහ.

27. ප්‍රථම ධර්ම සංගායනාවට හේතු වූ කාරණාවක් නොවන්නේ
(i) දෙව්දත් තෙරුන්ගේ පසද්වවරය (ii) කොසැඹෑ නුවර ධර්ම-විනය භික්ෂූන් අතර ගැටුළුව
(iii) භික්ෂූන් විවිධ නිකායවලට බෙදී සිටීම (iv) සුභද්‍ර භික්ෂුවගේ අභද්‍ර වචනය

28. බුදුරජාණන් වහන්සේ සූකරකත ලෙනේ දී දීඝනඛ පිරිවැජියාට දේශනා කළ වේදනා පරිග්ගහ සූත්‍රය අසා රහත් වූයේ
(i) මුගලන් තෙරුන් ය. (ii) සැරියුත් තෙරුන් ය.
(ii) උපාලි තෙරුන් ය. (iv) මහාකාශ්‍යප තෙරුන් ය.

29. දෙවෙනි ධර්ම සංගායනාවෙන් පසු බෙදී ගිය අටළොස් නිකාය අතර ථේරිය නිකායට අයත් වන්නේ
(i) ගෝකුලික ය. (ii) බාහුලික ය.
(iii) චේතිය වාදී ය. (iv) මහිංසාසක ය.

30. බුදුරදුන්ට සමකාලීනව භාරතයේ විසූ ශාස්තෘවරු සය දෙනෙකු පිළිබඳ තොරතුරු දක්නට ලැබේ. එයින් ඔවුන්ගේ ඉගැන්වීම් හා ලොව පවතින විවිධ මත ඇතුළත් සූත්‍රයක් වන්නේ
(i) සාමඤ්ඤඵල සූත්‍රය (ii) බ්‍රහ්මජාල සූත්‍රය
(iii) මහා සකුළුදායී සූත්‍රය (iv) අපණ්ණක සූත්‍රය

31. "සාරත්ථ මඤ්ජුසා" අටුවාව සඳහා ලියන ලද ටීකාව වන්නේ
(i) අංගුත්තර නිකාය ටීකාව (ii) උභය ප්‍රාතිමෝක්ෂ ටීකාව
(iii) සීලක්කන්ධ වග්ග ටීකාව (iv) දීඝනිකාය ටීකාව

32. අභිධර්මයෙහි සඳහන්, චෛතසිකයන්ගේ ප්‍රධාන ලක්ෂණයකි.

(i) වේදනාව ය. (ii) ඒකුප්පාද ය. (ii) මනසිකාර ය. (iv) ඒකාග්‍රතාව ය.

33. සෝපාදිසේස නිර්වාණය ප්‍රත්‍යක්ෂ කරගත හැකි ආකාර

(i) දෙකකි (ii) හතරකි (iii) තුනකි (iv) පහකි

34. "සියල්ලෝම ජීවිතයට ප්‍රිය වෙති" මෙම අර්ථය දැක්වෙන පාලි ගාථා පාදය කුමක් ද?

(i) සබ්බේ භායන්ති මච්චුනෝ (ii) සබ්බේ තසන්ති දණ්ඩස්ස

(iii) සුඛ කාමානි භූතානි (iv) සබ්බේසං ජීවිතං පියං

35. දැහැමි පාලනයක් උදෙසා බුදුරජාණන් වහන්සේ විසින් නිර්දේශිත ප්‍රතිපත්තිමය ඉගැන්වීම් අතර වඩාත් නොගැලපෙන පිළිතුර වන්නේ

(i) දස රාජ ධර්ම ය. (ii) දස සක්විති වත් ය.

(iii) දස සීලය ය. (iv) සප්ත අපරිහානි ධර්මය ය.

36. සතර ඍද්ධිපාද පිළිවෙලින් ඇති වරණය

(i) වීමංසා, විරිය, චිත්ත, ඡන්ද (ii) ඡන්ද, චිත්ත, විරිය, වීමංසා

(iii) විරිය, වීමංසා, චිත්ත, ඡන්ද (iv) ඡන්ද, විරිය, චිත්ත, වීමංසා

37. භික්ෂු විනයෙහි සංඝාදිසේස ආපත්ති ගණන කොපමණ ද?

(i) තිහකි (ii) හැත්තෑපහකි (iii) දහතුනකි (iv) සතරකි

38. බෞද්ධ භාවනාවේ, රාග චරිතයාට ගැලපෙන කමටහනකි.

(i) බ්‍රහ්ම විහාර සතර, වර්ණ කසිණ සතර

(ii) දස අසුභ, කායගතාසතිය

(iii) මරණානුස්සති, උපසමානුස්සති

(iv) බුද්ධ, ධම්ම, සංඝ, සීල

39. තමන්ට හෝ අනුන්ට හෝ තමන්ටත් අනුන්ටත් යන දෙපක්ෂයට ම හානියක් වේ නම් එය අකුසලයකි. මෙම අදහස අන්තර්ගතව ඇත්තේ

(i) චූල්ලකම්මවිභංග සූත්‍රය (ii) අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය

(iii) සකුළුදායි සූත්‍රය (iv) නිබ්බේධික සූත්‍රය

40. **"රාජවරිතය"** නැමැති ග්‍රන්ථය රචනා කළ යතිවරයාණන් වහන්සේ

(i) හික්කඩුවේ සුමංගල නාහිමි ය. (ii) රේරුකානේ චන්දවිමල නාහිමි ය.

(iii) රත්මලානේ ධම්මාලෝක නාහිමි ය. (iv) හේන්පිටගෙදර ඤාණසීහ නාහිමි ය.

*****

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2019

## Primary Piriven final Year Test - 2019

5 වසර / Grade 5

### ත්‍රිපිටක ධර්මය II

**Thripitaka Dhamma II**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

කාලය : පැය තුනයි
Time : Three hours

විභාග අංකය : ..............................................

I කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද II සහ III කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් ද තෝරාගෙන ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සැපයිය යුතුයි.

1. පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. අංගුත්තර නිකායේ පංචක නිපාතයේ කකුධ සූත්‍රයේ සඳහන් පරිදි ලොව ශාස්තෘවරු වර්ග පහකි. ඉන් සතර දෙනෙකු නම් කරන්න.

ii. ෂඩ් අසාධාරණ ඤාන අතුරෙන් හතරක් නම් කරන්න.

iii. සැරියුත් මහරහතන් වහන්සේගේ විශිෂ්ට ගුණ සමුදායන් සතරක් ලියන්න.

iv. සරණංකර සංඝරාජ මාහිමියන්ගේ ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ අතරින් සතරක් නම් කරන්න.

v. මිනිසකු මරණයට පත්කරමි යි හෝ මරවමි යි යන චේතනාව ඇති ඇතිවූ විට, අංග පහක් සම්පූර්ණ වීමෙන් උපසම්පදා භික්ෂුවක් මනුස්ස විග්ගහ පාරාජිකාවට පත් වේ. එම අංග පහෙන් සතරක් ලියන්න.

vi. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි සඳහන් පරලොවට හිත සුව පවත්නා කරුණු සතර නම් කරන්න.

vii. විසය රූප සතර නම් කරන්න.

viii. මහායාන සංකල්පයේ එන දසභූමි ඉගැන්වීම් අතරින් සතරක් ලියන්න.

ix. කර්මය විපාක දීමේ දී ලබාදෙන්නා වූ විපාක (කෘත්‍ය) අනුව සතරාකාරය නම් කරන්න.

x. දෙවන ධර්ම සංගායනාව, පැවැත්වූ ස්ථානය, ප්‍රධානත්වය, දායකත්වය සහ සහභාගී වූ පිරිස යන ඒවා ලියා දක්වන්න.

(ලකුණු 2 x 10 = 20)

## II කොටස

2. i. බුදුරජාණන් වහන්සේ සතු දසබල ඤාණ අතරින් හතරක් නම් කරන්න.

ii. තථාගතයන් වහන්සේගේ කාය බලය පිළිබඳ පැහැදිලි කරන්න.

iii. බුදුරජාණන් වහන්සේ අසරණයින්ට සරණ වීමේ උතුම් මානව ගුණ ප්‍රකට කිරීමේ දී භාවිත කළ ප්‍රායෝගික ක්‍රම උදාහරණ සහිතව පහදන්න.

(ලකුණු 2+3+5=10)

3. i. 'සංඝාදිසේස ගරුකාපත්තිය' කෙටියෙන් හඳුන්වන්න.

ii. කාය සංසග්ග සංඝාදිසේසාපත්තිය ලියා දක්වන්න.

iii. එම සංඝාදිසේසාපත්තියේ තේරුම හා එය පැනවීමට හේතු වූ නිදාන ලියන්න. (ලකුණු 2+3+5=10)

## III කොටස

4\. i. ඛේමා උප්පලවණ්ණා තෙරණින් වහන්සේලා ලැබූ අග තනතුරු මොනවාද?

ii. අග්‍රශ්‍රාවිකා තෙරණින් වහන්සේලාගේ චරිතාදර්ශ කෙටියෙන් පහදන්න.

iii. අටුවාචාර්ය බුද්ධඝෝෂ මාහිමියන් ථේරවාදී බුදු සසුනේ දීර්ඝකාලීන නිර්මල පැවැත්ම වෙනුවෙන් සිදුකළ සුවිශාල මෙහෙවර අගයන්න.

(ලකුණු 2+3+5=10)

5\. i. ආපත්තිභය සූත්‍රයට අනුව සතරාකාර ආපත්තිභය නම් කරන්න.

ii. 'නිසි ලෙස ගිහිගෙයි වසන්නට සමත් ගිහියා දැහැමින් භවභෝග සම්පත් රැස්කොට ජීවිකාව ජයගත යුතු ය.' සිඟාලෝවාද සූත්‍රය ඇසුරින් පැහැදිලි කරන්න.

iii. පුද්ගල ජීවිතයක පරාභවයට හේතු දන නිවැරදි ජීවිතයක් ගතකිරීමට පරාභව සූත්‍රයෙන් ගත හැකි ආදර්ශ විස්තර කරන්න.

(ලකුණු 2+3+5=10)

6\. i. සහස්සම්පි චේ වාචා ..........

අභිප්පරේථ කල්‍යාණේ .... යන ගාථා සම්පූර්ණ කරන්න.

ii. ඉහත ගාථාවල අර්ථ ලියා දක්වන්න.

iii. ඔබ දඬුවමට යම් සේ බිය වන්නේ ද අනුන් ද එසේ ම බිය දක්වන්නේ ය. මෙය ධම්මපදය දණ්ඩ වග්ගයේ අදාළ ගාථා ඇසුරින් විවරණය කරන්න.

(ලකුණු 2+3+5=10)

7\. i. උප්පත්ති වර්ග හතර නම් කරන්න.

ii. රූප සමුට්ඨානය නම් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

iii. නිර්වාණයෙහි අවස්ථා දෙක ලියා සෝවාන්වීමේ දී නැතිවී යන සංයෝජන පිළිබඳ විග්‍රහයක් කරන්න.

(ලකුණු 2+3+5=10)

## II කොටස

01.

I. බුදුරජාණන් වහන්සේගේ අන්තිම බුද්ධ වචනය ලියා දක්වන්න.

II. ආනන්තරිය පාපකර්ම කළ දෙදෙනකු නම් කොට ඔවුන් කළ එම පාපකර්ම විස්තර කරන්න.

(ලකුණු 6 + 6 = 12)

02.

I. i. ඵෙණූපමං කායමිමං විදිත්වා .............

ii. දූරංගමං එකචරං ..............

iii. න පුප්ඵ ගන්ධො පටිවාතමෙති .............

iv. කුම්භූපමං කායමිමං විදිත්වා .......... යන ගාථාවලින් දෙකක් සම්පූර්ණ කරන්න.

II. ඔබ ලියූ එක් ගාථාවක නිදාන කතාව ලියන්න.

(ලකුණු 8+4=12)

03.

I. සක්මන් කිරීමෙන් ලැබෙන ආනිසංස පහ ලියා ඉන් එකක් හඳුන්වන්න.

II. නිරෝගී ජීවිතයක් ගත කිරීම සඳහා බුදු දහමේ ඉගැන්වීම් යොදා ගත හැකි ආකාරය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(ලකුණු 5+7=12)

04.

I. **න හි සො උපක්කමො අත්ථි** යන ගාථාව සම්පූර්ණ කරන්න.

II. පෙළ පොතෙහි ඇති ධර්ම කරුණු ඇතුළත් කරමින් කෙටි අනිත්‍ය ප්‍රතිසංයුක්ත ධර්ම දේශනාවක් සකස් කරන්න.

(ලකුණු 4+8=12)

## III කොටස

05.

I. බ්‍රාහ්මණ වර්ණ ධර්මයන්ට අනුව වෛශ්‍යයන්ට අයත් ස්වධර්ම සියල්ල නම් කරන්න.

II. බ්‍රාහ්මණ ඉගැන්වීමෙහි දක්වෙන ආශ්‍රම ධර්ම පිළිබඳ විස්තරයක් කරන්න.

(ලකුණු 5+7=12)

06.

I. **ඉදං ඛො පන භික්ඛවේ දුක්ඛ සමුදයං අරියසච්චං** යන මේ පාඨය සම්පූර්ණ කරන්න.

II. දුක්ඛ සමුදය ආර්ය සත්‍ය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(ලකුණු 5+7=12)

07.

I. නිවන් මග අවුරන පංචනීවරණ ධර්ම නම් කර ඉන් එකක් හඳුන්වන්න.

II. පිළිකුල් භාවනාව වඩන අයුරු විස්තර කරන්න.

(ලකුණු 5+7=15)

08.

I. අභිධර්මයේ සතර පරමාර්ථ ධර්ම කෙටියෙන් විස්තර කරන්න.

II. ලෝභ මූලික සිත් අට පිළිවෙලින් ලියන්න.

(ලකුණු 5+7=12)

****

| | |
|---|---|
| (සියලු ම හිමිකම් ඇවිරිණි)<br>(All Rights Reserved) | **මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2020**<br>Primary Piriven Year End Test - 2020<br>5 ශ්‍රේණිය / Grade 5 |

ත්‍රිපිටක ධර්මය I — කාලය : පැය එක යි

Thipitaka Dhamma I — විභාග අංකය :- ................ — Time : One hours

**සැලකිය යුතු යි**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති (i) (ii) (iii) (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න. (මෙම කොටස සඳහා ලකුණු 40 ක් හිමි වේ.)
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

01. සීලාදි ගුණ දහමින් තමන් වහන්සේට වඩා උසස් කෙනෙකු නොමැති හෙයින් බුදුරජාණන් වහන්සේ උතුම් වූ ශ්‍රී සද්ධර්මය ගුරු තන්හි තබා කටයුතු කිරීමට අධිෂ්ඨාන කරන ලද්දේ බුද්ධත්වයෙන්
(i) සත්වන සතිය රාජායතන කිරිපලු රුක් සෙවණේ දී ය.
(ii) හයවන සතිය අජපාල නුගරුක් සෙවණේ දී ය.
(iii) පළමුවන සතිය ශ්‍රී මහාබෝධි සෙවණේ දී ය.
(iv) හතරවන සතිය රුවන් ගෙයි වැඩසිටිය දී ය.

02. බුදුරජාණන් වහන්සේ වේරංජාවේ සත්වන වස් කාලය සම්බන්ධ වැරදි ප්‍රකාශය ඇතුළත් වරණය තෝරන්න.
(i) උදය බමුණාට වස් ආරාධනාව අමතක වීම.
(ii) පුරා මාස තුනක් දුර්භික්ෂයක් වේරංජාවෙහි පැවතීම.
(iii) ඍද්ධිමතුන් වහන්සේලා වෙනත් ප්‍රදේශවලින් ගෙන්න ලද ආහාර වැළඳීම.
(iv) යව හාලින් කළ ආහාර වැළඳීමට සිදු වීම.

03. මාගන්දිය බමුණා තම දියණිය ස්වර්ණාභරණයෙන් සරසා බුදුරජාණන් වහන්සේ වෙත පැමිණවූයේ,
(i) ධර්මය ශ්‍රවණය කරවීමට ය. (ii) දෝෂාරෝපණය කරවීමට ය.
(iii) බුදුරදුන්ගේ සුන්දර රුව පෙන්වීමට ය. (iv) විවාහ කර දීමට ය.

04. බුදුරදුන්ගේ අෂ්ටාංග සමුපේත බ්‍රහ්මස්වරයෙහි "නින්නාදිතා" යන්නෙන් කියැවෙන්නේ,
(i) පිරිස කෙළවර සිටින අයට පවා ඇසෙන බව යි.
(ii) අදහස වහා අවබෝධ වන බව යි.
(iii) ශබ්දය පහසුවෙන් මුවින් පිටවන බව යි.
(iv) අතර බිඳීම් නොමැති බව යි.

05. බුදුරජාණන් වහන්සේගේ දසබල ඥානයෙහි එන "නානාධිමුත්තික ඥානයෙන්" ප්‍රකට වන්නේ,
(i) ශ්‍රද්ධාදී ඉන්ද්‍රියන්ගේ වැඩීමේ ප්‍රමාණයන් දැනීමේ හැකියාව යි.
(ii) තමන්ගේ අතීත පරම්පරා පිළිබඳ දැනීමේ හැකියාව යි.
(iii) පුද්ගලයන්ගේ මානසික රුචි අරුචිකම් ගැනීමේ හැකියාව යි.
(iv) හේතු අහේතු ඇති සැටියෙන් දන්නා හැකියාව යි.

06. බුදුරජාණන් වහන්සේ සතු සංඛත වූ ද අසංඛත වූ ද සියලු ධර්ම සමූහය නිරවශේෂ කොට දක්නා ඥානය වන්නේ,
(i) අනාවරණ ඥානය යි. (ii) ආසයානුසය ඥානය යි.
(iii) ඉන්ද්‍රියපරෝපරියත්ත ඥානය යි. (iv) සබ්බඤ්ඤුත ඥානය යි.

07. "රජෝ හරණං රජෝ හරණං" යනුවෙන් පවසමින් ඒ අනුව සිත මෙහෙයවා මහ රහත් බවට පත් වූයේ,
(i) මහා පන්ථක හිමියන් ය. (ii) චුල්ලපන්ථක හිමියන් ය.
(iii) නන්ද හිමියන් ය. (iv) තිස්ස හිමියන් ය.

08. සම්බුද්ධ ශාසනයේ ප්‍රඥාවන්ත භික්ෂූන් අතර අග්‍රස්ථානයට පත් වූයේ,
(i) සැරියුත් මහරහතන් වහන්සේ ය. (ii) මුගලන් මහරහතන් වහන්සේ ය.
(iii) අනුරුද්ධ මහරහතන් වහන්සේ ය. (iv) උපාලි මහරහතන් වහන්සේ ය.

09. පහන් දැල්ල නිමිති වශයෙන් ගෙන තේජෝ කසිණය අරමුණු කොට ධ්‍යාන උපදවා අරහත් ඵලයට පත් අග්‍රශ්‍රාවිකා වහන්සේ කවුරුන් ද?
(i) උප්පලවණ්ණා තෙරණිය යි. (ii) ඛේමා තෙරණිය යි.
(iii) කිසාගෝතමී තෙරණිය යි. (iv) පටාචාරා තෙරණිය යි.

10. වැලිවිට සරණංකර හිමියන්ට සියම් දේශයෙන් උපසම්පදාව ගෙන ඒම සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දුන්නේ,
(i) වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා ය. (ii) ශ්‍රී විජය රාජසිංහ රජතුමා ය.
(iii) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා ය. (iv) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා ය.

11. අටුවාචාරී බුද්ධඝෝෂ හිමියන් විසින් සමන්තපාසාදිකා අටුවාව ලියන ලද්දේ,
(i) දීඝනිකාය සඳහා ය. (ii) විනය පිටකය සඳහා ය.
(iii) අභිධර්ම පිටකය සඳහා ය. (iv) ඛුද්දකනිකාය සඳහා ය.

12. බුදුරජාණන් වහන්සේ ධනිය ස්ථවිරයන් වහන්සේ අරමුණු කොට දෙවන පාරාජිකා ශික්ෂාව පනවා වදාළේ,
(i) සියදිවි නසා ගැනීමක් හේතු කොට ගෙන ය.
(ii) නොදුන් දෙයක් ගැනීම හේතු කොට ගෙන ය.
(iii) නැති ගුණ ප්‍රකාශ කිරීමක් හේතු කොට ගෙන ය.
(iv) මෛථුන ක්‍රියාවක් හේතු කොට ගෙන ය.

13. පාරිශුද්ධිය ලබා ගත හැකි ආපත්ති අතුරින් බරපතල ම ආපත්තිය ලෙස සැලකෙන්නේ,
(i) පාරාජිකා ආපත්තිය යි. (ii) අනියත ආපත්තිය යි.
(iii) පාචිත්තිය ආපත්තිය යි. (iv) සංඝාදිසේස ආපත්තිය යි.

14. සතර කර්ම ක්ලේශයන්ට අයත් නොවන්නේ,
(i) සුරාමේරය යි. (ii) කාමමිථ්‍යාචාරය යි.
(iii) ප්‍රාණඝාතයයි. (iv) මුසාවාදය යි.

15. භෝග අපාය මුඛ අතර ඇති අවේලාවේ වීථි සංචාරයෙහි ආදීනව සඳහන් වන තැන **"සාපතෙය්‍යම්පිස්ස අගුත්තො අරක්ඛිතං හොති"** යනුවෙන් සඳහන් වන්නේ,
(i) තමාගේ ම රැකවරණය නැති වෙයි යන්න යි.
(ii) ඔහුගේ ධනයේ ද රැකවරණය නැති වෙයි යන්න යි.
(iii) අඹුදරුවන්ගේ ද රැකවරණය නැති වෙයි යන්න යි.
(iv) වැරදි අපරාධවලට සැකකරුවෙකු වෙයි යන්න යි.

16. සූත්‍ර පිටකයට අයත් ප්‍රමුඛ දේශනාවක් වන **බ්‍රහ්මජාල සූත්‍රය** අයත් වන්නේ,
(i) මජ්ඣිම නිකායට ය. (ii) අංගුත්තර නිකායට ය.
(iii) සංයුත්ත නිකායට ය. (iv) දීඝ නිකායට ය.

17. අනාගතයෙහි ලැබෙන්නට ඇති දේ ගැන කියමින් මග හැර එම මොහොතේ උපකාර නොකරන මිත්‍රයා,
(i) වචීපරම නම් වේ. (ii) අඤ්ඤදත්ථුහර නම් වේ.
(iii) අනුප්පියභාණී නම් වේ. (iv) අපායසහාය නම් වේ.

18. පරාභව සූත්‍රයේ සඳහන් පිරිහීමේ දොරටු අතර "දියුණු වන්නා පහසුවෙන් දත හැකි ය. පිරිහෙන්නා ද පහසුවෙන් දත හැකි ය." යන අර්ථය කියැවෙන ගාථාර්ධය වන්නේ,
(i) අසන්තස්ස පියා හෝන්ති - සන්තේ න කුරුතේ පියං
(ii) සුවිජානො භවං හෝති - සුවිජානෝ පරාභවෝ
(iii) පහූත වින්තො පුරිසො - සහිරඤ්ඤෝ සභෝජනො
(iv) ඉත්ථී සොණ්ඩිං විකිරණිං - පුරිසං වාපි තාදිසං

19. අභිධර්මයේ රූප විග්‍රහයේ විසය රූප නිවැරදි ව දක්වා ඇති වරණය වන්නේ,
(i) රූප, ශබ්ද, ගන්ධ, රස ය. (ii) පඨවි, ආපෝ, තේජෝ, වායෝ ය.
(iii) කම්ම, චිත්ත, උතු, ආහාර ය. (iv) උපචය, සන්තති, ජරතා, අනිච්චතා ය.

20. අභිධර්මයේ සඳහන් උපාදාය රූප එනමින් හැඳින්වෙන්නේ,
(i) සිත ඇසුරු කොට සිත හා දැඩි ව බැඳී පවතින බැවිනි.
(ii) පංච ඉන්ද්‍රිය ඇසුරු කොට එය හා දැඩි ව බැඳී පවතින බැවිනි.
(iii) සතර මහා භූත රූප ඇසුරුකොට ඒ හා දැඩි ව බැඳී පවතින බැවිනි.
(iv) සිතිවිලි ඇසුරුකොට සිතිවිලි හා දැඩි ව බැඳී පවතින බැවිනි.

21. බුදු, පසේබුදු, මහරහත් යනු තුන්තරා බෝධිය යි. ඉන් පසේ බුදුරජාණන් වහන්සේ සතු ව
(i) සර්වඥතා ඥානය හා බලයන් හා වසී භාවය ඇත.
(ii) සර්වඥතා ඥානය ඇත. බලයන් හා වසී භාවය නැත.
(iii) සර්වඥතා ඥානය නැත. බලයන් හා වසී භාවය ඇත.
(iv) සර්වඥතා ඥානය හෝ බලයන් හා වසී භාවය හෝ නැත.

22. බුදුරජාණන් වහන්සේ **බහුපුත්තිකා තෙරණින් වහන්සේ** අරමුණු කොට දේශනා කළ ගාථාවෙහි මුල් අර්ධය වන්නේ,
(i) යෝ චේ වස්සසතං ජීවේ - අපස්සං අමතං පදං
(ii) යෝ චේ වස්සසතං ජීවේ - අපස්සං ධම්මමුත්තමං
(iii) යෝ චේ වස්සසතං ජීවේ - කුසීතො හීනවීරියං
(iv) යෝ චේ වස්සසතං ජීවේ - අපස්සං උදයව්‍යයං

23. **සිව්පිළිසිඹියා පත්වීම, අභිඥාලාභී වීම** වැනි අතිරේක ඥාණයන් ලබා ගත හැක්කේ,
(i) විදර්ශනාවෙන් පමණක් රහත් වූ උතුමන්ට ය.
(ii) සමථය වඩා විදර්ශනාවෙන් රහත් වූ උතුමන්ට ය.
(iii) ඥානයකින් රහත් වූ උතුමන්ට ය.
(iv) සසර පුරුදු ඇති රහත් උතුමන්ට ය.

24. විදර්ශනා භාවනාව හෙවත් විපස්සනා භාවනාව හඳුන්වන තවත් නාමයක් වන්නේ,
(i) ඉන්ද්‍රිය භාවනාව යි. (ii) පුඤ්ඤ භාවනාව යි.
(iii) සමාධි භාවනාව යි. (iv) අසුභ භාවනාව යි.

25. සතර සතිපට්ඨානය අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
(i) කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා
(ii) කායානුපස්සනා, චිත්තානුපස්සනා, වේදනානුපස්සනා, ධම්මානුපස්සනා
(iii) කායානුපස්සනා, ධම්මානුපස්සනා, චිත්තානුපස්සනා, වේදනානුපස්සනා
(iv) කායානුපස්සනා, වේදනානුපස්සනා, ධම්මානුපස්සනා, චිත්තානුපස්සනා

26. කායානුපස්සනා සතිපට්ඨානයෙහි එන **පටික්කූලමනසිකාරය** මගින් සිදු කරන්නේ,
(i) හුස්ම ඉහළට ගැනීම හා පහළට හෙළීම අරමුණක් වශයෙන් ගැනීම යි.
(ii) මෘත ශරීරයේ ඇතිවන පිළිකුල් සහගත බව අරමුණක් වශයෙන් ගැනීම යි.
iii) සතර ඉරියව් පැවැත්වීම අරමුණක් වශයෙන් ගැනීම යි.
(iv) ශරීරයේ ඇති දෙතිස් කුණුප කොට්ඨාශ අරමුණක් වශයෙන් ගැනීම යි.

27. පටිච්ච සමුප්පාද සිද්ධාන්තයට අයත් අංග දොළස අතර තිදොරින් රැස් කරන කුසල් හා අකුසල් දක්වා ඇත්තේ,
(i) සළායතන ලෙස ය. (ii) සංඛාර ලෙස ය. (iii) වේදනා ලෙස ය. (iv) උපාදාන ලෙස ය.

28. බුදු දහමට අනුව කර්මය විපාක දෙන ආකාරය අනුව ජීවිතයේ නිතර පුරුදු කරන ලද කර්මය හැඳින්වෙන්නේ,
(i) ගරුක කර්මය ලෙසිනි. (ii) ආසන්න කර්මය ලෙසිනි..
(ii) ආචිණ්ණ කර්මය ලෙසිනි. (iv) කටත්තා කර්මය ලෙසිනි.

29. ආර්ය මහා සංඝරත්නය ''ආහුණෙය්‍ය'' ලෙස හඳුන්වන්නේ,
   (i) ආර්ය මාර්ගයට පිළිපන් බැවිනි.
   (ii) පිදිය යුත්තන් සඳහා සකස් කළ දේ පිදීමට සුදුසු බැවිනි.
   (iii) බැහැරින් පැමිණෙන පිරිසට පිළියෙල කළ දේ පිදීමට සුදුසු බැවිනි.
   (iv) දොහොත් මුදුනේ තබා වැඳීමට සුදුසු බැවිනි.

30. බුදුරජාණන් වහන්සේ සියලු ලෝකයේ දැන ගත යුතු ධර්ම පරෝපදේශ රහිත ව අවබෝධ කළ බැවින්
   (i) සම්මා සම්බුද්ධ නම් වන සේක. (ii) අරහං නම් වන සේක.
   (iii) සුගත නම් වන සේක. (iv) ලෝකවිදූ නම් වනසේක.

31. ගෞතම බුද්ධ ශාසනයේ විනයධර භික්ෂුණීන් අතර අග්‍රස්ථානයට පත් වූයේ,
   (i) ඛේමා තෙරණින් වහන්සේ ය. (ii) උප්පලවණ්ණා තෙරණින් වහන්සේ ය.
   (iii) පටාචාරා තෙරණින් වහන්සේ ය. (iv) කිසා ගෝතමී තෙරණින් වහන්සේ ය.

32. පැවිදි කිරීමේ උපෝසථ කර්ම, වස් විසීම, සංඝ කර්ම ආදිය පිළිබඳ සම්බුද්ධ ආඥා ඇතුළත් වන්නේ,
   (i) චුල්ලවග්ග පාළියේ ය. (ii) මහාවග්ග පාළියේ ය.
   (ii) පාරාජිකා පාළියේ ය. (iv) පරිවාර පාළියේ ය.

33. භික්ෂු ප්‍රාතිමෝක්ෂයට අයත් **පාටිදේසනීය ශික්ෂා** පද ගණනින්,
   (i) දෙක කි. (ii) හතර කි. (iii) දහතුන කි. (iv) තිහ කි.

34. **නිධිකණ්ඩ සූත්‍රයෙහි** තමන් සතු කෙත්වතු රන්රුවන් ආදිය හඳුන්වා ඇත්තේ,
   (i) ජංගම නිධාන ලෙසිනි. (ii) ස්ථාවර නිධාන ලෙසිනි.
   (iii) අංගසම නිධාන ලෙසිනි. (iv) අනුගාමික නිධාන ලෙසිනි.

35. අභිධර්මයේ චෛතසික කාණ්ඩයෙහි විග්‍රහ වන **''සබ්බචිත්ත සාධාරණ''** චෛතසික ගණනින්,
   (i) හතකි (ii) හයකි (iii) දහතුනකි (iv) දහහතරකි

36. රූපය පිළිබඳ ඇලීම් බැඳීම දුරු කොට ආකාසය ආදි අරූප අරමුණු ඔස්සේ සිත වඩන්නේ,
   (i) සතර බ්‍රහ්ම විහාර මගිනි. (ii) චතුධාතු වවත්ථාන මගිනි.
   (iii) දස අනුස්සති මගිනි. (iv) සතර ආරුප්ප මගිනි.

37. පුද්ගල චරිත හඳුනා ගැනීමේ දී නොයෙක් දේ නිතර කල්පනා කරන දොඩමළු ස්වභාවයෙන් යුතු කණ්ඩායම් වශයෙන් සිටීමට කැමැති පුද්ගලයා හැඳින්වෙන්නේ,
   (i) රාග චරිත ලෙසිනි. (ii) මෝහ චරිත ලෙසිනි.
   (iii) විතර්ක චරිතය ලෙසිනි. (iv) බුද්ධි චරිත ලෙසිනි.

38. බුද්ධකාලීන ව වාසය කළ ශ්‍රමණ ශාස්තෘවරු අතර **මක්ඛලීගෝසාල**
   (i) අහේතු අප්‍රත්‍යය වාදියෙකි. (ii) අකිරියවාදියෙකි.
   (iii) භෞතිකවාදියෙකි. (iv) අමරාවික්ඛේපවාදියෙකි.

39. දෙවන ධර්ම සංගායනාවට හේතු වූ දස අකැප වස්තු අතර **ආවාස කප්ප** ලෙස දක්වා ඇත්තේ,
   (i) රා බවට නොපැමිණි මී රා පානය කැප බව යි.
   (ii) රන් රිදී මසු පිළිගැනීම කැප බව යි.
   (iii) වාටියක් නොමැති අඳනය පරිහරණය කැප බව යි.
   (iv) කුඩා ආවාසයන්හි වෙන් වෙනම පොහෝ කිරීම කැප බව යි.

40. තුන්වන ධර්ම සංගායනාවෙන් පසු සිදු වූ ධර්මදූත සේවාවෙහි කාශ්මීර් ගන්ධාර දේශයට වැඩම කළ මජ්ඣන්තික තෙරුන් එරට දී ප්‍රථමයෙන් දේශනා කළ සූත්‍ර ධර්මය නම්,
   (i) දේවදූත සූත්‍රය යි. (ii) අග්ගික්ඛන්ධෝපම සූත්‍රය යි.
   (iii) කාලාම සූත්‍රය යි. (iv) ආසිවිසෝපම සූත්‍රය යි.

*****

(සියලු ම හිමිකම් ඇවිරිණි)
(All Rights Reserved)

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2020

## Primary Piriven Year End Test - 2020

5 ශ්‍රේණිය / Grade 5

ත්‍රිපිටක ධර්මය II　　　　　　　　　　කාලය : පැය තුන යි

**Thipitaka Dhamma II**　විභාග අංකය :- …………….　　Time : Three hours

I කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද II සහ III කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් ද තෝරා ගෙන ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

### I කොටස

1. පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. බුදුරජාණන් වහන්සේ සතු ව පැවති අෂ්ට විද්‍යා ඥාන අතුරින් ඉද්ධිවිධ ඥානය හා දිබ්බසෝත ඥානය හඳුන්වන්න.

ii. බුදුරජාණන් වහන්සේ අසරණ සරණ වීමේ දී භාවිත කළ ප්‍රායෝගික උපක්‍රම දෙකක් දක්වන්න.

iii. උපසම්පදා භික්ෂුවක විසින් ආරක්ෂා කළ යුතු පාරාජිකා ශික්ෂාපද අතර දෙවන පාරාජිකා ශික්ෂාවෙහි එන "**ගමා**" සහ "**අරඤ්ඤා**" යන පද දෙකෙහි ධර්මානුකූල විග්‍රහය දක්වන්න.

iv. විනය පිටකයෙහි "**උභතෝ විභංග**" හා "**ඛන්ධක**" යන කොටස් දෙකට අයත් ග්‍රන්ථ නම් කරන්න.

v. සිඟාලක සූත්‍රයෙහි "**දක්ඛිණා දිසා**" යනුවෙන් දක්වා ඇති ගුරුවරයා විසින් ශිෂ්‍යයා විෂයෙහි දැක්විය යුතු උපස්ථාන පහ අතුරින් දෙකක් ලියන්න.

vi. අභිධර්මයේ රූප කාණ්ඩයෙහි එන විඤ්ඤත්ති රූප දෙක නම් කරන්න.

vii. මහායාන විභාෂා නම් අටුවා ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

viii. දස සක්විතිවත් අතුරින් දෙකක් නම් කරන්න.

ix. පළමුවන හා දෙවන ධර්ම සංගායනාවන්ට මූලික වූ මහ රහතන් වහන්සේලා නම් කරන්න.

x. ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිශික්ෂාවට බෙදා දැක්වීමේ දී පඤ්ඤා කොටසට අයත් මාර්ග අංග දෙක නම් කරන්න.

(ලකුණු 2X10=20)

### II කොටස

2. i. බුදුරජාණන් වහන්සේගේ රූප විලාසයෙහි දක්නට ලැබෙන මහා පුරුෂ ලක්ෂණ දෙකක් නම් කරන්න.

ii. බුදුරජාණන් වහන්සේගේ වාග් විලාසයෙහි සුවිශේෂතා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

iii. අසරණ සරණ වීමේ උදාර ගුණය දැහැමි සමාජයකට පදනම සකසන අයුරු බුදු සිරිත ඇසුරින් උදාහරණ ගෙන විමසන්න.

(ලකුණු 2+3+5=10)

3. i. අභිධර්මයේ චෛතසික ධර්ම අතර එන ප්‍රකීර්ණක චෛතසික නම් කරන්න.

ii. ප්‍රකීර්ණක චෛතසික දෙකක් කෙටියෙන් හඳුන්වන්න.

iii. සිත හා සිතිවිලි අතර ඇති සම්බන්ධය කුසලාකුසල කර්ම රැස් කිරීමට ඉවහල් වන ආකාරය පහදන්න.

(ලකුණු 2+3+5=10)

4. i. භික්ෂු විනයෙහි දැක්වෙන **"ගරුකාපත්ති"** පිළිබඳ කෙටි විග්‍රහයක් කරන්න.

ii. දෙවන පාරාජිකාපත්තිය ලියා අර්ථය සරල බසින් ලියන්න.

iii. පාරාජිකා ශික්ෂාපද භික්ෂුත්වය ආරක්ෂා කර ගැනීමට මූලික වන ආකාරය විනයානුකූල ව පහදන්න.

(ලකුණු 2+3+5=10)

## III කොටස

5. i. **"යථා දණ්ඩේන ගෝපාලෝ"** යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න.

ii. එම ගාථාවේ අර්ථය ලියන්න.

iii. දඬුවම සමාජ යහපත සඳහා හේතු වන අන්දම උදාහරණ සහිත ව විස්තර කරන්න.

(ලකුණු 2+3+5=10)

6. i. සම්මා සංකප්ප යටතේ විස්තර වන නිවැරදි සංකල්පනා දෙකක් නම් කරන්න.

ii. සම්මා ආජීව කෙටියෙන් පහදන්න.

iii. සම්මා වායාම පුද්ගලයාගේ දෙලොව අභිවෘද්ධියට හේතු වන අන්දම විස්තර කරන්න.

(ලකුණු 2+3+5=10)

7. i. පළමුවන ධර්ම සංගායනාවට හේතු වූ ආසන්න හේතුව සහ දුරස්ථ හේතුවක් දක්වන්න.

ii. දෙවන ධර්ම සංගායනාවට පසුබිම් වූ කරුණු පිළිබඳ කෙටි විග්‍රහයක් කරන්න.

iii. තුන්වන ධර්ම සංගායනාවෙන් පසු සිදුවූ දේශාන්තර ව්‍යාප්තිය ථෙරවාදී සසුනේ අභිවෘද්ධියට හේතු වූ අන්දම පහදන්න.

(ලකුණු 2+3+5=10)

*****

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව**
அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் - பிரிவேனா கல்விக் கிளை
State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

**වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)**
Year End Term Test – 2021 (2022)

පැ එකයි

**ත්‍රිපිටක ධර්මය - I** **5 ශ්‍රේණිය**

**සැලකිය යුතු යි.**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති (i) (ii) (iii) (iv) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න. (මෙම කොටස සඳහා ලකුණු 40ක් හිමි වේ).**
- **ඔබට සැපයෙන බහුවරණ පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**
- **එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.**

01. බුදුරජාණන් වහන්සේ සතු දෙතිස් මහා පුරුෂ ලක්ෂණ අතරින් **"සුඛුමච්ඡවී හෝති"** ලෙස අර්ථ දක්වන්නේ,
(i) රන් බඳු පැහැය ඇති බව යි. (ii) දූවිලි නොරඳන සුලු සියුම් සම ඇති බව යි.
(iii) බ්‍රහ්මයා බඳු සෘජු කය ඇති බව යි. (iv) මනාව තැනුණු පිට ඇති බව යි.

02. තම රූපයට නින්දා කළේ යැයි කෝප වී වෛරයෙන් යුතුව බුදුරජාණන් වහන්සේට අපහාස හිරිහැර කළේ,
(i) රූප නන්දා බිසව යි. (ii) මාගන්දියා බිසව යි.
(iii) මල්ලිකා බිසව යි. (iv) ඛේමා බිසව යි.

03. **"එතදග්ගං භික්ඛවේ මම සාවිකානං භික්ඛුණීනං ඉද්ධිමන්තීනං යදිදං උප්පලවණ්ණා"** ලෙස උප්පලවණ්ණාව ලැබූ අගතනතුර වූයේ,
(i) චිරරාත්‍රඥයන් අතර අගතනතුර යි. (ii) විනයධාරීතෙරණියන් අතර අගතනතුර යි.
(iii) සෘද්ධිමතියන් අතර අගතනතුර යි. (iv) මහානුවණැතියන් අතර අගතනතුර යි.

04. **"පහත් කුලයක උපත ලද මා වැනි දුගී දුප්පතකු කවරෙක් නම් පැවිදි කරද්දැයි"** බුදුරජාණන් වහන්සේ හමුවේ ඉතා යටහත් ව ප්‍රකාශ කළේ පහත අය අතරින්,
(i) මට්ටකුණ්ඩලී ය. (ii) සෝපාක ය. (iii) රජ්ජුමාලා ය. (iv) සුනීත ය.

05. දිඝ නිකායේ මහා සීහනාද සූත්‍රයේ සඳහන් ව ඇත්තේ
(i) පින සහ කුසලය පිළිබඳව ය. (ii) දස බල පිළිබඳව ය.
(iii) මිත්‍යා දෘෂ්ටි පිළිබඳව ය. (iv) කර්මය පිළිබඳව ය.

06. මහනුවර රාජධානි සමයේ ලක්දිව උපසම්පදාව නැවත පිහිටුවීමෙහිලා පුරෝගාමීව කටයුතු කළ වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ හිමියන් උපත ලැබුවේ,
(i) ක්‍රි:ව: 1695 දී ය. (ii) ක්‍රි:ව: 1697 දී ය. (iii) ක්‍රි:ව: 1698 දී ය. (iv) ක්‍රි:ව: 1699 දී ය.

07. අටුවා සම්පාදනයෙහිලා අද්විතීය කාර්යභාරයක් සිදුකළ අටුවාචාර්ය බුද්ධඝෝෂ හිමියන් සංස්කරණය කළ ග්‍රන්ථයක් වනුයේ,
(i) සමන්තපාසාදිකාව යි. (ii) මුනිගුණාලංකාරය යි.
(iii) මධුරත්ථවිලාසිනී යි. (iv) පරමත්ථජෝතිකා යි.

08. **ගිරග්ග සමජ්ජ** නාට්‍ය බලා ගිහි සැපත පිළිබඳ කළකිරි සත්‍ය සොයා ගිය උපතිස්ස කෝලිත දෙදෙනාට හේතුඵල දහම දේශනා කළ මුල් ම ගුරුවරයා වූයේ,

(i) බුදුරජාණන් වහන්සේ ය. (ii) නිඝණ්ඨනාතපුත්ත ය.
(iii) සංජය පිරිවැජියා ය. (iv) අස්සජි තෙරුන් ය.

09. බුද්ධ දේශනාවට අනුව පුද්ගලයාගේ සිතීම හා විමසීම ස්වාධීනව සිදු කිරිමට අවකාශය ලබාදෙන සූත්‍ර දේශනාවක් වන්නේ,

(i) මහා පරිනිබ්බාන සූත්‍රය යි. (ii) පරාභව සූත්‍රය යි.
(iii) බ්‍රහ්මජාල සූත්‍රය යි. (iv) කාලාම සූත්‍රය යි.

10. මානයේ ප්‍රභේද තුනකි. ඉන් **"සදිසමාන"** යනු වෙන් අර්ථවත් වන්නේ,

(i) තමා අනුන්ට වඩා උසස් යැයි සිතීම. (ii) තමා අනුන්ට වඩා පහත් යැයි සිතීම.
(iii) තමා අනුන් හා සමාන යැයි සිතීම. (iv) තමා අනුන් හා විරුද්ධ යැයි සිතීම.

11. අංගුත්තර නිකායේ පරාභව සූත්‍රයට අනුව පුද්ගලයෙකු පිරිහෙන කරුණු කීයද?

(i) පහළොව කි. (ii) දාහතර කි. (iii) දොළහ කි. (iv) දහය කි.

12. අභිධර්මයේ රූප විග්‍රහයට අනුව රූප සමුට්ඨාන යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?,

(i) රූප පිළිබඳ සැකවින් විස්තර කිරිම යි. (ii) රූප උපදවන හේතුප්‍රත්‍ය දැක්වීම යි.
(iii) දක්වන ලද රූප නැවත බෙදා දක්වීම යි. (iv) රූප විස්තරාත්මකව දක්වීම යි.

13. සිගාලක (සිගාලෝවාද) සූත්‍රයට අනුව මිතුරෙකු සේ පෙනී සිටිමින් වචනයෙන් පමණක් සංග්‍රහ කරන අමිත්‍රයා හඳුන්වන්නේ,

(i) අනුප්පියභාණී අමිත්‍රයා ලෙස ය. (ii) වචීපරම අමිත්‍රයා ලෙස ය.
(iii) අඤ්ඤදත්ථුහර අමිත්‍රයා ලෙස ය. (iv) අපායසහායක අමිත්‍රයා ලෙස ය.

14. කාලාම සූත්‍රයට අනුව ආගමික මතවාද නොපිළිගැනීමේ කරුණු අතර **" පෙනෙන ආකාරයට නම් මෙය නිවැරදි යැයි කියා හෝ"** යනුවෙන් දක්වා ඇත්තේ,

(i) **මා අනුස්සවේන** යන්න යි. (ii) **මා පරම්පරාය** යන්න යි.
(iii) **මා නයහේතු** යන්න යි. (iv) **මා ආකාර පරිවිතක්කේන** යන්න යි.

15. "ප්‍රහාණය කළ යුත්තේ ක්ලේශයන්ය. රූප පිළිබඳව ප්‍රහාණය කළ යුත්තේ රූප රාගයයි. එවිට රූපය නිරායාසයෙන් ම ප්‍රහාණය කළා වන්නේය." මෙලෙස විග්‍රහ වන්නේ අට විසි රූප වලට පොදු වූ,

(i) සප්පච්චය ලක්ෂණය යි. (ii) ලෞකික ලක්ෂණය යි.
(iii) අප්පහාතබ්බ ලක්ෂණය යි. (iv) සංඛත ලක්ෂණය යි.

16. මහා පෘථිවිය, ඉර මඩල, අව්ව, වැස්ස, සුළඟ, ගංගා, ඇළ දොළ ආදී ලෝක ධාතුන් හා කාම රූප අරූප අයත් වන්නේ,

(i) සත්ත්ව ලෝකයට ය. (ii) සංස්කාර ලෝකයට ය.
(iii) අවකාශ ලෝකයට ය. (iv) මහාභූත ලෝකයට ය.

17. විනය පිටකයේ භික්ෂු ප්‍රාතිමෝක්ෂයේ එන පාචිත්තිය ශික්ෂා ගණනින්

(i) අසූ දෙක කි. (ii) අනූ දෙක කි. (iii) එකසිය දෙක කි. (iv) එකසිය හැට දෙක කි.

18. මහායාන ඉගැන්වීමට අනුව ත්‍රිකාය සංකල්පයට අයත් **නොවන්නේ,**

(i) ධම්මකාය යි. (ii) නිර්මාණකාය යි. (iii) සම්භෝග කාය යි. (iv) රූප කාය යි.

19. මිහිඳු මහ රහතන් වහන්සේ දේශනා කළ සූත්‍ර අතර "නිරාදූක" ගැන සඳහන් වන සූත්‍රය වන්නේ,
(i) දේවදූත සූත්‍රය යි.
(ii) චූල්ලහත්ථිපදෝපම සූත්‍රය යි.
(iii) ධම්මචක්ක සූත්‍රය යි.
(iv) විමාන වත්ථු දේශනාව යි.

20. **"අස්මිං සති ඉදං හෝති"** යන්නෙන් අදහස් වන්නේ,
(i) මෙය ඇති කල්හි මෙය වේ.
(ii) මේ උපදීමෙන් මෙය උපදී.
(iii) මෙය නැති කල්හි මෙය නොවේ.
(iv) මෙය නිරුද්ධ වීමෙන් මෙය නිරුද්ධ වේ.

21. සත්‍ය අවබෝධ කරන සත්වයන් තුළ ඇතිකරගත යුතු අංග බොජ්ඣංග නම් වේ. එබඳු වූ සත්‍ය අවබෝධයට උපකාර වන ධර්ම කීයද?
(i) පහ කි.
(ii) හත කි.
(iii) අට කි.
(iv) දොළහ කි.

22. උපසම්පදා ක්‍රම අටකි. ඉන් වර්තමානයේ පවතින උපසම්පදා විනය කර්මය හඳුන්වන්නේ,
(i) එහි භික්ඛු උපසම්පදාව ලෙස ය.
(ii) ඕවාද පටිග්ගහණ උපසම්පදාව ලෙස ය.
(iii) ඤත්ති චතුත්ථකම්ම උපසම්පදාව ලෙස ය.
(iv) පඤ්හව්‍යාකරන උපසම්පදාව ලෙස ය.

23. අචාර්යන් වහන්සේ, උපාධ්‍යායන් වහන්සේ සහ භික්ෂු සංඝයා මධ්‍යයේ උපසම්පදා විනය කර්මය සිදු කිරීමට ප්‍රධානතම සුදුසුකම වන්නේ,
(i) සාමණේරව වසර පහක් ගතකර තිබීම ය.
(ii) විසිවයස් සම්පූර්ණ වීම ය.
(iii) බණදහම් දැන සිටීම ය.
(iv) තුදුස් වත් පිරීම ය.

24. විනය පිටකයේ සඳහන් සංඝාදිසේසාපත්ති අතුරින් විහාරකාර සංඝාදිසේසාපත්තිය පනවන ලද්දේ,
(i) ඡන්න තෙරුන්ට ය.
(ii) උදායි තෙරුන්ට ය.
(iii) දෙව්දත් තෙරුන්ට ය.
(iv) සෙය්‍යසක තෙරුන්ට ය.

25. උපසම්පදා භික්ෂුවක විසින් ආරක්ෂා කරගතයුතු ආදිබ්‍රහ්මචරිය සීලය ලෙස සැලකෙන්නේ,
(i) ප්‍රාතිමෝක්ෂ සංවර සීලය
(ii) ආජීව පාරිශුද්ධි සීලය
(iii) ඉන්ද්‍රිය සංවර සීලය
(iv) ප්‍රත්‍ය සන්නිශ්‍රිත සීලය

26. බුදුරජාණන් වහන්සේ සිගාලක ගෘහපතියාට දේශනා කළ සිගාලක සූත්‍රයේ සඳහන් සතර කර්මක්ලේශ වල ඇතුළත් නොවන්නකි,
(i) ප්‍රාණඝාතය යි.
(ii) අදින්නාදානය යි.
(iii) සුරාමේරය යි.
(iv) මුසාවාදය යි.

27. භාවනා කර්මස්ථාන ලබා දීමේදී පුද්ගල චරිත අතුරින් රාග චරිතයට වඩාත් ම ගැළපෙන කමටහන වන්නේ,
(i) කායගතාසතිය යි.
(ii) ආනාපානාසතිය යි.
(iii) මරණානුස්සතිය යි.
(iv) දේවානුස්සතිය යි.

28. අභිධර්මයේ රූප විග්‍රහයෙහි විඤ්ඤත්ති රූප නිවැරදිව දක්වා ඇති වරණය වන්නේ,
(i) කාය විඤ්ඤත්ති - මනෝ විඤ්ඤත්ති
(ii) කාය විඤ්ඤත්ති - කාය කම්මඤ්ඤතා
(iii) කාය විඤ්ඤත්ති - කාය පාගුඤ්ඤතා
(iv) කාය විඤ්ඤත්ති - වචී විඤ්ඤත්ති

29. බුද්ධඝෝස හිමියන් විසින් සුමංගල විලාසිනී නම් අටුවා ග්‍රන්ථය රචනා කරන ලද්දේ,
(i) අංගුත්තර නිකායට ය.
(ii) සංයුක්ත නිකායට ය.
(iii) ඛුද්දක නිකායට ය.
(iv) දීඝ නිකායට ය.

30. සැරියුත්, මුගලන් මහ රහතන් වහන්සේලාට අග්‍රශ්‍රාවක තනතුරු පිරිනැමීම සිදුවුයේ,
(i) නවම් පොහෝ දිනක ය.
(ii) වෙසක් පොහෝ දිනක ය.
(iii) ඇසළ පොහෝ දිනක ය.
(iv) වප් පොහෝ දිනක ය.

31. අභිධර්මයේ රූප කාණ්ඩයට අනුව මහා භූතරූප ඇසුරුකොට ඒ හා බැඳී පවතින උපාය රූප,
(i) විසි තුනකි. (ii) විසි හතරකි. (iii) විසි හතකි. (iv) විසි අටකි.

32. අෂ්ටවිද්‍යා අතුරින් ත්‍රිලක්ෂණය පිළිබඳ දැක්වෙන ඤාණය වන්නේ,
(i) ඉද්ධිවිධ ඤාණය යි. (ii) සබ්බඤ්ඤුත ඤාණය යි.
(iii) ආසයානුසය ඤාණය යි. (iv) විපස්සනා ඤාණය යි.

33. බුදුරජාණන් වහන්සේගේ දකුණු අකුධාතුව තැන්පත් කොට ඉදි කරන ලද ලංකාවේ පැරණි දාගැබ වන්නේ,
(i) ථූපාරාමය යි. (ii) තිස්සමහාරාමය යි. (iii) රුවන්වැලිසෑය යි. (iv) අභයගිරිය යි.

34. බෞද්ධ රාජ්‍ය පාලනය පිළිබඳ උපදෙස් සපයන සූත්‍ර දේශනාවක් ලෙස සැලකිය හැකි වන්නේ,
(i) චක්කවත්ති සීහනාද සූත්‍රය යි. (ii) සාමඤ්ඤඵල සූත්‍රය යි.
(iii) මහා සීහනාද සූත්‍රය යි. (iv) දේවදූත සූත්‍රය යි.

35. **අකුසලය සුළුය විපාක නොදේ** යැයි අවමන් නොකළ යුතුය මෙම අදහස දැක්වෙන ධම්මපද ගාථාවේ මුල් ම පද පේළිය වන්නේ,
(i) භද්‍රෝ පි පස්සති පාපං යන්න යි. (ii) පාපොපි පස්සති භද්‍රං යන්න යි.
(iii) පාපං චේ පුරිසො කයිරා යන්න යි. (iv) මාප්පමඤ්ඤේථ පාපස්ස යන්න යි.

36. තුන්වන ධර්ම සංගායනාවේ එක් ප්‍රතිඵලයක් වන්නේ රටවල් නවයකට ධර්මදූතයන් යැවීමයි. එහිදී වනවාසී දේශයට වැඩම කළේ,
(i) මහාදේව තෙරුන් ය. (ii) රක්ඛිත තෙරුන් ය.
(iii) මහා රක්ඛිත තෙරුන් ය. (iv) මජ්ඣන්තික තෙරුන් ය.

37. **"ජිඝච්ඡා පරමා රෝගා"** යන්නෙන් අර්ථවත් වන්නේ,
(i) කුසගින්න බලවත් ම රෝගය යි. (ii) නිවන පරම සුඛය යි.
(iii) සංස්කාර බලවත් ම දුක යි. (iv) ලෙඩවීම බලවත් ම රෝගය යි.

38. මහායාන ධර්මයට අනුව **උපදේශක ශාස්ත්‍ර** නම් අටුවා ග්‍රන්ථය රචනා වූයේ ,
(i) අභිධර්ම පිටකය සඳහා ය. (ii) පශ්චාත් පිටක ග්‍රන්ථ සඳහා ය.
(iii) විනය පිටකය සඳහා ය. (iv) සූත්‍ර පිටකය සඳහා ය.

39. දෙවන පෑතිස් රජු දවස මෙහෙණින් වහන්සේලා උදෙසා ඉදි කළ ප්‍රථම මෙහෙණවර වූයේ,
(i) තිසස්මහාරාම යි. (ii) කාලප්‍රසාදය යි. (iii) හත්ථාල්හක යි. (iv) චේතියගිරිය යි.

40. භාරතීය මහා අධිරාජ්‍යයක් නිර්මාණය කළ මෞර්ය රාජ වංශයේ ආරම්භය සිදු වූයේ,
(i) චන්ද්‍රගුප්ත රජුගෙනි. (ii) අශෝක රජුගෙනි.
(iii) බින්දුසාර රජුගෙනි. (iv) බිම්බිසාර රජුගෙනි.

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் - பிரிவேனா கல்விக் கிளை
State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

**වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)**
Year End Term Test – 2021 (2022)

පැ දෙකයි

**ත්‍රිපිටක ධර්මය - II** **5 වසර**

❖ **I කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද II හා III කොටසේ වලින් ප්‍රශ්න දෙක බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

## I කොටස

01. **පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

(i). **"යහපත් කොට යෙතැයි සුන්දර තැනට සැපතැයි"** යන කවිය සඳහන් ග්‍රන්ථය සහ ඉන් පැහැදිලි කරන බුදුගුණය නම් කරන්න.

(ii). **"මරණාය වා සමාදපෙයාා"** යන පාඨයෙහි අර්ථය ලියන්න.

(iii). අභිධර්ම පිටකයට කථාවත්ථුප්පකරණය එක් වූ අවස්ථාව සහ එය රචනා කළ කතුවරයා නම් කරන්න.

(iv). පරිනිර්වාණයෙහි ප්‍රභේද දෙක නම් කරන්න.

(v). වැලිවිට සංඝරාජ මාහිමියන් රචනා කළ ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

(vi). කර්මය විපාක දෙන ආකාර දෙකක් නම් කරන්න.

(vii). දුක්ඛ ආර්ය සත්‍ය ලොවට විෂය වන ආකාර තුනක් ඇත. ඉන් දෙකක් නම් කරන්න.

(viii). ධම්මානුපස්සනා භාවනාවේ ප්‍රධාන අරමුණු පහකි. ඉන් කොටස් දෙකක් නම් කරන්න.

(ix). උපසම්පදා විනය කර්මය සිදු කෙරෙන සීමා දෙකක් නම් කරන්න.

(x). නොකළයුතු වෙළඳාම් පහකි. ඉන් දෙකක් නම් කරන්න.

(ලකුණු 2 x 10 = 20)

## II කොටස

02. (i). බුදුරජාණන් වහන්සේගේ උත්තරීතර මනුෂ්‍යත්වය ප්‍රකට වන සූත්‍ර දෙකක් නම් කරන්න.

(ලකුණු 02)

(ii). බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 03)

(iii). ලෝක සත්ත්වයා කෙරෙහි මහා කරුණාව පතළ කළ අප බුදුරජාණන් වහන්සේගෙන් පිහිට ලද්දෝ අපමණ ය. උදාහරණ තුනක්වත් ඇතුළත් වන සේ විමසන්න. (ලකුණු 05)

03. (i). බුදුරජාණන් වහන්සේ සිගාලෝවාද සූත්‍රය (සිගාලක) දේශනා කළේ කාට ද? කොතනදී ද?

(ලකුණු 02)

(ii). එම සූත්‍රයේ සඳහන් කල්‍යාණ මිත්‍රයන් සිවුදෙනා නම් කරන්න. (ලකුණු 03)

(iii). "සිගාලෝවාද සූත්‍රයේ සඳහන් ගුරු ශිෂ්‍ය යුතුකම් මැනවින් සම්පූර්ණ වීමෙන් සදාචාරාත්මක සමාජයක් නිර්මාණය කරගත හැකිය" විමසන්න. (ලකුණු 05)

04. (i). මිහිඳු මාහිමියන්ගේ වැඩමවීමට පෙර ලක්දිව තුළ පැවති ආගමික විශ්වාස දෙකක් නම් කරන්න.

(ලකුණු 02)

(ii). "මහා මහින්දාගමනය දේවානම්පියතිස්ස රජු හා ධර්මාශෝක රජු අතර පැවති මිත්‍රත්වයක ප්‍රතිඵලයකි." කෙටියෙන් විමසන්න. (ලකුණු 03)

(iii). මිහිඳු මාහිමියන්ගේ හා සංඝමිත්තා මෙහෙණින් වහන්සේගේ වැඩමවීම ලක්දිව ආගමික හා සංස්කෘතික පරිවර්තනයකට හේතුවිය. ඓතිහාසික තොරතුරු ඇසුරින් විමසන්න. (ලකුණු 05)

## III කොටස

05. (i). **"පුඤ්ඤං චේ පුරිසෝ කයිරා"** යන ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 02)

(ii). එම ගාථාවේ අර්ථය සරල බසින් ලියන්න. (ලකුණු 03)

(iii). **පින සහ පව** පුද්ගල ජීවිතයට ඇති කරන බලපෑම ධම්මපදයේ පාප වග්ගය ඇසුරින් විමසන්න.

(ලකුණු 05)

06. (i). **"ඉමස්මිං යේව බ්‍යාමමත්තේ කළේබරේ ලෝකං ච පඤ්ඤපේමි"** යන්නෙහි අර්ථය ලියන්න.

(ලකුණු 02)

(ii). පංචස්කන්ධය නාමරූප වශයෙන් බෙදෙන අයුරු දක්වන්න. (ලකුණු 03)

(iii). විපස්සනා භාවනාවෙන් ලද හැකි ලෞකික ලෝකෝත්තර ප්‍රතිඵල පැහැදිලි කරන්න. (ලකුණු 05)

07. (i). සතර පාරාජිකාවන්හි එන මෙථුනධම්ම පාරාජිකාපත්තිය ලියන්න. (ලකුණු 02)

(ii). මෙථුනධම්ම පාරාජිකාපත්තියෙහි අර්ථය පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii). **"සතර පාරාජිකා ආරක්ෂා කිරීම තුළින් ශාසනාභිවෘද්ධිය සිදුවේ"** මෙය සනාථ කර දක්වන්න.

(ලකුණු 05)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**
கல்வி அமைச்சகம் - பிரிவேனா கல்விக் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**වර්ෂාවසාන වාර පරීක්ෂණය** - 2022 (2023)
ஆண்டிறுதிப் பரீட்சை – 2022 (2023)
Year End Term Test – 2022 (2023)

**පැය එකයි**

**ත්‍රිපිටක ධර්මය - I** **5 ශ්‍රේණිය**

**සැලකිය යුතුයි :**

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
- අංක **01** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**

01. තථාගතයන් වහන්සේ සියල්ලන් අතර ශ්‍රේෂ්ඨ වුවත්, සිය ශ්‍රාවක පිරිස් අතර සිටි විවිධ කුසලතා ඇති අය වෙත, අගතනතුරු පිරිනැමූහ. එයින් ප්‍රකට වන්නේ,
(1) මහාකාරුණික ගුණය යි. (2) නිහතමානී ගුණය යි.
(3) තාදී ගුණය යි. (4) මහාප්‍රඥා ගුණය යි.

02. බුදුරජාණන් වහන්සේ සංඛත වූ ද, අසංඛත වූ ද ධර්මයන් නිරවශේෂකොට දක්නා නුවණින් යුක්ත වේ. එය හැඳින්වෙන්නේ,
(1) සබ්බඤ්ඤුත ඤාණය ලෙස යි. (2) අනාවරණ ඤාණය ලෙස යි.
(3) ඉන්ද්‍රියපරොපරියත්ත ඤාණය ලෙස යි. (4) ආසයානුසය ඤාණය ලෙස යි.

03. **"පහත් කුලයක උපත ලද මා වැනි දුගී දුප්පතෙකු කවරෙක් පැවිදි කරද් ද යි"** යනුවෙන් බුදුරජාණන් වහන්සේගෙන් විමසුවේ,
(1) පේසකාර දුව ය. (2) රජ්ජුමාලා ය. (3) සෝපාක ය. (4) සුනීත ය.

04. බුදුරජාණන් වහන්සේගේ වාග් විලාසය අංග අටකින් යුක්ත වේ. ඒ අතරින් **" නින්නාදිතා"** යන්නෙහි අදහස වන්නේ,
(1) අතර බිඳීම් නැති බව ය.
(2) පිරිස කෙළවර සිටින අයට පවා ඇසෙන බව ය.
(3) ශබ්දය පහසුවෙන් මුවින් පිට වන බව ය.
(4) මිහිරි බව ය.

05. සැරියුත් තෙරුන් වහන්සේගේ දේශනා කෞශලායය, බුදුරජාණන් වහන්සේ නොයෙක් අවස්ථාවල දී බෙහෙවින් අගය කළහ. ඒ බව සඳහන් සූත්‍රයක් වන්නේ,
(1) වේදනාපරිගහ සූත්‍රය (2) චාතුම සූත්‍රය
(3) චක්කානුවත්ත සූත්‍රය (4) මූලපරියාය සූත්‍රය

06. නිතිපතා පොහෝ ගෙය ඇමද පහන් දල්වන උප්පලවණ්ණා තෙරණිය, එම පහන් දැල්ල ම නිමිති වශයෙන් ගෙන, ධ්‍යාන උපදවා පසුව රහත් භාවයට පත් වූවා ය. එහි දී අරමුණු කරගත්තේ,

(1) පඨවි කසිණය යි. (2) ආපෝ කසිණය යි.
(3) තේජෝ කසිණය යි. (4) වායෝ කසිණය යි.

07. පිණ්ඩපාතික අසරණසරණ සරණංකර මා හිමියන් උපසම්පදාවෙන් පසු ලක්දිව සංඝරාජ ධුරයට පත් කරන ලද්දේ,

(1) වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු විසිනි. (2) ශ්‍රී විජය රාජසිංහ රජු විසිනි.
(3) කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසිනි. (4) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසිනි.

08. අග්‍රශ්‍රාවක මුගලන් මහරහතන් වහන්සේ, සම්බුද්ධ ශාසනයෙහි චිරස්ථිතිය පිණිස සිදු කළ සුවිශේෂී කාර්යයන් අතරට අයත් **නො වන්නේ,**

(1) මච්ඡරියකෝසිය සිටුතුමා මසුරුකමින් මුදවාලීම ය.
(2) දෙව්ලොව තොරතුරු විස්තර කොට ධර්මය දේශනා කිරීම ය.
(3) ඉතා ගැඹුරු දහම් කරුණු සරල ව දේශනා කිරීම ය.
(4) මිනිස්ලොව පමණක් නොව, දෙව්ලොව ද සැරිසරමින් පිනෙහි විපාක දේශනා කිරීම ය.

09. **"අධිශීල සංඛ්‍යාත ශික්ෂාව ප්‍රතික්ෂේප නො කොට"** යනුවෙන් අදහස් වන්නේ,

(1) සික්ඛා සාජීව සමාපන්නො ය. (2) දුබ්බල්‍යං අනාවිකත්වා ය.
(3) පාරාජිකො හොති ය. (4) සික්ඛං අපච්චක්ඛාය ය.

10. සංචරිත්ත සංඝාදිසේසාපත්තියෙහි විවරණය කෙරෙන **"ඔහතචුම්බිටා"** යන්නෙහි අදහස,

(1) දායාද සම්පත් පවරා දී, වාසය කරවා ගත් ස්ත්‍රිය යි.
(2) මුහුණ වසා සිටින වැස්ම ඉවත් කිරීමෙන් තෝරා ගත් ස්ත්‍රිය යි.
(3) ඇසුරු කළහොත් දඬුවම මෙය යැ යි නියම කරන ලද ස්ත්‍රිය යි.
(4) මැය අසවලාට යැ යි උපදින විට ම හෝ පසු ව වෙන් කරගත් ස්ත්‍රිය යි.

11. ප්‍රථම අනියත ශික්ෂා පදය පැනවීමේ නිදානයට අනුව, උදායි භික්ෂුව විසින් කළ වරද බුදුරජාණන් වහන්සේට සැලකරන ලද්දේ,

(1) විශාඛා උපාසිකාව විසිනි. (2) සුමනා උපාසිකාව විසිනි.
(3) ඛුජ්ජුත්තරා උපාසිකාව විසිනි. (4) සුජාතා උපාසිකාව විසිනි.

12. කුටිකාර සංඝාදිසේසාපත්තියට අනුව, කුටියක් ඉදිකරන භූමියක **නො තිබිය යුතු** උපද්‍රවයක් ඇතුළත් **නො වන** වරණය තෝරන්න.

(1) කුහුඹුවන්, වේයන්, මීයන්, ගෝනුස්සන්
(2) ඇතුන්, අශ්වයන්, සර්පයන්, සිංහයන්
(3) සුනඛයින්, බළලුන්, එළදෙනුන්, මුවන්
(4) ව්‍යාඝ්‍රයින්, කොටියන්, කලුහිස්වලසුන්, කරබානා වලසුන්

13. වස් පවාරණයෙන් පසු, බුදුරජාණන් වහන්සේ දැකීමට වග්ගුමුදා නදී තීරයෙන් පැමිණි භික්ෂූන් වහන්සේලා ඡවිවර්ණ ඇත්තාහු, පිනාගිය ඉඳුරන් හා සිත්සතන් ඇත්තාහු වූහ. එසේ වීමට හේතුව,

(1) වග්ගුමුදා නදී තීරයෙහි වැවෙන නැවුම් පළතුරු වැළඳීම ය.

(2) මිගලණ්ඩික මුව වැද්දා විසින් දෙන ලද මාංශ වැළඳීම ය.

(3) වග්ගුමුදා නදී තීරයෙහි තිබූ ස්වාභාවික රමණීයත්වය යි.

(4) උතුරු මිනිස් දම් පැවසීමෙන් ලත් පිණ්ඩපාතය වැළඳීම ය.

14. පැවිද්ද, උපසම්පදාව, පොහොය කිරීම, වස් විසීම, පවාරණය, කඨිනය සහ බෙහෙත්හේත් ආදිය පිළිබඳ පැනවීම්, විස්තර හා විවරණ ඇතුළත් වන්නේ,

(1) මහාවග්ග පාළියේ ය.
(2) පාචිත්තිය පාළියේ ය.
(3) චුල්ලවග්ග පාළියේ ය.
(4) පරිවාර පාළියේ ය.

15. පරමත්ථජෝතිකා නම් වූ **සුත්තනිපාත අටුවාව** රචනා කළේ,

(1) චෝළිය කාශ්‍යප හිමි ය.
(2) බුද්ධඝෝෂ හිමි ය.
(3) බුද්ධදත්ත හිමි ය.
(4) ධම්මපාල හිමි ය.

16. මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතයෙහි ආදීනව අතර **"කෝපීන නිදංසනී"** යන්නෙහි අර්ථය වන්නේ,

(1) විළිබිය නැති ව හැසිරීම යි.
(2) අපකීර්තිය ඇතිවීම යි.
(3) රෝගයන්ට ආකරයක් වීම යි.
(4) නුවණ දුර්වල වීම යි.

17. කුලපුත්‍රයෙකු විසින් දුක සැප දෙකෙහි දී මිතුරන් සමග එක් ව ක්‍රියා කළ යුතු ආකාරය සිගාල සූත්‍රයේ දක්වා ඇත. ඒ අතරින් **"මිතුරන් නො රැවටීමෙන් ක්‍රියා කිරීම"** හැඳින්වෙන්නේ,

(1) පෙය්‍යවජ්ජෙන යනුවෙන් ය.
(2) අත්ථචරියාය යනුවෙන් ය.
(3) අවිසංවාදනතාය යනුවෙන් ය.
(4) සමානත්තතාය යනුවෙන් ය.

18. සිගාලෝවාද සූත්‍රයට අනුව ආචාර්යවරුන්ට උපස්ථාන කළයුතු කරුණු පහ අතරින් **"සක්කච්චං සිප්පපටිග්ගහණෙන"** යන්නෙහි අර්ථය වන්නේ,

(1) ගුරුවරයා දැක හුනස්නෙන් නැගිටීම යි.
(2) උගන්වන දැ මැනවින් අසා සිටීම යි.
(3) ගුරුවරයාට වතාවත් කිරීම යි.
(4) උගන්වන ශිල්ප මැනවින් ඉගෙනීම යි.

19. ආගමික මතවාද පිළිගැනීමේ නිවැරදි විධි අතරින් **"මා ආකාරපරිවිතක්කෙන"** යනුවෙන් අදහස් වන්නේ,

(1) මෙය මෙසේ විය හැකි ය කියා නො පිළිගත යුතු බව යි.

(2) පෙනෙන ආකාරයට මෙය නිවැරදි යැ යි නො පිළිගත යුතු බව යි.

(3) දහම් පොත පතට ගැළපේ යැ යි නො පිළිගත යුතු බව යි.

(4) න්‍යාය ධර්මයට ගැළපේ යැ යි නො පිළිගත යුතු බව යි.

20. භික්ෂු භික්ෂුණීන් සඳහා පනවන ලද විනය ශික්ෂා පද හතරක් ආපත්තිභය සූත්‍රයෙහි ඉගැන්වෙන එම ශික්ෂා පද ඇතුළත් වරණය,

(1) පාරාජිකා, සංඝාදිසේස, පාචිත්තිය, අනියත.
(2) පාරාජිකා, සංඝාදිසේස, පාටිදේසනීය, මානත්.
(3) පාරාජිකා, සංඝාදිසේස, පාචිත්තිය, පාටිදේසනීය.
(4) පාරාජිකා, සංඝාදිසේස, අනියත, පාටිදේසනීය.

21. පරාභව සූත්‍රයේ අන්තර්ගත වන පිරිහීමේ කරුණු සංඛ්‍යාව ඇතුළත් වරණය වන්නේ,

(1) දොළසකි. (2) තුදුසකි. (3) සොළසකි. (4) සතළොසකි.

22. අභිධර්මයේ රූපවිග්‍රහයට අනුව අටවිසි රූප සියල්ල පොදු ලක්ෂණ අටකින් යුක්ත වේ. ඒ අතරින් **"සප්පච්චය"** ලෙස විස්තර වන්නේ,

(1) අකුසල මූල හා කුසල මූලයන්හි යෙදීමක් නැති බව ය.
(2) චිත්ත, චෛතසික මෙන් අරමුණු ගැනීමක් නැති බව ය.
(3) රූප අරමුණු කොට ක්ලේශ හටගන්නා බව ය.
(4) රූප සමග යෙදෙන ලෝභාදි හේතු නැතත් ප්‍රත්‍යයන්ගෙන් හටගන්නා බව ය.

23. අභිධර්මයෙහි රූප විග්‍රහයට අනුව, කුඩා දරුවෙකු තරුණයෙකු බවට සහ තරුණයෙකු මහලු බවට පත්වන්නේ,

(1) පඨවි ධාතුව හේතුවෙන් ය. (2) ආපෝ ධාතුව හේතුවෙන් ය.
(3) තේජෝ ධාතුව හේතුවෙන් ය. (4) වායෝ ධාතුව හේතුවෙන් ය.

24. සෝවාන් ඵලයට පත් වූ ආර්ය ශ්‍රාවකයා පිළිබඳ **සාවද්‍ය ප්‍රකාශය** වන්නේ,

(1) දෙවන ජන්මයේ රහත්වන පුද්ගලයා ඒක බීජ නමින් හැඳින්වේ.
(2) සත්වන ජන්මයේ රහත්වන පුද්ගලයා සත්තක්ඛත්තු පරම නමින් හැඳින්වේ.
(3) මරණින් මතු නැවත මනුලොව නූපදින්නේ ය.
(4) නැවත කිසි දිනක අපාගාමී නො වේ.

25. ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ සොළොසෙන් **දෙවැන්න** වන්නේ,

(1) ඛුද්දකපාඨ ග්‍රන්ථය යි. (2) ධම්මපද ග්‍රන්ථය යි.
(3) ඉතිවුත්තක ග්‍රන්ථය යි. (4) උදාන ග්‍රන්ථය යි.

26. **"ඛිප්පාභිඤ්ඤ"** හෙවත් ක්ෂණයකින් ධර්මාවබෝධය කළ තැනැත්තන් අතර අග්‍ර වූයේ,

(1) චූල්ල පන්ථක මහරහතන් වහන්සේ ය. (2) බාහිය දාරුචීරිය මහරහතන් වහන්සේ ය.
(3) සාරිපුත්ත මහරහතන් වහන්සේ ය. (4) අනුරුද්ධ මහරහතන් වහන්සේ ය.

27. **"අභික්කමෙථ කල්‍යාණෙ"** යන්නෙහි අදහස වනුයේ,

(1) සිත අකුසල සිතිවිලිවලින් වළක්වා ගත යුතු ය.

(2) පාපය යළි යළිත් නො කළ යුතු ය.

(3) පිනට කැමැත්ත ඇතිකර ගත යුතු ය.

(4) දාන, ශීල ආදී යහපත් කටයුතු යුහුසුළු ව කළ යුතු ය.

28. අනුපූර්ව ශික්ෂණ ක්‍රමයේ තෙවැනි පියවර වන්නේ,

(1) සමාධිය යි. (2) සීලය යි. (3) ප්‍රඥාව යි. (4) සතිය යි.

29. අභිධර්මයට අනුව සතර ආකාර වූ පරමාර්ථ අතරින්, අසංඛත ධර්මයක් වනුයේ,

(1) චිත්ත පරමාර්ථය යි. (2) චෛතසික පරමාර්ථය යි.

(3) රූප පරමාර්ථය යි. (4) නිබ්බාන පරමාර්ථය යි.

30. විපස්සනා භාවනාව පිළිබඳ **නිවැරදි ප්‍රකාශය** වන්නේ,

(1) සිව් වැදෑරුම් ධ්‍යානවලට පත් විය හැකි ය.

(2) අෂ්ට සමාපත්ති උපදවා ගත හැකි ය.

(3) සංකල්පීය ලෝකයෙහි යථාර්ථය අවබෝධ කළ හැකි ය.

(4) සියල්ලෙහි සදාකාලික පැවැත්ම තහවුරු කරගත හැකි ය.

31. හේතුඵල දහමට අනුව, **ඵස්ස හෙවත් ස්පර්ශය** ඇතිවන්නේ,

(1) නාමරූප හේතුවෙන් ය. (2) විඤ්ඤාණ හේතුවෙන් ය.

(3) වේදනා හේතුවෙන් ය. (4) සළායතන හේතුවෙන් ය.

32. **"කම්මස්සකා මානව සත්තා, කම්මදායාදා, කම්මයෝනි, කම්මබන්ධූ, කම්ම පටිසරණා කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පණීතතායාති"** මෙම ප්‍රකාශය ඇතුළත් වන්නේ,

(1) අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයේ ය. (2) චූල්ලකම්මවිභංග සූත්‍රයේ ය.

(3) නිබ්බේධික සූත්‍රයේ ය. (4) මහා තණ්හාසංඛය සූත්‍රයේ ය.

33. ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි සීල ශික්ෂාවට ඇතුළත් වන්නේ,

(1) සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව

(2) සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා

(3) සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි

(4) සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම

34. අභිධර්මයට අයත් රූප සමුද්දේසයේ, නිෂ්පන්න රූප කොටසට ඇතුළත් **"ගන්ධ"** යනු,

(1) පසාද රූපය කි. (2) විසය රූපය කි. (3) භාව රූපය කි. (4) භූත රූපය කි.

35. සත්ත්වයාගේ උත්පත්ති වර්ග අනුව **"ගබ්භසෙය්‍යක"** නමින් හැඳින්වෙන්නේ,

(1) සංසේදජ හා ඕපපාතික සත්ත්වයන් ය. (2) අණ්ඩජ හා ජලාබුජ සත්ත්වයන් ය.

(3) සංසේදජ හා ජලාබුජ සත්ත්වයන් ය. (4) අණ්ඩජ හා ඕපපාතික සත්ත්වයන් ය.

36. බුද්ධ දේශනාව ධර්මස්කන්ධ වශයෙන් **අසූහාරදහසකට** බෙදා දැක්වීම සුවිශේෂ බෙදීමකි. එය සඳහන් වන්නේ,

(1) දීඝනිකාය අටුවාවේ ය. (2) මජ්ඣිමනිකාය අටුවාවේ ය.

(3) සංයුත්තනිකාය අටුවාවේ ය. (4) අංගුත්තරනිකාය අටුවාවේ ය.

37. චුල්ලවග්ග පාළියට අනුව, සංඝයාගේ භේදයට හේතුවන කරුණු දහ අටකි. ඒ අතරින් **"අනාපත්තිං ආපත්තීති දීපෙන්ති"** යන්නෙහි අදහස ඇතුළත් වරණය වන්නේ,

(1) ඇවැතක් ඇවැත් නො වේයැයි දක්වති.

(2) ඇවැත් නො වන්නක් ඇවැතකැ යි දක්වති.

(3) ලුහු ඇවැතක් ගරු ඇවැතක් සේ දක්වති.

(4) ගරු ඇවැතක් ලුහු ඇවැතක් සේ දක්වති.

38. සතර පාරාජිකා අතරින් සුදින්න භික්ෂුව ආදිකම්මිකයා වූයේ,

(1) අදත්තාදාන පාරාජිකාවට ය. (2) මෙථුනධම්ම පාරාජිකාවට ය.

(3) උත්තරිමනුස්සධම්ම පාරාජිකාවට ය. (4) මනුස්සවිග්ගහ පාරාජිකාවට ය.

39. මහායාන බුදුදහමේ ත්‍රිකාය සංකල්පයට අනුව **"ධර්මකාය"** ලෙස සඳහන් වන්නේ,

(1) ඍද්ධි බලයෙන් මවා පෙන්වන සිරුර යි.

(2) උසස් දහමෙන් පිරිසිදු කළ සිරුර යි.

(3) මිනිසුන් අතර පෙනී සිටි මිනිස් සිරුර යි.

(4) බුද්ධත්වයේ අනුපම සුවය විඳින සූක්ෂ්ම සිරුර යි.

40. කර්මය කෘත්‍ය වශයෙන් සතර ආකාරයකි. ඒ අතරින් "විපාකය නැති කිරීම හා කර්ම විපාක විඳීමට අවස්ථාවක් නො ලැබීම" සිදු වන බව දැක්වෙන්නේ,

(1) ජනක කර්මයේ ය. (2) උපත්ථම්භක කර්මයේ ය.

(3) උපපීළක කර්මයේ ය. (4) උපඝාතක කර්මයේ ය.

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சகம் - பிரிவேனா கல்விக் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**වර්ෂාවසාන වාර පරීක්ෂණය - 2022 (2023)**
ஆண்டிறுதிப் பரீட்சை – 2022 (2023)
Year End Term Test – 2022 (2023)

පැය තුනයි

**ත්‍රිපිටක ධර්මය - II** **5 ශ්‍රේණිය**

❖ **I කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද, II සහ III කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

## I කොටස

01. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. මානයෙහි ප්‍රභේද තුනකි. ඉන් **දෙකක්** අර්ථය සමග ලියන්න.

II. නවංගසත්ථු සාසනයෙහි ඇතුළත් අංග **හතරක්** ලියන්න.

III. ප්‍රතිකර්ම කළ හැකි - නො හැකි ආකාරය අනුව ආපත්ති වර්ග නම් කරන්න.

IV. සඟරජ හිමියන් විසින් රචනා කරන ලද ධර්මශාස්ත්‍රීය ග්‍රන්ථ **හතරක** නම් ලියන්න.

V. කර්මස්ථාන පිළිබඳ පංචවිධ සන්ධි අතරින් **හතරක** නම් ලියන්න.

VI. පරිනිර්වාණයෙහි අවස්ථා **දෙක** දක්වන්න.

VII. කූටදන්ත සූත්‍රයට අනුව රාජ්‍ය පාලකයන් රට ස්වයංපෝෂිත කිරීමට අනුගමනය කළ යුතු නිර්දේශ **දෙකක්** දක්වන්න.

VIII. මහායාන බුදුදහමේ ෂඩ්පාරමිතා අතරට පසු කාලීනව එකතු වූ පාරමිතා **හතර** නම් කරන්න.

IX. පංචබලි අතරින් **හතරක්** ලියන්න.

X. **"දානං සීලං පරිච්චාගං - අජ්ජවං මද්දවං තපං"** යන ගාථාව සම්පූර්ණ කරන්න.

(ලකුණු 2 × 10 = 20)

## II කොටස

02. I. බුදුරජාණන් වහන්සේගේ **තාදි ගුණය** ප්‍රකට වන අවස්ථා **දෙකක්** ලියන්න.

II. ඉහත (i) හි ඔබ විසින් දක්වන ලද එක් අවස්ථාවකට අදාළ සිදුවීම ලියන්න.

III. අටලෝදහමින් කම්පා නො වීම පැහැදිලි කොට, නූතන ආර්ථික අර්බුද හමුවේ කම්පනයෙන් තොර ව ජීවත් වීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

03. I. ප්‍රාග් මහින්ද යුගයෙහි පැවති ඇදහිලි හා විශ්වාස **හතරක්** නම් කරන්න.

II. ලක්දිව ශාසන ප්‍රතිෂ්ඨාපනය සිදු වූ ආකාරය කෙටියෙන් ලියන්න.

III. දුමින්දාගමනය සමග ඇති වූ, ලක්දිව මෙහෙණි සසුනේ ආරම්භය හා ව්‍යාප්තිය විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

04. I. **"ආසවට්ඨානීය"** ධර්ම නම් කරන්න.

II. **උත්තරිමනුස්සධම්ම පාරාජිකාපත්තිය** ලියන්න.

III. උපසපන් භික්ෂුවක් **සංඝාදිසේසාපත්තියකට** පත්වීමෙන් පසු, පාරිශුද්ධත්වයට පත්වීමට පිළිපැදිය යුතු ශාසනික පිළිවෙත් පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

## III කොටස

05. I. **"පාණම්හි චේ වණෝ නාස්ස"** යන ගථාව සම්පූර්ණ කරන්න.

II. එම ගථාවෙහි සරල අර්ථය ලියන්න.

III. **"කර්මය යනු ක්‍රියාව නොව චේතනාව යි"** සූත්‍රානුසාරයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

06. I. පංච නියාම ධර්ම අතරින් **හතරක්** නම් කරන්න.

II. සම්මා කම්මන්ත (නිවැරදි ක්‍රියාවෙන්) යුක්ත වීමෙන් ලැබෙන ප්‍රයෝජන **තුනක්** ලියන්න.

III. **"ආර්ය අෂ්ටාංගික මාර්ගය පුරුදු පුහුණු කිරීම සමාජ සුභ සිද්ධියට හේතු වේ." විමසන්න.**

(ලකුණු 2 + 3 + 5 = 10)

07. I. **"රූප"** හැඳින්වීමට අභිධර්මාර්ථ සංග්‍රහයේ යෙදෙන පාලි විග්‍රහ වාක්‍යය ලියන්න.

II. අභිධර්මාර්ථ සංග්‍රහයට අනුව රූප විභාග කොට දක්වන ආකාර පහෙන් **තුනක්** ලියන්න.

III. **රූප සමුට්ඨාන හතර නම් කර ඉන් දෙකක්** වෙන වෙන ම විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

[ සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය/Ministry of Education - Division of Piriven Education/கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

# පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)

## 05 ශ්‍රේණිය

## (03) ත්‍රිපිටක ධර්මය - I පත්‍රය

| 03 | S | I |
|---|---|---|

පැ එකයි

**සැලකිය යුතුයි :**

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
- **එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.**

1. තථාගතයන් වහන්සේ ධර්මෝපදේශ ලබාදෙන්නේ සෑම දෙනාගේ ම අදහස් නිවැරදි ලෙස දැන ගැනීමෙනි. එය
   (1) ඉන්ද්‍රියපරොපරියත්ති ඤාණය යි. (2) නානාධිමුත්තික ඤාණය යි.
   (3) නානාධාතු පටිවේධ ඤාණය යි. (4) ඨානාඨාන ඤාණය යි.

2. බුදුරජාණන් වහන්සේ ධර්මය ගුරු තනතුරේ තබා ගැනීම, දානය සඳහා රජමාලිගයටත්, දුගී පැල්පතටත් කිසිඳු භේදයකින් තොරව වැඩම කිරීම තුළින් ප්‍රකට වන්නේ,
   (1) උත්තරීතර සමාජ දාර්ශනිකත්වය යි. (2) අසහාය ශාස්තෘත්වය යි.
   (3) මහා කාරුණිකත්වය යි. (4) නිහතමානී නායකත්වය යි.

3. බුදුරජාණන් වහන්සේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණවලින් යුතු වේ. එම ලක්ෂණ අතර **"සුසුක්කදාඨො හොති"** යන්නෙහි අදහස වන්නේ,
   (1) සමව පිහිටි දත් ඇතියහ. (2) සුදෝසුදු දත්පෙළ ඇතියහ.
   (3) සම සතලිස් දත් ඇතියහ. (4) තැන තැන හිදැස් නැති දත්පෙළ ඇතියහ.

4. බුදුසසුනෙහි උපසම්පදාව ලබාගත හැකි ක්‍රම අටෙන් **තුනක්** භික්ෂුණීන් අරභයා පනවන ලද්දාහු ය. ඊට අයත් **නොවන්නේ,**
   (1) පඤ්හව්‍යාකරණ උපසම්පදාව යි. (2) අට්ඨවාචක උපසම්පදාව යි.
   (3) දූතේන උපසම්පදාව යි. (4) ගරුධම්ම පටිග්ගහන උපසම්පදාව යි.

5. බුද්ධ පරිනිර්වාණයෙන් පසුව කුණ්ඩල වන විහාරයේ පැවති ධර්ම සංගායනාවේ ප්‍රධානත්වය දැරුවේ,
   (1) මහා කාශ්‍යප තෙරුන් ය. (2) පාර්ශ්ව තෙරුන් ය.
   (3) මොග්ගලීපුත්තතිස්ස තෙරුන් ය. (4) සබ්බකාමී තෙරුන් ය.

6. කර්ම විපාක දීමේ දී ලබාදෙන්නා වූ ( කෘත්‍ය) අනුව සතර ආකාරය. ඒවා පිළිවෙළින් ඇතුළත් වරණය වන්නේ,
   (1) ගරුක, ආසන්න, ආචිණ්ණ, කටත්තා
   (2) ජනක, උපත්ථම්භක, උපපීළක, උපඝාතක
   (3) ගති, කාල, උපධි, පයෝග
   (4) දිට්ඨධම්මවේදනීය, උපපජ්ජවේදනීය, අපරාපරියවේදනීය, අහෝසි

7. රාජ්‍ය පාලනය සඳහා පරමාදර්ශී පාලකයා ලෙස බුදුසමය පෙන්වා දෙන්නේ,
   (1) චක්‍රවර්ති රජු ය. (2) ශක්‍ර දෙවිඳුන් ය. (3) සතර වරම් දෙව් රජහු ය. (4) ක්ෂත්‍රිය රජවරු ය.

8. දීඝ නිකායාගත චක්කවත්ති සීහනාද සූත්‍රයට අනුව පුද්ගල පරිහානියට සහ සමාජ පරිහානියට මූල හේතුව වන්නේ,
   (1) දිළිඳුකම ය. (2) සොරකම ය. (3) බොරු කීම ය. (4) ආයුධ ගැනීම ය.

9. වස් පවාරණයෙන් භික්ෂුවට කඨිනයක් ඇතිරීමට පූජා කළ හැකි වන්නේ,
   (1) සුදු පැහැති වර්ණ ගැන්විය හැකි අලුත් වස්ත්‍රයකි.
   (2) සුදුසු පරිදි වර්ණ ගන්වන ලද අලුත් දෙපට හෝ තනිපට සිවුරකි.
   (3) සුදුසු පරිදි වර්ණ ගන්වන ලද අලුත් අඳනයකි.
   (4) ඉහත දෑ අතරින් අභිමත එකකි.

10. අංගුත්තර නිකායේ පඤ්චක නිපාතයේ **උස්සුරභත්ත සූත්‍රය**ට අනුව අම්ලපිත්ත රෝගය වැළඳෙන්නේ වේලාව පසු වී ආහාර ගන්නා විට,
   (1) අභ්‍යන්තර ඕජාව වියළී යාම නිසා බාහිර ඕජාවට තනිව දිරවීමට නොහැකි බැවිනි.
   (2) බාහිර ඕජාව වියළී යාම නිසා අභ්‍යන්තර ඕජාවට තනිව දිරවීමට නොහැකි බැවිනි.
   (3) අභ්‍යන්තර සහ බාහිර ඕජාව වියළී යාම හේතුකොට ගෙන ය.
   (4) බාහිර ඕජාව වියළී යාම හේතුකොට ගෙන ය.

11. **"ගබ්භමෙකෙ උප්පජ්ජන්ති - නිරයං පාප කම්මිනො, සග්ගං සුගතිනො යන්ති - පරිනිබ්බන්ති අනාසවා"** යන ගාථාවේ නිදාන කතාව ඇසුරෙන් එක් එක් ගාථා පාඨයට අදාළ සිදුවීමට භාජනය වූවන් පිළිවෙළින් දැක්වෙන්නේ,
   (1) කොස්වා ළිහිණියා, මැණික්කරු, මැණික්කරුගේ බිරිඳ, මණිකාර කුලූපග තිස්ස හිමි
   (2) මැණික්කරුගේ බිරිඳ, කොස්වා ළිහිණියා, මැණික්කරු, මණිකාර කුලූපග තිස්ස හිමි
   (3) මැණික්කරු, කොස්වා ළිහිණියා, මැණික්කරුගේ බිරිඳ, මණිකාර කුලූපග තිස්ස හිමි
   (4) මැණික්කරුගේ බිරිඳ, මැණික්කරු, කොස්වා ළිහිණියා, මණිකාර කුලූපග තිස්ස හිමි

12. **"සුරාමේරය මජ්ජපමාදට්ඨානා"** මේ පිළිබඳ **සාවද්‍ය** ප්‍රකාශය වන්නේ,
   (1) පංච ශීලයෙහි පස්වන සිකපදයේ කොටසකි.
   (2) භෝග විනාශ මුඛ හයෙන් එකකි.
   (3) සතර කර්ම ක්ලේෂයන්ට අයත් වේ.
   (4) සුරාමේරය භාවිතයෙන් මදය හා ප්‍රමාදය ඇති වේ.

13. උත්පත්ති වර්ග අනුව **"අණ්ඩජ"** කාණ්ඩයට අයත් සත්ත්වයෝ පමණක් ඇතුළත් වරණය තෝරන්න.
   (1) මිනිසා, දෙවිවරු, කුරුමිණියා, කුකුළා
   (2) අලියා, ගෙම්බා, ඌරා, මීයා
   (3) හැකරැල්ලා, කොකුපණුවා, කැරපොත්තා, හූනා
   (4) කුකුළා, පැස්බරා, ගිරවා, තාරාවා

14. **"මා ඉතිකිරාය"** යන්නෙහි වඩාත් නිවැරදි අදහස වනුයේ,
   (1) මෙය මෙසේ විය හැකිය යන්න ය.
   (2) මෙය මෙසේ විය කියා යන්න ය.
   (3) කටකතාවෙන් ඇසූ නිසා යන්න ය.
   (4) පෙනෙන ආකාරයට නම් මෙය නිවැරදිය යන්න ය.

15. සංඝාදිසේසාපත්ති යන්නට පර්යාය පදයක් වන්නේ,
   (1) ගරුක යන්න ය.
   (2) ආපත්ති යන්න ය.
   (3) මානත යන්න ය
   (4) අබ්භාන යන්න ය

16. වැලිවිට පිණ්ඩපාතික අසරණ සරණ සරණංකර සංඝරාජෝත්තමයාණන් වහන්සේ පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,
   (1) සරණංකර හෙරණපාණන් වහන්සේ පළමුව උපසම්පදාව ලැබීය.
   (2) සංඝරාජයන් වහන්සේගේ ධර්ම ශාස්ත්‍රීය සේවාව මහනුවර යුගයට පමණක් ම සීමා විය.
   (3) වර්ෂ 1753 ජුනි 15 වැනි දින සරණංකර හෙරණපාණන් උපසම්පදාව ලැබීය.
   (4) සරණංකර මාහිමියන්ගේ උපත 1698 ජුනි මස 15 වැනි දින සිදු විය.

17. ආපත්තිභය සූත්‍රයට අනුව පාරාජිකාපත්තියකට බිය විය යුත්තේ එය,
   (1) අලු පොට්ටනියකින් පහර කෑමක් තරම් වන බැවිනි.
   (2) මෝල් ගහකින් පහර කෑමක් තරම් වන බැවිනි.
   (3) හිස ගසා දැමීමක් තරම් වන බැවිනි.
   (4) ප්‍රසිද්ධියේ බැනුම් ඇසීමක් තරම් වන බැවිනි

18. සිවු වැනි වරටත් තම කුටිය බිඳ දැමුණු කල්හි, ධනිය ස්ථවිරයන් වහන්සේ තමන් සඳහා තැනීමට අදහස් කළේ,
   (1) තෘණ කුටිය කි.
   (2) සර්වමෘන්මය කුටිය කි.
   (3) දැකුම්කළු කුටිය කි.
   (4) දාරුමය කුටිය කි.

19. විනය පිටකයේ දැක්වෙන උපසපන් භික්ෂු භික්ෂුණීන් සඳහා පනවන ලද විනය ශික්ෂා පද ප්‍රධාන වශයෙන් හතරකට බෙදේ. ඒවා පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) පාරාජිකා, පාචිත්තිය, සංඝාදිසේස, පාටිදේසනීය
(2) පාරාජිකා, සංඝාදිසේස, පාටිදේසනීය, පාචිත්තිය
(3) පාරාජිකා, සංඝාදිසේස, පාචිත්තිය, පාටිදේසනීය
(4) පාරාජිකා, පාචිත්තිය, පාටිදේසනීය, සංඝාදිසේස

20. වචීපරම මිත්‍රයා පිළිබඳව කියවෙන සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
(1) අස්සුතං සාවෙති.
(2) අතීතෙන පටිසත්ථරති.
(3) අනාගතෙන පටිසත්ථරති
(4) නිරත්ථකෙන සංගණ්හාති

21. මහධන සිටුපුත්‍රයා සිටු තනතුරෙනුත් පිරිහී මෙලොව දී ම හිඟමනට වැටුණේ,
(1) ධනය තනිව භුක්ති විඳීම හේතුකොට ගෙන ය.
(2) මාන්නාධික බව හේතුකොට ගෙන ය.
(3) දුසිරිතට ලොල්වීම හේතුකොට ගෙන ය.
(4) අලස ජීවිතය හේතුකොට ගෙන ය.

22. මහායානිකයන්ගේ භාෂා මාධ්‍ය වූයේ,
(1) ප්‍රාකෘත භාෂාව යි.
(2) සංස්කෘත භාෂාව යි.
(3) මාගධී භාෂාව යි.
(4) අර්ධ මාගධී භාෂාව යි.

23. මුගලන් මහ රහතන් වහන්සේ සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා සිදු කළ සේවා අතරට අයත් **නොවන්නේ,**
(1) නන්දෝපනන්ද නාගරාජයා දමනය කිරීම.
(2) මච්ඡරිය කෝසිය සිටු තුමා මසුරුකමින් මුදවාලීම.
(3) නොමගට ගිය දේවදත්ත පාක්ෂික භික්ෂූන් සුමගට ගැනීම.
(4) පළමු ධර්ම සංගායනාව පැවැත්වීමට ප්‍රධානත්වය ගැනීම.

24. ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිශික්ෂාවට බෙදා දැක්වීමේ දී සමාධි ශික්ෂාවට ඇතුළත් වන්නේ,
(1) සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා
(2) සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව
(3) සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි
(4) සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම

25. කායානුපස්සනාවට අදාළ කර්මස්ථාන ගණනින්,
(1) එකකි. (2) පහකි. (3) නවයකි. (4) දාහතරකි.

26. අභිධර්මයට අනුව සතර ආකාර වූ පරමාර්ථ අතරින් **සංඛත** වන්නේ,
(1) චෙතසික, රූප, නිබ්බාන
(2) චිත්ත, රූප, නිබ්බාන
(3) චිත්ත, චෙතසික, රූප
(4) චිත්ත, චෙතසික, නිබ්බාන

27. පොහොය ගෙයි දල්වන ලද පහන් දැල්ල ම නිමිති වශයෙන් ගෙන තේජෝ කසිණය අරමුණුකොට ධ්‍යාන උපදවා, එම ධ්‍යානය ම පාදකකොටගෙන රහත් ඵලයට පත් වූයේ,
(1) ඛේමා තෙරණිය යි.
(2) උත්පලවණ්ණා තෙරණිය යි.
(3) පටාචාරා තෙරණිය යි.
(4) සංඝමිත්තා තෙරණිය යි.

28. බුදුරජාණන් වහන්සේ ගඳකිළියේ වැඩ හිඳිමින් ම ආලෝකයක් පතුරුවා පටාචාරාවන්ට දේශනා කළ දහම් පදය ඇතුළත් වරණය තෝරන්න.
(1) යො වෙ වස්සසතං ජීවේ - අපස්සං උදයව්‍යයං
(2) යො වෙ වස්සසතං ජීවේ - කුසීතො හීන වීරියො
(3) යො වෙ වස්සසතං ජීවේ - අපස්සං අමතං පදං
(4) යො වෙ වස්සසතං ජීවේ - අපස්සං ධම්මමුත්තමං

29. චිංචා මානවිකාව විසින් බුදුරජාණන් වහන්සේ වෙත කරන ලද අපහාසයෙන් උන්වහන්සේ කම්පා නොවූහ. එයින් ප්‍රකට වන සුවිශේෂ ගුණය වන්නේ,
(1) මහා කරුණා ගුණය යි.
(2) නිහතමානී ගුණය යි.
(3) තාදී ගුණය යි.
(4) ලෝකවිදූ ගුණය යි.

30. පිලෝතික තෙරුන් කාම සංකල්ප මැඩලා විදසුන් වඩා රහත් ඵලයට පත් වූයේ,
(1) හිස් භාජනයක් අරමුණු කරගෙන ය.
(2) පහන් දැල්ල අරමුණු කරගෙන ය.
(3) පා දෝවනය කරන ලද පැන් අරමුණු කරගෙන ය.
(4) රෙදිකඩක් අරමුණු කරගෙන ය.

31. සූත්‍ර පිටකයෙහි සතර සතිපට්ඨානය දැක්වෙන සූත්‍ර අතරින් **" සතිපට්ඨාන"** සූත්‍රය ඇතුළත් වන නිකාය ග්‍රන්ථය වනුයේ,
    (1) දීඝ නිකාය යි.
    (2) මජ්ඣිම නිකාය යි.
    (3) සංයුක්ත නිකාය යි.
    (4) අංගුත්තර නිකාය යි.

32. රහතන් වහන්සේ බ්‍රහ්මලෝකවල ඉපදීමට හේතු වන සංයෝජන පහ ද මුළුමනින් ම සිඳ දමති. එම සංයෝජන පහ නිවැරදි ව ඇතුළත් වරණය තෝරන්න.
    (1) සක්කාය දිට්ඨි, විචිකිච්චා, සීලබ්බත පරාමාස, කාමරාග, පටිඝ
    (2) අවිජ්ජා, සීලබ්බත පරාමාස, කාමරාග, පටිඝ, විචිකිච්චා
    (3) රූප රාග, අරූප රාග, මාන, උද්ධච්ච, අවිජ්ජා
    (4) සක්කාය දිට්ඨි, කාමරාග, පටිඝ, රූපරාග, අරූපරාග

33. පටිච්ච සමුප්පාද සිද්ධාන්තයට අයත් **" සංඛාර"** යන්නෙන් අදහස් වන්නේ,
    (1) ශරීරය හා මනස යන අංග දෙකේ එකතුව
    (2) ඉන්ද්‍රිය හා අරමුණු හේතුකොටගෙන ඇතිවන සිත
    (3) චතුරාර්ය සත්‍යය පිළිබඳ නොදැනීම
    (4) තිදොරින් රැස්කරන කුසල් අකුසල්

34. අරමුණු සුභ වශයෙන් ගන්නා විට බලවත් අශාව ඇති වේ, ඒ අනුව මමය මාගේ යැයි දැඩි ලෙස අල්ලා ගැනීයම යන අදහස, සඳහන් වන්නේ,
    (1) විචිකිච්ඡාව ලෙසය.
    (2) කාමච්ඡන්දය ලෙස ය.
    (3) උද්දච්ඡකුක්කුච්ච් ලෙසය.
    (4) ථිනමිද්දය ලෙසය

35. අර්හත්වයට පත්වීම පිළිබඳව දැක්වෙන **සාවද්‍ය ප්‍රකාශය** වන්නේ,
    (1) සසර පුරුදු අනුව කෙනෙක් එකවර ම අර්හත්වයට පත්වෙති.
    (2) මුලින් ම සකදාගාමී හෝ අනාගාමී වී රහත්වන අය ද වෙති.
    (3) අන්‍යයන්ට දහම් දෙසා එය අවබෝධ කරවීමේ හැකියාව නැත.
    (4) තමාට තනිවම ධර්මය අවබෝධ කර ගැනීමට හැකියාවක් නොමැත.

36. බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ප්‍රකාශයෙහි දැක්වෙන පරිදි බුද්ධ දේශනාව හඳුන්වා ඇත්තේ,
    (1) සූත්‍ර, විනය වශයෙනි.
    (2) ධම්ම, විනය වශයෙනි.
    (3) ධම්ම, බ්‍රහ්මචරිය වශයෙනි.
    (4) නවංග සත්ථු සාසන වශයෙනි.

37. අසත්පුරුෂයන් ප්‍රිය කරයි. බුද්ධාදී සත්පුරුෂයන් ප්‍රිය නොකරයි. මෙම අර්ථය කියවෙන පරාභව සූත්‍රයෙහි ගාථා අර්ධය නිවැරදිව දක්වා ඇත්තේ,
    (1) නිද්දාසීලි සභාසීලි - අනුට්ඨාතා ච යෝ නරෝ:
    (2) අසන්තස්ස පියාහොන්ති - සන්තේ න කුරුතේ පියං
    (3) ධම්මකාමෝ භවං හෝති - ධම්මදෙස්සී පරාභවෝ
    (4) සුවිජානෝ භවං හෝති - සුවිජානෝ පරාභවෝ

38. මිහිඳු මහ රහතන් වහන්සේ තිස්ස රජුට තෙරුවන ම හඳුන්වා දෙමින් වදාළ පළමු සූත්‍ර දේශනාව වූයේ,
    (1) චුල්ලහත්ථිපදෝපම සූත්‍රය යි.
    (2) දේව දූත සූත්‍රය යි.
    (3) බාලපණ්ඩිත සූත්‍රය යි.
    (4) අග්ගික්ඛන්දෝපම සූත්‍රය යි.

39. ප්‍රාතිමෝක්ෂාගත පාචිත්තිය ශික්ෂාපද සංඛ්‍යාව වනුයේ
    (1) දහ තුනකි.
    (2) දාහතකි.
    (3) අනූවකි.
    (4) අනූ දෙකකි.

40. ධර්ම දේශකයාණන් වහන්සේ විසින් නොකළ යුතු කරුණක් වන්නේ,
    (1) අනුද්දයතං පටිච්ච
    (2) පරියාය දස්සාවි
    (3) ආනුපුබ්බී කථා
    (4) අත්තුක්කංසන

*     *     *

[ සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය/Ministry of Education - Division of Piriven Education/கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

| 03 | S | II |
|---|---|---|

**පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)**

**05 ශ්‍රේණිය**

**පැ තුනයි.**

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.**

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**(3) ත්‍රිපිටක ධර්මය - II පත්‍රය**

**I කොටසේ ප්‍රශ්නය ද, II සහ III කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ද, තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

## I - කොටස

**01. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

i. බුදුරජාණන් වහන්සේ අෂ්ටාංග සමුපේත බ්‍රහ්ම ස්වරයෙන් සමන්විත වේ. ඉන් **හතරක්** ලියන්න.

ii. ෂඩ් අසාධාරණ ඤාණ අතරින් **හතරක්** නම් කරන්න.

iii. බුද්ධඝෝෂ හිමියන් රචනා කළ අටුවා ග්‍රන්ථ **දෙකක්** නම් කොට, ඊට මූලාශ්‍රය වූ **පෙළ** සඳහන් කරන්න.

iv. මිත්‍ර ප්‍රතිරූපකයෝ **සිවුදෙන** නම් කරන්න.

v. නිෂ්පන්න රූප දහ අට අතරින් **භාව රූප දෙක** නම් කරන්න.

vi. සතර ආහාර නම් කරන්න.

vii. කායානුපස්සනාවට අයත් පබ්බ හයෙන් **හතරක්** නම් කරන්න.

viii. සම්මා සංකප්පයෙහි අංග අතරින් **දෙකක්** අර්ථය සමඟ ලියන්න.

ix. බුදුරජාණන් වහන්සේගේ දකුණු අකු ධාතුව තැන්පත්කොට ඉදිකරන ලද ලංකාවේ ප්‍රථම දාගැබ හා එය ඉදිකළ රජතුමා නම් කරන්න.

x. පරාභව සූත්‍රයේ ඇතුළත් පුද්ගලයෙකු පිරිහීමට හේතුවන කරුණු ගණන කීය ද?

**(ලකුණු 2×10 = 20)**

## II - කොටස

02. i. බුදුරජාණන් වහන්සේගේ **උත්තරීතර සමාජ දාර්ශනිකත්වය ප්‍රකට වන අවස්ථා දෙකක් ලියන්න.**

ii. ඉහත (i) හි ඔබ විසින් දක්වන එක් අවස්ථාවකට අදාළ සිදුවීමක් ලියන්න.

iii. බුදුරජාණන් වහන්සේගේ උත්තරීතර සමාජ දාර්ශනිකත්වය වත්මන් සමාජ ප්‍රගමනයට භාවිත කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.

**(ලකුණු 2 + 3 + 5 = 10)**

[ 2 වැනි පිටුව බලන්න]

03. i. දහ අටවන සියවසේ දී ශ්‍රී ලංකාවේ ශාසනික, ජාතික, සංස්කෘතික හා අධ්‍යාපනික පරිහානියට තුඩු දුන් හේතු දෙකක් ලියන්න.

ii. වැලිවිට සරණංකර සංඝරාජයන් වහන්සේ ලක්දිව උපසම්පදාව පිහිටුවීමට කටයුතු කළ ආකාරය කෙටියෙන් පහදන්න.

iii. වැලිවිට සංඝරාජ මාහිමියෝ මෙරට ධර්ම ශාස්ත්‍රීය හා සාහිත්‍ය කටයුතු නඟා සිටුවීමට ගත් ක්‍රියාමාර්ග විස්තර කරන්න.

**(ලකුණු 2 + 3 + 5 = 10)**

04 i. උපසම්පදා භික්ෂුව **මනුස්සවිග්ගහ පාරාජිකාවට** පත් වීමේ දී සම්පූර්ණ වන **අංග පහ** ලියන්න.

ii. **මනුස්සවිග්ගහ** පාරාජිකාපත්තියට අදාළ පාලි පාඨය ලියන්න.

iii. පාරාජිකාපත්තියට පත් වීම භික්ෂුත්වය අහෝසි වීමට හා සමාජ දෝෂ දර්ශනයට හේතු වේ, විස්තර කරන්න

**(ලකුණු 2+3+5=10)**

## III - කොටස

05. i. **"න අන්තලික්ඛෙ න සමුද්ද මජ්ඣෙ"** යන ගාථාව සම්පූර්ණ කරන්න.

ii. එම ගාථාවෙහි සරල අර්ථය ලියන්න.

iii. **"මරණයෙන් මිදී සැඟවෙනු හැකි කිසි තැනක් ලොව නැත"** ඉහත ගාථාවේ නිදාන කතාව ඇසුරෙන් විමසන්න.

**(ලකුණු 2+3+5 = 10)**

06. i. චතුරාර්ය සත්‍යය නම් කරන්න.

ii. මධ්‍යම ප්‍රතිපදාව යන්නෙහි අර්ථය පහදන්න.

iii. **"ත්‍රිවිධ ශික්ෂාව විමුක්ති මාර්ගයට අනුපූර්ව ශික්ෂාවකි"** විමසන්න.

**(ලකුණු 2 + 3 + 5 = 10)**

07. **i.** අභිධර්මයට අනුව නිර්වාණයෙහි **ආකාර** දෙක නම් කරන්න.

ii. පච්චේක බුද්ධත්වය පිළිබඳ පැහැදිලි කරන්න.

iii. අරහත් ඵලයට පත්වීමේ අනුපිළිවෙළ හා ඒ ඒ අවස්ථාවේ දී දුරුවන සංයෝජන වෙන වෙන ම විස්තර කරන්න.

**(ලකුණු 2+ 3+5 = 10)**

* * *